ප්‍රතිභා

ප්‍රතිභා
ப்ரதிபா
Prathibha

E-MAGAZINE - 2022

LIBRARY

National Audit Office

ප්‍රතිභා
ப்ரதிபா
Prathibha



Prathibha
Volume 1
2022
January

Hon. Chief Patron
Mr. W. P. C. Wickramaratne
Auditor General

Advisor
Mr. S. M. D. S. Sudeesh Rohitha
Deputy Auditor General

Editor
Mrs. M. K. G. Yanika Nandasena

ජාතික විගණන කාර්යාල පුස්තකාල කමිටුව - 2022

1.	එස්. එම්. ඩී. එස්. සුදීෂ් රෝහිත මයා නියෝජ්‍ය විගණකාධිපති	-	සභාපති
2.	එල්. සමුදිකා ජයරත්න මිය නියෝජ්‍ය විගණකාධිපති	-	සාමාජික
3.	එච්. එම්. යූ. එස්. ඒ. විජේකෝන් මයා සහකාර විගණකාධිපති	-	සාමාජික
4.	ඊ. ඩී. ආශා එල්. එදිරිසිංහ මිය ගණකාධිකාරී	-	සාමාජික
5.	එස්. සංගීති කොඩිප්පිලි මිය විගණන අධිකාරී	-	සාමාජික
6.	ආර්. පී. එස්. රාජපක්ෂ මයා පරිපාලන නිලධාරී	-	සාමාජික
7.	බී. අයි. නදීපිකා පෙරේරා මිය විගණන පරීක්ෂක	-	සාමාජික
8.	ඩබ්. කේ. ඩී. නිරෝෂනී ජයසුන්දර මිය විගණන පරීක්ෂක	-	සාමාජික
9.	එම්. කේ. ජී. යානිකා නන්දසේන මිය පුස්තකාලයාධිපතිනී	-	ලේකම්

Message from Auditor General

It gives me immense pleasure to know that the Library Committee of the National Audit Office (NAO) is bringing out its first ‘E-Magazine’ for the year 2021.

Tacit Knowledge included in the magazine aims the holistic development of the officers of the NAO. Creative writing is an integral part of learning. The Library magazine plays a vital role in providing an opportunity of expression to the creative minds and presents aspirations of the officers. It goes a long way in unfolding and nurturing the innovative thinking of the officers.

I am extremely proud to express that the Library committee has been exemplary in providing quality magazine to the interested readers by creating the good ideas through articles to have a spirit of learning to give outstanding results. Now, the platform provided by this E-magazine will definitely become a stepping stone in developing their personalities and realizing their job requirements even in this Covid-19 pandemic situation. .

I take this opportunity to appreciate those who have immensely contributed to this E-magazine and wish them the very best for all their future endeavors.

W. P. C.Wickramaratne
Auditor General

අතිරේක විගණකාධිපතිතුමන්ගේ පණිවිඩය

ලිවීම මානව වර්ගයාගේ වැදගත්ම සංස්කෘතික ජයග්‍රහණයන්ගෙන් එකකි. ශිෂ්ටාචාරය පැන නගින්නේ ලිවීමේ පැමිණීමත් සමඟ ය. ලිවීමකින් තොරව නූතන ලෝකය ප්‍රාථමිකයෙන් වෙන්කර හඳුනා ගන්නා විද්‍යාව, තාක්ෂණය සහ සංස්කෘතිය ජයග්‍රහණය කළ නොහැකි වනු ඇත. ලිවීමට පෙර මානව දැනුම පරම්පරාවෙන් පරම්පරාවට වාචිකව ලබා දෙන ලදී. එබැවින් මෙම දැනුම සමුච්චය කිරීම අතිශයින් මන්දගාමී විය. වාචික කථාව කාලය හා අවකාශය තුළ සීමිතය. කථා කරන දේ ඇසෙන්නේ කථන අවස්ථාවේදී පමණි. අපට කතා කළ හැක්කේ කෙටි දුරකින් පමණි. ලිවීම මෙම සීමාවන් ඉක්මවා යයි. ඊයේ හෝ අවුරුදු දහසකට පෙර ලියා ඇති දේ අපට කියවිය හැකිය.

මිනිසුන්ගේ ජීවිතයේ ලිවීමේ වැදගත්කම කෙතෙක් වීද යත් පුරාණ ජනයා ඊට දිව්‍යමය සම්භවයක් ආරෝපණය කර ඇත. භාෂාව මෙන්ම ලිවීම ජාතියක බාහිර සංකේත වේ. ලිවීම මානව වර්ගයාගේ ශ්‍රේෂ්ඨතම නව නිපැයුමකි. ශබ්ද භාෂාවෙන් සන්නිවේදනය කළ නොහැකි හෝ දුෂ්කර අවස්ථාවන්හිදී සන්නිවේදනය කිරීමට මිනිසුන්ට ලිවීම උපකාරී වේ. ලිවීමට සංවර්ධනයේ දීර්ඝ ඉතිහාසයක් ඇත. එය ප්‍රාථමික භාවිතයේ සිට වඩාත් පරිපූර්ණ ග්‍රැෆික් සන්නිවේදන ආකාර භාවිතා කිරීම දක්වා දුෂ්කර මාවතකට ගොස් තිබේ. එබැවින් ලිවීම සන්නිවේදනයේ වැදගත්ම මාධ්‍යයක් බවට පත්ව ඇත..

එවන් පසුබිමක නිර්මාණශීලී ලිවීමේ හැකියාවට අගයක් දෙමින් ආයතනයේ නිලධාරීන්ගේ ලිවීමේ කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික විගණන කාර්යාල පුස්තකාලය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රතිභා විද්‍යුත් සඟරාවේ පලමු කලාපය වෙනුවෙන් මාගේ හෘදයංගම සුභාශිංෂණ එක් කරමි.

ආර්. එම්. ජේ. රත්නායක
අතිරේක විගණකාධිපති

පුස්තකාල කමිටුවේ සභාපතිතුමන්ගේ පණිවිඩය

ජාතික විගණන කාර්යාල පුස්තකාලය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රතිභා විද්‍යුත් සඟරාවේ මංගල කලාපය සඳහා මා සුබ පැතුම් එක් කරන්නේ හද පිරි සතුටිනි. මෙවැනි සාහිත්‍ය කටයුතු ආයතනයේ කාර්ය මණ්ඩලය සතු නිර්මානශීලී ලිවීමේ හැකියාව ඔප් නැංවීමට දායක වන අතර ම පුස්තකාලය හා පාඨකයා අතර අවියෝජනීය බැඳීම ඉහළ නැංවීමට ද හේතු වේ.

තොරතුරු සම්පත් මධ්‍යස්ථානයක් ලෙස පුස්තකාලයේ වැදගත්කම අවධාරණය කිරීමට මෙන් ම එය නව දිශානතියකට හැරවීමටද මෙවැනි නිර්මාණ උපකාරී වේ. එසේම සංකීර්ණ කාර්ය බහුල කාර්යාලීය දිවි පෙවෙතක පවතින විඩාව සමනය කර ගැනීමටද මෙවැනි කෘති පරිශීලනය කිරීම හා ඒ සඳහා සක්‍රියව දායක වීම මනා පිටුවහලක් වනු ඇත.

සාම්ප්‍රදායික පුස්තකාල ව්‍යුහයෙන් ඔබ්බට ගොස් සාහිත්‍යමය රසවින්දනයට, ගවේෂණයට මෙන්ම වෘත්තීය දැනුමෙන් පෝෂණය විය හැකි තෝතැන්නක් ලෙස ජාතික විගණන කාර්යාල පුස්තකාලය විද්‍යුත් පුස්තකාලයක් ලෙස සංවර්ධනය කිරීම හා පාඨක සේවා පුළුල් කිරීමේ අරමුණු පෙරදැරි කරගනිමින් ගරු විගණකාධිපතිතුමන් විසින් පුස්තකාල කමිටුවක් පත්කරනු ලැබීය.

විගණකාධිපතිතුමන්ගේ මග පෙන්වීම යටතේ පුස්තකාල කමිටුවේ පලමු කාර්ය වශයෙන් ප්‍රතිභා විද්‍යුත් සඟරාවේ මංගල කලාපය මෙසේ ඔබ වෙත ගෙන ඒමට ලැබීම ඉමහත් සතුටට කරුණකි. මෙම විද්‍යුත් සඟරාව ඉදිරි වර්ෂවලදීද අඛණ්ඩව ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂිත හෙයින් ඒ සඳහා ඔබ සැමගේ සහයෝගය සහ නිර්මාණශීලී දායකත්වය ලැබෙනු ඇතැයි අපි උදක් ම විශ්වාසය පළ කරමු.

ප්‍රතිභා විද්‍යුත් සඟරාව සාර්ථක කර ගැනීමට අනුශාසක දායකත්වය දැක්වූ ගරු විගණකාධිපතිතුමාටද සිය වෘත්තීමය ප්‍රවීණත්වය හා කැපවීම තුළින් මෙම කාර්ය සාක්ෂාත් කර ගැනීමට මහඟු මෙහෙවරක් කළ පුස්තකාලයාධිපතිනියටද මෙම සඟරාව සඳහා නන් අයුරින් දායකත්වය සැපයූ සියලු පාර්ශවයන්ටද අප ප්‍රසාදය පල කරන අතර ජාතික විගණන කාර්යාල පුස්තකාලය විද්‍යුත් පුස්තකාලයක් ලෙස බලගැන්වීම සඳහා ඔබ සැමගේ අදහස් හා යෝජනා ලබා දෙන ලෙස ඉල්ලීමට ද මෙය අවස්ථාවක් කර ගනිමු.

ස්තුතියි!

එස්. එම්. ඩී. එස්. සුදීෂ් රෝහිත
නියෝජ්‍ය විගණකාධිපති
(සභාපති - පුස්තකාල කමිටුව)

සංස්කාරකගේ සටහන

මානව සමාජයේ වර්තමාන දියුණු තත්ත්වයට හේතු වී ඇත්තේ මිනිසාගේ බුද්ධිමය ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවන තොරතුරු එසේ නැතහොත් දැනුම පසු කාලීන පරපුරට භාවිතා කල හැකි අයුරින් වාර්තා ගත කිරීමට ඇති හැකියාවයි. මෙසේ වාර්තා ගතවන තොරතුරු සෙසු අයගේ දැනුම වැඩිකිරීමට ප්‍රයෝජනයට ගත හැකි පරිදි ලබා ගැනීම , සැකසුම, ගබඩා කිරීම, සමුද්ධරණය හා සන්නිවේදනය පිණිස ඇති ප්‍රධාන විඥාපන ඒකකයක් වනුයේ පුස්තකාලයයි. අධ්‍යාපනය, පර්යේෂණය, ආර්ථික කටයුතු, දේශපාලන කටයුතු, සංස්කෘතික කටයුතු ආදී විවධ කාර්යයන් නිසා මානව දැනුමට එකතුවන තොරතුරු මහා ප්‍රවාහයක් බවට පත්ව තිබේ. භූගෝලීය, දේශපාලනික, සමාජීය හා සංස්කෘතිකමය කඩඉම් හරහා ගලන තොරතුරු ප්‍රවාහය මෙහෙවීම හා ප්‍රයෝජනයට ගැනීමට සැලැස්වීම සඳහා ඇති විඥාපන ආයතන අතර පුස්තකාලයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි.

දැනුම කේන්ද්‍රගත සමාජයක මානව සංහතියේ අභිවර්ධනයට අතිශයින්ම ඉවහල් වූ තාක්ෂණයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කැපී පෙනේ. එබැවින් නූතනයේ පුස්තකාලය හා තොරතුරු සේවා මධ්‍යස්ථානද මේ හා අත්වැල් බැඳගෙන ඇති අතර වර්තමාන පුස්තකාල හා තොරතුරු සේවා මධ්‍යස්ථාන සම්ප්‍රදායික සේවාවන්ගෙන් ඔබ්බට ගොස් පාඨකයින්ගේ දැනුම හා කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගනී. එවන් පසුබිමක ජාතික විගණන කාර්යාල පුස්තකාලය පුස්තකාල හා තොරතුරු සේවා මධ්‍යස්ථානයක් ලෙස වැඩි දියුණු කිරීමේ යෝජනාවලිය යටතේ "ප්‍රතිභා" විද්‍යුත් සඟරාව ඔබ වෙත ගෙන එන්නේ ජාතික විගණන කාර්යාල කාර්ය මණ්ඩලයේ නිර්මාණාත්මක ලිවීමේ කුසලතා ප්‍රවර්ධනය කිරීමේ මූලික පරමාර්ථයෙනි.

මෙම කර්තව්‍ය සාර්ථකව නිම කිරීමට මග පෙන්වූ ගරු විගණකාධිපතිතුමන්ටත්, උපදේශකත්වය ලබා දුන් පුස්තකාල කමිටුවේ සභාපතිතුමන්ටත් මාගේ හද පිරි ප්‍රණාමය පුදකර සිටිමි. එසේම "ප්‍රතිභා" විද්‍යුත් සඟරාව සඳහා නිර්මාණ දායකත්වය සැපයූ ජාතික විගණන කාර්යාල කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ටත් පුස්තකාල කමිටුවේ ගෞරවනීය සාමාජිකයින්ටත් බෙහෙවින් කෘතඥ වෙමි. අවසාන වශයෙන් පූර්වයේ පුස්තකාලය භාරව සිටි විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපතිතුමන්ටත්, අතිරේක විගණකාධිපතිතුමන්ටත්, වර්තමානයේ පුස්තකාලය භාර පාලන අංශයේ අධ්‍යක්ෂතුමන්ටත් බෙහෙවින් ස්තූතිවන්ත වෙමි .

එම්. කේ. ගිවෝන් යානිකා නන්දසේන

වරලත් පුස්කාලයාධිපතිනී

(ලේකම් - පුස්තකාල කමිටුව)

පිටු පෙළ ගැස්ම

පිටු අංක

විශේෂාංග ලිපිය

ශ්‍රීමත් ජෝන් ඩොයිලි 9-15

විෂයානුබද්ධ ලිපි

දූෂණයට එරෙහිව උත්තරීතර විගණන ආයතනවල කාර්ය භාරය - නව ප්‍රවණතා - ජී. ඒ. එම්. අයි. ගුණරත්න 16-18

ව්‍යාජ ණයහිමි වංචාව : සිදු විය හැකි ආකාරය සහ අනාවරණය කර ගැනීම. - එන්. එච්. ඒ. ආර්. කේ. ගුණරත්න 19-28

E-Government Procurement – Indika Samantha 31-34

කාර්යසාධන හා පරිසර විගණනය - ආර්. සී. තෙන්නකෝන් 35

Sammary of tax proposal of budget 2022 - M. D. I. J. Silva 38-41

ශාස්ත්‍රීය ලිපි

ව්‍යාපෘති කළමනාකරණයේදී ක්‍රමෝපායන් භාවිත කිරීම - එම්. කේ. ජී. යානිකා නන්දසේන 42-51

සීගිරි ගීත සහ පුරාණ සිංහලයාගේ රසවින්දනය - එස්. ජී. තුෂාරි ඉන්දිකා 52-58

දැනුමට ලිපි

What is the only fruit which has seeds outside? 59
- D. M. J. P. Kumari

தாய் மொழி அல்லாத இன்னொரு மொழியைக் கற்பதிலுள்ள நன்மைகள் - எம். அய். எப். டிராயா 60

ජන සාහිත්‍යයෙන් 61-66

පොත පත වගතුග 67-79

කවි සිතුවිලි 80-95

Annexes 96-98

ශ්‍රීමත් ජෝන් ඩොයිලි 1 වන බැරොනෙට් (1774 ජූනි 6 - 1824 මැයි 25)

ශ්‍රීමත් ජෝන් ඩොයිලි, බ්‍රිතාන්‍ය යටත් විජිත පරිපාලකයෙකි. 1801 දී ලංකාවට පැමිණි ජෝන් ඩොයිලි මුලින් සිවිල් සේවයේ ලේඛකයෙකු ලෙසත් පසුව විවිධ පළාත් අධිකරණවල සභාපති ලෙසත් කටයුතු කළේය. විශාරද බෞද්ධ භික්ෂුවක් වන කරතොට ධම්මාරාම නායක හාමුදුරුන්ගේ අනුග්‍රහය යටතේ මාතර දී තම ධුර කාලය තුළ ඔහු සිංහල භාෂාව ප්‍රගුණ කළේය. සිංහල භාෂාවෙහි මෙම ප්‍රවීණතාවය නිසා ඔහු 1805 දී රජයේ ප්‍රධාන පරිවර්තකයා ලෙස පත් කරන ලදී. ඊළඟ වසරේදී ඔහු කොළඹ දිස්ත්‍රික්කයේ ආදායම් නියෝජිතයෙකු බවට පත්විය. තව දුරටත් උසස්වීම් ලැබීමෙන් ඔහු සිවිල් හා මිලිටරි යන අංශවලින් උසස් වූ අතර අවසානයේ ඔහු සිවිල් විගණකාධිපති තනතුරට පත් කරන ලදී. (1814 සැප්තැම්බර් 1 සිට 1816)

1815 දී උඩරට රාජධානිය බ්‍රිතාන්‍යය අත්පත් කර ගැනීම සඳහා කටයුතු කිරීමේදී ජෝන් ඩොයිලිට ප්‍රධාන කාර්යභාරයක් පැවරී තිබුණි. සිංහල භාෂාව චතුර ලෙස දැන සිටි ඔහු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා, ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සහ කුතුහලයෙන් සිටි අසතුටට පත් උඩරට ප්‍රධානීන් අතර අතරමැදියා විය. 1815 මාර්තු මස 02 වැනි දින මහනුවර ඓතිහාසික දළදා මාළිගාවේ රජ වාසලේ මඟුල් මඩුවේදී “උඩරට ගිවිසුම” මගින් ලංකාව බ්‍රිතාන්‍යයේ කිරීටය යටතට පවරා දෙන ලදී. සටනකින් තොරවම බ්‍රිතාන්‍යයන්ට උඩරට අල්ලා ගැනීමට හැකිවූයෙන් ප්‍රථම වරට මුළු ශ්‍රී ලංකාවේම පාලනය විදේශිකයන් අතට පත්විය. මෙසේ ඉංග්‍රීසීන් විසින් උඩරට අල්ලා ගැනීමේදී උඩරට රදලයන්ගේ ක්‍රියා කලාපය, ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කෲර ක්‍රියා කලාපය, ආදී හේතු ඒ සඳහා හේතු වශයෙන් බොහෝ දෙනෙකු විසින් දැක්වුවද, මීට පෙර කිසිවෙකුට උඩරට අල්ලා ගැනීමට නොහැකි වූයේ මන්දැයි විමසීමේදී 1815 දී උඩරට අල්ලා ගැනීමේදී ඊට විශේෂ වූ හේතූන් තිබූ බව සනාථ වේ. එනම් ඉතා සූක්ෂම බුද්ධියකින් හෙබි ඉංග්‍රීසි ජාතික නිලධාරියෙකු වූ ජෝන් ඩොයිලිගේ ක්‍රියාකලාපය, උඩරට යටත් කර ගැනීමට ඔහු විසින් කරන ලද සැලසුම්, හෙළිකර ගැනීමට හැකි වීම නිසාය.

ලංකාව බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක්ව තිබූ කාලයේ මෙරට සිටි එකම සිංහල උගත් සිවිල් සේවකයා වූයේ ඩොයිලිය. එංගලන්තයේ සසෙක්ස් ප්‍රාන්තයේදී හේස්ටිංස්හි අගරදගුරු මතියස් ඩි ඔයිලි සහ ඔහුගේ බිරිඳ මේරිගේ දෙවන පුත්‍රයා ලෙස 1774 ජුනි 11 වැනි දින ජෝන් ඩොයිලි උපත ලැබීය. ළමා කල වෙස්ට්මිනිස්ටර් විදුහලේ ඉගෙනුම ලැබූ ඩොයිලි පසුව කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ බැනට් විද්‍යාලයට බැඳුණ අතර 1796 වර්ෂයේදී තම ශාස්ත්‍රවේදී උපාධිය සම්පූර්ණ කර ගැනීමට සමත් විය. ඉන් පස් වසරක ඇවෑමෙන් එනම් ක්‍රි.ව. 1801 දී තරුණ ඩොයිලි සිය ජීවිතයේ නව පරිච්ඡේදයකට මුල පුරමින් ලංකාවේ සිවිල් සේවයට ඇතුළත් වීමට මෙහි පැමිණියේය. මෙරටදී ඔහුට පළමුවෙන්ම සේවය කිරීමට සිදුවූයේ කොළඹ ප්‍රාදේශීය අධිකරණයේ සාමාජිකයෙකු වශයෙනි. පසුව 1803 දී මාතර උසාවියේ ප්‍රධානියා ලෙස පත්කර යැවූ ඔහු 1804 දී මාතර වෙළෙඳ කටයුතු හා ආදායම් පිළිබඳ ඒජන්තවරයා ලෙසද පත්කරන ලදී. සිය අධිරාජ්‍යයට සේවය කිරීමේදී වඩාත් කැපවී කටයුතු කිරීම සඳහා අත්‍යවශ්‍ය කාර්යයක් වශයෙන් ඔහුට දේශීයයන්ගේ භාෂාව දැන ගැනීමට අවශ්‍ය විය.

ඩොයිලි සිංහලයන් අතර තවත් සිංහලයෙක් යැයි සිතෙන තරමටම සිංහල ඌරුවටම හැඩ ගැසී සිටියේය. ඔහුගේ ඇවතුම් පැවතුම් එවැනි ස්වරූපයක් ගැනීමට එකල මහත් ප්‍රසිද්ධියකට පත්ව සිටි මාතර වෙහෙරගම්පිට විහාරයේ වැඩහුන් කරතොට ධර්මාරාම නාහිමියන්ගෙන් ලද ආභාසය මහෝපකාරී විය. සිංහල භාෂාව පිළිබඳ පුළුල් හා ගැඹුරු දැනුමකින් මෙම සුදු ජාතිකයා සන්නද්ධ කිරීමට ධර්මාරාම නාහිමියන්ට හැකි විය. සිංහල භාෂාව පිළිබඳ ඩොයිලි සතුව තිබූ එකී දැනුම නිසා 1805 දී එවකට ආණ්ඩුකාර තෝමස් මෙට්ලන්ඩ් විසින් ඉංග්‍රීසි රජයේ ප්‍රධාන භාෂා පරිවර්තක ධුරයට පත්කරන ලදී.

ක්‍රි.ව. 1812 මාර්තු 11 වැනි දින මෙරට නව ආණ්ඩුකාරවරයා ලෙස වැඩ භාරගත් "රොබට් බ්‍රවුන්රිග්" එංගලන්ත ආණ්ඩුවේ අපේක්ෂා ඉටුකරනු පිණිස එංගලන්ත ආණ්ඩුව වෙනුවෙන් පෙනී සිටි අතර එම අරමුණු සාක්ෂාත් කිරීමේ කූට මෙහෙයුම රහසිගතව ඩොයිලිගේ මොළය තුළ සැලසුම් විය. මේ වනවිට අත්දැකීම් වලින් පරිපූර්ණ බ්‍රවුන්රිග් අවුරුදු 56 ක් ඉක්මවූ පුද්ගලයකු වුවත් 38 හැවිරිදි ඩොයිලි බ්‍රවුන්රිග්ට වඩා තීක්ෂණ, කූට උපායශීලී සැලසුම් සහගත ග්‍රහණයෙන් වඩා ඉදිරියෙන් සිටියේය. කිසිම සංග්‍රාමික ක්‍රියාවලියකට නොයා ලංකාව එක්සත් කර එංගලන්ත ආණ්ඩුවේ යටත් විජිතයක් බවට පත්කර ගැනීමේ කූට අභිප්‍රාය ඔවුන් ඉදිරියේ එංගලන්ත ආණ්ඩුව විසින් දන්වා තිබූ අතර එයට සියුම් කරුණු ඔස්සේ කටයුතු කරන්නටත් තම හාම් පුතාවූ එංගලන්තයට අභිමානයෙන් නැගී සිටින්නටත්, ඩොයිලි කටයුතු කළේ සිංහල රාජ්‍යයේ රුදලයනට නොදැනෙන ආකාරයෙනි. එසේම ඩොයිලි මනා විචක්ෂණ උපායශීලී හැකියාවෙන් යුත් රාජ්‍ය තාන්ත්‍රිකයෙකි. ඔහුගේ එම කපටි ඔළුව නොතිබෙන්නට උඩරට රාජධානිය එතරම් ඉක්මනින් කිසි දිනෙක අල්ලා ගන්නට නොහැකි වන්නට ඉඩ තිබුණි. රාජසිංහ රජුගේ ඉතා කෲර පාලනය නරකින් නරකට ගොස් තිබුණු ඒ සමයේ රජුට එරෙහිව රහසිගතව ක්‍රියාකළ නිලමේ වරුන් හා සාකච්ඡා කරන්නට ඩොයිලි සමත් විය.

ඩොයිලි උඩරට අල්ලා ගන්නට අවශ්‍ය පිඹුරුපත් සැකසුවේ බොහෝ කලක සිටය. ඉතාම පහත් පෙළේ චරපුරුෂ ක්‍රියා පිළිබඳව ඔහු මැනවින් හදාරා තිබුණි. ඒ බවට ඔහු විසින් සටහන් තබන ලද "දිනපොත" සාක්ෂි දරයි. එම දිනපොත බ්‍රිතාන්‍ය සිවිල් සේවකයෙකුව සිටි එච්. ඩබ්. කොඩ්රින්ටන් විසින් මහනුවර කච්චේරියේ තිබී සොයාගෙන 1917 දී මුද්‍රණයකොට ඇත. 1815 ට පෙර සිටම ඩොයිලි උඩරට රදලයින් හා සමීප සබඳතා ගොඩනගාගෙන තිබුණි. ඉන් බොහෝමයක් අතිශයින්ම රහස් සබඳතා විය. 1815 මාර්තු 02 වැනිදා ඓතිහාසික උඩරට ගිවිසුම සකස් කිරීමටත්, ඊට පහසුවෙන්ම රදලයින්ගේ අත්සන් ලබා ගැනීමටත්, ඔවුන්'තර තිබූ එකී සමීප සබඳතාව මහත්සේ උපකාරී විය. මෙසේ සකස් කළ උඩරට ගිවිසුමට ඉංග්‍රීසි ආණ්ඩුව වෙනුවෙන් රොබට් බ්‍රවුන්රිග් අත්සන් තැබූ අතර උඩරට පාර්ශ්වය වෙනුවෙන්, ඇහැලේපොල, මොල්ලිගොඩ මහ අදිකාරම්, සත් කෝරලේ දිසාව, පිළිමතලව්වේ දෙවැනි අදිකාරම, සබරගමුවේ දිසාව, පිළිමතලව්වේ සතර කෝරලේ දිසාව, මොනරවිල ඌවේ දිසාව, මොල්ලිගොඩ තුන් කෝරලේ දිසාව, දූල්ලැවේ වලපනේ දිසාව, මිල්ලව වෙල්ලස්සේ හා බින්තැන්නේ දිසාව, ගලගම තමන්කඩුවේ දිසාව, ගලගොඩ නුවර කලාවියේ දිසාව යන රදල ප්‍රධානියෝ අත්සන් තැබූහ. ගිවිසුමේ අත්සන් සහතික කිරීමට ජෝන් ඩොයිලි සහ ජේම්ස් සදර්ලන්ඩ් ක්‍රියා කළහ.



1810—1815 තෙක් කන්ද උඩ රට පලාත්වල බ්‍රිතාන්‍ය රජයේ
පළමුවන කොමසාරිස්, පෝවාසික ප්‍රමුඛ බලධර, ඒජන්ත පසුව
සර් ජෝන් ඩොයිලි බාරට්
නම වූ

ඩොයිලි ගේ දින පොත

1917 දී ලංකා සිවිල් සේවාවේ සිටි,
සී. ඒ. ඔක්ෂන්, ඇම්. ආර්. ඒ. ඇස්., ඇස්. ආර්. ඇන්. ඇස්.
උපාධිධර
එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන් මහතා
රාජකීය ආසියාතික ලංකා සමිතියේ විශේෂ ප්‍රකාශනයක් ලෙස
පළ කළ, 25 වන වෙළුමේ 69 වන අංකය ඇසුරෙන්.

1815 මාර්තු 19 වැනිදා මහනුවර මඟුල් මඩුවේදී ජෝන් ඩොයිලි, ඇහැලේපොල මහ නිලමේ, කපුවත්ත දෙවැනි අධිකාරම සහ මොල්ලිගොඩ මහ නිලමේ අතර පැවැති සාකච්ඡාව. සිටගෙන සිටින්නේ ලියනරාල වන අතර, මෙය පැරණි සිතුවමකි.

1815 මාර්තු 2 වන දින උඩරට සම්මුතිය කෙටුම්පත් කිරීමේ ගෞරවය ඩොයිලිට හිමිවිය.



උඩරට ගිවිසුමේ පිටපතෙහි කොටසක්.

ගිවිසුම අත්සන් කළ රදල ප්‍රධානීන් 11 දෙනාගේ අත්සන්.

දීර්ඝ කාලයක සිට කරගෙන පැමිණි උපායශීලී වැයම ඵල දරමින් බ්‍රිතාන්‍යයෝ උඩරට ජයග්‍රහණය කළහ. ඒ හේතුවෙන් ජයග්‍රහණයේ උපායශීලී පුද්ගලයා වූ ජෝන් ඩොයිලිට ලැබුණු ප්‍රධාන ත්‍යාගය වූයේ සිංහලේ පළාත් පිළිබඳ බ්‍රිතාන්‍ය රජයේ බලයලත් නියෝජිත තැන වශයෙන් පත්වීමයි. මෙම තනතුර බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වන ලද්දේ "රෙසිඩන්ට්" යන නාමයෙනි. මේ පිළිබඳ ලිපිය බ්‍රවුන්රිග් විසින් නිල වශයෙන්ම ඩොයිලිට මාර්තු 2 වැනි දින දීම ලබාදී ඇත. අදාළ පත්වීම් ලිපියට ප්‍රතිචාර දක්වා ඩොයිලි 1815 මාර්තු 06 දින බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයාට ස්තූති කරමින් ලිපියක් යවන ලද බව සඳහන්ය. 1818 උඩරට මහ කැරැල්ල සමයේ ඩොයිලි සැබෑ අවංක පක්ෂපාතී සේවයක් බ්‍රිතාන්‍ය රජය වෙනුවෙන් ඉටු කළේය. එයට කෘතගුණ සැලකීමක් වශයෙන් 1821 වර්ෂයේදී බ්‍රිතාන්‍ය මහ රජතුමා විසින් ඩොයිලි "බැරන්වරයකු" ලෙස පත්කර නයිට් නාමයක්ද ප්‍රදානය කරන ලදී. ඩොයිලි, ශ්‍රීමත් ජෝන් ඩොයිලි නමින් ප්‍රකට වූයේ ඉන් අනතුරුවය.

බැරනට්වරුන්ට බ්‍රිතාන්‍ය රජු පිරිනමන පදක්කම

ඩොයිලි අනිත් බොහෝ යුරෝපීයයන් මෙන් දේශීය සංස්කෘතිය ම්ලේච්ඡ එකක් ලෙස බැහැර නොකොට එය අවබෝධ කිරීමට උත්සාහ කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු සිංහල භාෂාවත්, සිංහලයනුත් හොඳින් තේරුම් ගත්තේය. සිංහල උගතුන්, කවීන් ආශ්‍රය කළේය. කොරතොට ධම්මාරාම, මොරතොට ධම්මක්ඛන්ධ යන යතිවරයන් සමඟ ශාස්ත්‍රීය කරුණු ගැන සාකච්ඡා කිරීමට පමණක් නොව ගජමන් නෝනා සමඟ තරගයට කවි ලිවීමටද ඔහු සමත් වී යැයි ජනප්‍රවාදයේ එයි. රුහුණේ කිවිඳිය වූ ගජමන් නෝනා තම පියාගේ මරණයෙන් පසු ආර්ථික පරිහානියට පත්ව සිටි කාලයේ මාතර දිසාපති හා අධිකරණ භාර නිලධාරියා ලෙස කටයුතු කළේ ජෝන් ඩොයිලි විසිනි. ඔහු ඇගේ කවි ඉතා ප්‍රිය කළ පුද්ගලයන්ගෙන් කෙනෙක් විය.

තමන් මුහුණ පා ඇති අසීරු තත්ත්වය කවියෙන් පැහැදිලි කළ ගජමන් නෝනා, තමන්ට පිහිටක් වන ලෙස ඩොයිලිගෙන් මෙසේ ඉල්ලා සිටියාය.

Government Agent D'Oyly meets Gajaman Nona.

"සඳ මෙන කවා දැඩි කල ළම පැටවුන්ට
අද දින පමණ නැත බත උන් රැක ගන්ට
සොඳ ගුණ ජොන් ඩොයිලි මෙදිසා මැතිඳුන්ට
වැඳගෙන දුක කියමි පිහිටක් ලැබ ගන්ට"

ඒ අනුව ඇගේ කවිත්වයට ගරු කිරීමක් ලෙස ඩොයිලි අම්බලන්තොටින් ඇයට ගම්වරයක් ලබා දුන් අතර එම ගම්මානය "නෝනාගම" ලෙස අදටත් ප්‍රසිද්ධය.

බුලත් සැපීමට පවා පුරුදු වූ ඔහු සිංහලයන්ගේ විශ්වාසය දිනා ගත්තේය. මේ පෞද්ගලික දැන හැඳුනුම්කම් හා විශ්වාසය එංගලන්ත රජුට සේවය කිරීම සඳහා ඔහු යෙදවීය. කාර්යක්ෂම වරපුරුෂ සේවයක් සංවිධානය කළ ඔහුට උඩරට සමහර රදලයන්ගේ මාන්නක්කාරකම ප්‍රයෝජනවත් විය. මුදලට සමහරුන් දැක්වූ කෑදරකමද උපකාරී විය. පිළිමතලව්වේ, පුස්වැල්ලේ, ඇළපාත, එක්නැලිගොඩ, ලෙව්කේ, ඇහැළේපොළ, මීගස්තැන්නේ ආදී උඩරට රදලයන් හැම දෙනා සමඟ ඔහු හොඳහිත වැඩිදියුණු කර ගත්තේය. ඒ සම්බන්ධකම් හැම එකක්ම උඩරට රජුට විරුද්ධව කුමන්ත්‍රණ වශයෙන් හැඳින්විය නොහැකි වුවත් මේ කුලුපගකම් නිසා උඩරට අභ්‍යන්තර දේශපාලනය පිළිබඳ ඉතා හොඳ අවබෝධයක් ලබා ගත් ඔහු එය භාවිත කළේ ඒ රාජ්‍යය බිඳලීම සඳහායි.

තම ජාතියේ අවශ්‍යතාව ඉටු කරමින් රාජකාරිය කළ ඔහු මෙරට වැසියාටද ඇලුම් කළේය. මෙරට පැමිණීමෙන් පසු කිසි දිනෙක රටින් පිට නොවූ ඔහු තම නිවසේ ආහාර ගන්නා විට කවුරුන් හෝ කැඳවා ඔහු හා එකතුව ආහාර ගැනීමට හුරුව සිටියේය. උඩරට රජු හා ඉංග්‍රීසීන් අතරද, උඩරට රදලවරු හා ඉංග්‍රීසීන් අතර ද ඔහු ක්‍රියා කළේ පාලමක් පරිද්දෙනි. සිංහල ජනයාගේ පිරිහීමට මුල් වූ විවිධාකාර හේතු ගැන සලකා ඉන් උඩරට ජනයා මුදවා ගැනීමට බොහෝවිට ඔහු ක්‍රියා කළේය. අධිරාජ්‍යවාදීන් සමඟම ලංකාවට ආ සුරාව, සූදුව උඩරට සාමාන්‍ය ගැමි දිවි පෙවෙත තුළ අවුල් වියවුල් ඇති කිරීම පිළිබඳ ඩොයිලි බොහෝ කනස්සල්ලට පත්විය. උඩරට පළාත්වල වූ ස්කාගාර වසා දැමිය යුතු යැයි කියමින් ඔහු බ්‍රිතාන්‍ය ආණ්ඩුවට කරුණු ඉදිරිපත් කළේය. ගමින් ගමට, පළාතෙන් පළාතට සංක්‍රමණය වෙමින් උඩරට ගැමියන් හා මුසු වූ ඩොයිලි ගැමි සුවඳ ඉතා ප්‍රිය කළේය.

ජෝන් ඩොයිලි පිළිබඳ 1810 දී ඔහුව මුණ ගැසුණු බ්‍රිතාන්‍ය ජාතිකයෙක් පවසා තිබුනේ මෙබඳු විස්තරයකි.

"සිවිල් සේවයේ සිටින එකම සිංහල උගතා [ඩොයිලි] ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර විශාරද බොහෝ දෙනා මෙන් ගති පැවතුම්වලින් මුළුමනින්ම පාහේ ස්වදේශිකයෙකු බවට පත්ව සිටියි. ඔහු කිසිවෙකු තම ගෙදරට නොකැඳවයි. වසරකට වරක් වුව රාත්‍රී භෝජනය සඳහා බැහැර නොයයි. ඔහු අශෝභන නමුදු ගුණවත්, අවංක තාපසයෙක් බව පෙනේ. එසේ සලකනු ලැබේ. ඔහු වූඩ් මහතාගේ රාත්‍රී භෝජන සංග්‍රහයට පැමිණි විට කේම්බ්‍රිජ් [විශ්වවිද්‍යාලයීය] තරුණ ගැටයෙකු මා තරම් වයස පෙනෙන සිංහල තාපසයෙකු බවට වෙනස්වීම ගැන මවිත වීමි"

මේ සටහන ලියූ පුද්ගලයා ඒ වන විට 45 වෙනි වියේ සිටියදී ඩොයිලි පසුවූයේ 31 වෙනි වියේය.

කෙතරම් භාරදූර රාජකාරී කටයුතුවල යෙදුණද සැහැල්ලු විනෝදකාමී ජීවිතයක් ගත කළ ඩොයිලි 1824 මැයි මස 25 දින සත්කෝරලයේ සංචාරයක යෙදී සිටියදී උණ සන්නිපාතය රෝගය වැලඳී උඩරටදීම අවසන් හුස්ම හෙළුවේය. අවිවාහකයෙකු වූ ශ්‍රීමත් ජෝන් ඩොයිලි මිය යනවිට පනස්වන වියේ පසුවිය. ඩොයිලි මිය යන විට ඔහු බ්‍රිතාන්‍ය මහ රජතුමාගේ සභාවේ සාමාජිකයෙකු ලෙසද, උඩරට පළාත් භාර රජයේ නියෝජිත තැන ලෙසද, පළමුවැනි කොමසාරිස් තැන ලෙසද කටයුතු කළ බව කියැවේ. මහනුවර ගැරිසන් සුසාන භූමියේදී පූර්ණ රාජ්‍ය ගෞරව සහිතව ශ්‍රීමත් ජෝන් ඩොයිලිගේ අවමඟුල් පෙරහර පවත්වන ලදී. එහි සොහොන් ගැබෙහි ඔහු නමින් සටහන් තබන ලද ලේඛනයක්ද දක්නට ලැබේ.

ජෝන් ඩොයිලිගේ සොහොන් ගැබ.

1824 මැයි මස 21 වැනිදා ලංකා ගැසට් පත්‍රය ඩොයිලිගේ මරණය පිළිබඳ වාර්තා කරන්නේ මෙසේය.

"මහ රජුගේ ලංකා සභිකයකු වූද, කන්ද උඩරට පළාත්වල නේවාසික හා රජයේ ප්‍රථම කොමසාරිස් වූද, ගරු සර් ජෝන් ඩොයිලි බැරන්වරයා රාජකාරි කටයුතු සඳහා සත්කෝරලයට ගිය ගමනේදී වැලඳුණු මුර උණ රෝගයෙන් පෙළී, 25 වැනිදා පෙරයම 1.00ට කන්දේ නුවරදී අභාවප්‍රාප්ත විය. 26 වැනිදා උදේ ඔහුගේ මෘත ශරීරය මාලිගා චතුරශ්‍රය තුළ ඔහු නැවතී සිටි ස්ථානයේ සිට, සුසානයේ භූමිදාන කරනු සඳහා ගෙනයන ලදී. උදේ 7.00ට යුධ හමුදාව මාලිගාවේ සිට හමුදා සුසානය තෙක් පාර දෙපස පෙළගැසී සැදිණි."

ඩොයිලිගේ මරණයත් සමග උඩරට ඉංග්‍රීසි නියෝජිත හෙවත් රෙසිඩන්ට් ධුරය අහෝසි විය. සිය මව් බිමට වඩා ලංකාවට ඇළුම් කළ ශ්‍රීමත් ජෝන් ඩොයිලි ක්‍රි.ව. 1801 සිට ක්‍රි.ව. 1824 දක්වා අවුරුදු 23 ක කාලපරාසයේදී අප රටේ ඉතිහාසය තුළ කළ කී දෑ සදාකාලිකවම අපේ ඉතිහාසයේ සටහන් වේ.

මහනුවර කෞතුකාගාරය ඉදිරිපිට ඇති ඩොයිලිගේ ප්‍රතිමාව

Reference: https://www.lankadeepa.lk/Diyatha-News - 2018 මාර්තු මස 12

http://aagiyakatha.blogspot.com/2012/07/10.html
ඉංග්‍රීසීන්ට උඩරට දිනා දුන් යටි කුට්ටු මහ මොළකාරයා -
ඉතිහාසයේ අප්‍රකට කතා 10

ඩොයිලිගේ දිනපොත / එච් ඩබ් කොඩ්රින්ටන්, පරිවර්තනය : ධර්ම ශ්‍රී ගුණපාල

සිංහලේ ආණ්ඩු ක්‍රම / ජෝන් ඩොයිලි, පරිවර්තනය : එච්.එම්. සෝමරත්න

A Short History of Ceylon by H. W. Coddington

රාජ්‍ය හා සංස්ථාපිත ආයතනවල සිදුවන මුල්‍ය අක්‍රමිකතා සහ දූෂණ පිළිබඳ සංසිද්ධීන් තවදුරටත් සංකල්පිත සිද්ධියක් වශයෙන් නොපවතී. එය වර්තමාන ලෝකයේ රටවල් හරහා දේශ සීමාවන් ඉක්මවමින් , දේශපාලන ස්ථාවරත්වයන් සැහැල්ලුවට ලක්කරමින්, සමාජ ආර්ථික හා දේශපාලන ව්‍යුහයන් විනාශ කරමින් , සංවර්ධන සැලසුම්වලට බාධා පමුණුවමින් , ආණ්ඩු කෙරෙහි පවතිනා විශ්වාසයන් පළුදු කරමින් හා ත්‍රස්ත්‍රවාදය වපුරවමින් මහා ප්‍රවාහයක් සේ ක්‍රියාත්මක වේ. දූෂණ ක්‍රියාවන් නිසා සිදුවන රාජ්‍ය සම්පත්වල නාස්තිය හා අවභාවිතය, පුරවැසියන් ගේ ජීවිත කෙරෙහි සිදුකරන ඍණාත්මක බලපෑම හේතුවෙන් එමගින් සිදුවන සමාජ හා ආර්ථික හානි අවම කිරීම සඳහා සෑම රටක්ම , රාජ්‍ය මට්ටමින් හෝ ආයතනික මට්ටමින් සිය අවධානය නිරන්තරයෙන් යොමුකරනු ලබයි.

රාජ්‍ය සම්පත් සුරැකීම සම්බන්ධයෙන් මුර බල්ලාගේ වගකීම දරන උත්තරීතර විගණන ආයතන, සිය රාජකාරි ඉටුකිරීමේදී ආයතනික වංචා හා දූෂණ අවස්ථා පිටු දැකීම හා අනාවරණය පිළිබඳව ඉහල අවදානයක් යොමුකරනු ලබයි. වර්ෂ 40කට ඉහතදි ප්‍රසිද්ධියට පත්කල " ලීමා ප්‍රකාශනය" අනුව රාජ්‍ය අංශ විගණනයේ එක් ප්‍රබල අරමුණක් වන්නේ රාජ්‍ය මුල්‍ය කළමණාකරන මූලධර්මයන් වන නීතියට අනුකූලවීම,ආර්ථිකමයබව, කාර්යක්ෂමතාවය හා පලදායි බව යන සංකල්ප වලින් බැහැරවීම්, අවස්ථාවන් වශයෙන් වෙන් වෙන්ව හඳුනා ගැනීම, එවැනි අවස්ථා අවම කිරීම සඳහා පියවර ගැනීම සහ වංචා සහ දූෂණ වලට වගකිවයුතු පාර්ශවයන්ගෙන් අදාල පාඩු හා හානි අයකර ගැනිමට පියවර ගැනීම වේ. උත්තරීතර විගණන ආයතන සඳහා වු ජාත්‍යන්තර විගණන ප්‍රමිතීන් (ISSAI 1000) අනුව වංචා හා දූෂණ සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ විගණකයාට වඩා වැඩි වගකීමක් රාජ්‍ය අංශයේ විගණකයාට පැවරෙනු ලබන්නේ රාජ්‍ය සම්පත් අවභාවිතය හා දූෂණ ක්‍රියා හේතුවෙන් වන හානි හා පාඩු රටේ පුරවැසියාගේ ජීවන තත්වය කෙරෙහි ඍජුව බලපාන හෙයිනි.

උත්තරීතර විගණන ආයතන සම්බන්ධ ජාත්‍යන්තර සංවිධානය (International Organization for Supreme Audit Institutions – INTOSAI) වංචා සහ දූෂණ තුරන් කරලිම සඳහා අන්තර් ජාතික මට්ටමේ සහයෝගීතාවයන් වර්ධනය කිරීමේ අවශ්‍යතාවය 1971 වර්ෂය තරම් ඈත අවධියක සිට හඳුනාගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් එක්සත් ජාතීනගේ අනුබද්ධ සංවිධාන සමග අවබෝධය වර්ධනය කිරීම සඳහා විවිධ මට්ටමේ සාකච්ජා සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම සඳහා පියවර ගෙන තිබුණි. ඒ අනුව, රාජ්‍ය ආයතනයන්හි දූෂණ සහ අව කළමණාකරනය සම්බන්ධයෙන් උත්තරීතර විගණන ආයතනවල කාර්ය භාරය පැහැදිලි කර ගැනීමේ අපේක්ෂාවෙන් , 1996දී මත්ද්‍රව්‍ය හා අපරාධ පිටුදැකීම සඳහා වු එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UN Office on Drugs and Crimes-UNODC) සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන්කර තිබුණු

අතර එමගින් කාර්යක්ෂම මූල්‍ය කළමනාකරන විධි ක්‍රම ස්ථාපිත කිරීම සඳහාත්, වංචා සහ දූෂණ සම්බන්ධ විගණන අවදානම අවම කරලිම සඳහා යෝග්‍ය පරිචයන් ස්ථාපිත කිරීම සඳහාත් අවකාශ සැලසී තිබුණි.

රාජ්‍ය ආයතනයන්හි දූෂණ සහ අව කළමණාකරනයට එරෙහි සටන් කිරිම සම්බන්ධයෙන් උත්තරීතර විගණන ආයතනවලට පැවරෙන වගකීම සුළු පටුනොවේ. රාජ්‍ය දූෂණයට එරෙහි පාලන උපක්‍රමයක් වශයෙන් පිහිටුවා තිබෙන විවිධ නියාමන ආයතන වල කාර්ය භාරය දේශපාලනික ක්‍රියාකාරකම් හේතුවෙන් යම් යම් සීමාවන්ට භාජනය වුවද, උත්තරීතර විගණන ආයතනවලට රටේ මූලික ව්‍යවස්ථාවෙන් පැවරෙන අභිමතානුසාරී බලය හේතුවෙන් ස්වාධිනව කටයුතු කිරීමේ හැකියාව ලැබේ. තවද, දූෂණ ක්‍රියාකාරකම් තිරසාර ලෙස මැඩලීම රාජ්‍ය ගනුදෙනු හා තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සම්බන්ධයෙන් විනිවිදභාවය (Transparency) ආරක්ෂා කිරීම අනිවාර්ය සාධකයක් ලෙස පිළිගන්නා අතර එම සාධකය පරීක්ෂාවට භාජනය කරන ආයතන වශයෙන් උත්තරීතර විගණන ආයතන පිළිගැනිමට භාජනය වේ.

රාජ්‍ය ආයතනයන්හි දූෂණ සහ අව කළමණාකරනයට එරෙහි සටන් කිරිම සම්බන්ධයෙන් උත්තරීතර විගණන ආයතනවලට පැවරෙන වගකීමේ ස්වභාවය මැනවින් හඳුනාගෙන සිටින දූෂණ ක්‍රියාකාරකම් පිටුදැකීමේ අරමුණින් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර වශයෙන් පිළිගත් රාජ්‍ය නොවන සංවිධාන සිය දර්ශකයන් සකස් කිරීම සඳහා එක් එක් රටෙහි උත්තරීතර විගණන ආයතනවල කාර්ය භාරය මිනුම් දන්ඩක් සේ සළකා ක්‍රියාකරනු ලබයි. International Budget Partnership නමැති සංවිධානය, සිය විවෘත අයවැය සමීක්ෂණය (Open Budget Survey) ඔස්සේ රටක රාජ්‍ය ගනුදෙනුවල විනිවිදභාවය මැනීම සඳහා අයවැය ලේඛන ක්‍රියාවලිය සම්බන්ධයෙන් විනිවිද භාවය ආරක්ෂා කිරීම, අයවැය ලේඛන ක්‍රියාවලිය සඳහා මහජන සහභාගිත්වය හා එම ක්‍රියාවලිය පසු පරීක්ෂාවට භාජනය කිරීම යන සාධකයන් සලකාබලන අතර මේ සම්බන්ධයෙන් උත්තරීතර විගණන ආයතනවලට පැවරෙන වගකීමේ ස්වභාවය සැලකිල්ලට ගනු ලබයි.එසේම,පිළිගත් රාජ්‍ය නොවන සංවිධානයක් වන Transparency International විසින් වාර්ෂිකව පිළියෙල කරනු ලබන දූෂණ අපේක්ෂණ දර්ශකය (Corruption Perception Index-) සඳහාත් දේශ සීමා රහිත මාධ්‍යකරුවෝ (Journalists without borders) සංවිධානය විසින් පිළියෙල කරනු ලබන මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකය සඳහාත් ඒ ඒ රටවල උත්තරීතර විගණන ආයතනවල කාර්යසාධනය වැදගත් මිම්මක් වශයෙන් සලකනු ලබයි.

උක්ත කරුණු අනුව, වර්තමානයේදී එක්සත් ජාතින්ගේ සංවිධානය ඇතුළුව වෙනත් ජාත්‍යන්තර සංවිධාන, රාජ්‍යයන්හි මානව සංවර්ධන දර්ශකයන් ගණනය කිරිමේ දී එම රාජ්‍යයෙහි උත්තරීතර විගණන ආයතනයෙහි කාර්ය සාධනය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන බව පෙනේ. රාජ්‍යයක යහපාලනය තහවුරු කෙරෙන එක් කුළුණක් වශයෙන්

උත්තරීතර විගණන ආයතනයෙහි ස්වාධීනත්වය, රාජ්‍ය ආයතන වල ගනුදෙනු වාර්තාකිරීමේදී විනිවිද භාවය ආරක්ෂාකිරීම සඳහා උත්තරීතර විගණන ආයතන මගින් කලහැකි බලපෑම සහ එහි වාර්තා මගින් රාජ්‍ය ආයතනවල ගුණාත්මක වර්ධනය සඳහා කෙරෙන දායකත්වය වැනි කරුණු මෙහිදී සැළකිල්ලට ගනු ලබන හෙයින් විගණන වාර්තාවල ගුණාත්මක තත්වය නිරන්තරයෙන් ආරක්ෂාකිරීම සඳහා කටයුතු අත්‍යවශ්‍ය කරුණක් සේ සැලකේ. එසේම,රාජ්‍ය විගණන ක්ෂේත්‍රයේ සිදුවන නව සංවර්ධනයන් හා නැඹුරුතාවයන් අවබෝධ කර ගැනීමත්, විගණන වාර්තා පරිශීලනය කරනු ලබන විවිධ පාර්ශවයන් හා ඔවුන්ගේ අවශ්‍යතාවයන් කෙරෙහි නිරන්තර අවධානයෙන් සිටීමත් වර්තමාන රාජ්‍ය විගණකයා මුහුණ දෙන අභියෝගයන් සේ සැළකිය හැකිය.

(INTOSAI වෙබ් අඩවිය ඇසුරිනි)

ජී. ඒ. එම්. අයි. ගුණරත්න

විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති

ව්‍යාජ ණය හිමි වංචාව යනු ආයතනවල සේවකයින්ට වංචාවන් සිදු කළ හැකි පහසු හා වඩාත් ප්‍රචලිත ක්‍රමයකි. මෙම ලිපිය මගින් එම වංචාව ක්‍රියාත්මක කරන ආකාරය සහ අවදානම් පාදක විගණන ක්‍රමවේදය (Risk Based Audit Methodology) භාවිතා කර එය අනාවරණය කරගන්නා ආකාරය පිළිබඳව අවධානය යොමු කරනු ලබයි. පැහැදිලි කර ගැනීමේ පහසුව සඳහා පහත උදාහරණය සලකා බලමු.

රාජ්‍ය ආයතනයක ප්‍රාදේශීය කාර්යාලයක ණයහිමියන් ගිණුම්ගත කිරීම හා ගෙවීම් කිරීම Mr. O විසින් සිදු කරනු ලබයි. Mr. O විසින් ABC Services නමින් ව්‍යාජ සැපයුම්කරුවකු ඇති කරනු ලබයි. එම නව ණය හිමියාගේ ලිපිනය ලෙස අදාල නිලධාරියාගේ සහෝදරිය (Ms. S) ගේ පුද්ගලික නිවසේ ලිපිනය භාවිතා කර ඇත. ABC Services ආයතනයට ගෙවීම් කිරීම සඳහා ආධාරක ලියවිලි ලෙස ව්‍යාජ උපදේශන ඉන්වොයිසි ද අදාළ නිලධාරියා විසින් නිර්මාණය කරයි.

පරිගණකය මගින් චෙක්පත් පිළියෙල කරනු ලබන අතර චෙක්පත් භෞතිකව අත්සන් කිරීමට පෙර කිසිවෙකු ඉන්වොයිසිය සමාලෝචනය නොකරයි. Ms. S වෙත අත්සන් කරන ලද චෙක්පත් තැපෑලෙන් එවනු ලබයි.

Ms.S විසින් ABC Services නාමයෙන් විවෘත කරන ලද බැංකු ගිණුමට තමා වෙත ලැබෙන චෙක්පත් තැන්පත් කරනු ලබයි. එම ගිණුමේ එකම බලයලත් අත්සන් කරන්නා ඇයයි. ඉන්පසු ඇය ABC Services බැංකු ගිණුමෙන් චෙක්පත් ලියා තමාගේ හා තම සහෝදරයාගේ අවශ්‍යතා සඳහා මුදල් ලබා ගනී.

ණය හිමි වංචාව විගණනය කිරීම

ඉහත වංචාව පිලිබද ඉඟියක් පෙත්සමක් මගින් හෝ පුද්ගලයෙකු විසින් ලබා දී නැත්නම් හෝ පෙර අත්දැකීමක් නොමැති නම් එම ආයතනය විගණනය කිරීමට ගිය විගස ඒ පිළිබඳව අවබෝධයක් ඔබට නොතිබිය හැක. තවද එවැනි ඉඟියක් මබ සතුව තිබුනද, විගණනය වෘත්තීය වශයෙන් සැලසුම් කර ක්‍රියාත්මක කල යුතු වේ. ඒ අනුව අවදානම් පාදක විගණන ක්‍රමවේදය භාවිතාකර එවැනි වංචාවක් ඇතිවීමට ඇති හැකියාව පිලිබඳව තක්සේරුවක් ඔබටම සිදු කළ හැකි අතර විගණන ප්‍රමිතිවලට අනුකූලව පහත ක්‍රමවේදය අනුගමනය කළ හැකිය.

පියවර 1

ආයතනය හා එහි පරිසරය පිලිබඳව අවබෝධයක් ලබා ගැනීම තුලින් සිදුවිය හැකි වැරදි හා වංචා හඳුනා ගැනීම හා ඇගයීම (ශ්‍රී.ල.වි.ප්‍ර.315) මෙහිදී ආයතනය අයත් කර්මාන්තය හා ආයතනයට අදාල නීතිමය පසුබිම ආයතනයේ කාර්යභාරය, ප්‍රධාන මෙහෙයුම්, අරමුණු හා උපක්‍රම ආයතනයේ අභ්‍යන්තර පාලනයන් එහි ක්‍රියාකාරීත්වය, තොරතුරු පද්ධති පිළිබඳව අවබෝධයක් ලබා ගත යුතුය. එසේ ආයතනය පිළිබඳව ලබාගත් දැනුම මිලදී ගැනීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ කිරීමේදී මිලදී ගැනීම් ක්‍රියාවලියට අනුකූලව ආයතනයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා මිලට ගතයුතු සැපයුම් හා සේවාවන්, ඊට අදාල නීතිමය පසුබිම, මිලදී ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධව ආයතනයේ අනුමත ප්‍රතිපත්තිය මිලදී ගැනීමට අදාල පාලනයන් හා ඒවායේ ක්‍රියාකාරීත්වය, මිලදී ගැනීම් වාර්තා කරන පොත්පත් ලේඛණ හා පරිගණක මෘදුකාංග පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිය. මෙම ලබාගත් දැණුම මගින් ආයතනය සාමාන්‍යයෙන් මිලදීගනු ලබන සේවාවන් පිලිබඳව විගණනයේදී වඩාත් සැලකිලිමත් විය හැක. ඉහත උදාහරණයට අනුව ආයතනය උපකාර්යාලයක් හා සේවක පිරිස ප්‍රමාණයෙන් අඩු බැවින් හා ප්‍රධාන කාර්යාලයෙන් නිසි අධීක්ෂණයක් නොකරන්නේනම් හා මුල්‍ය බලතල වැඩි වශයෙන් පවරා දී ඇත්නම්

කාර්යක්ෂම අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාමක් අපේක්ෂා කල නොහැකි අතර අභ්‍යන්තර පාලනයේ ක්‍රියාකාරීත්වය භාරව කටයුතු කරන උපකාර්යාලයේ නිලධාරීන් එම අභ්‍යන්තර පාලනයන් අභිබවා (Overight) කටයුතු කිරීමේ හැකියාවද ඉහලය.

පියවර 2

ආයතයේ සැපයුම් හා ණය හිමියන් පිලිබඳව විගණනය කිරීමට පෙර එහි ප්‍රමාණාත්මකභාවය (ශ්‍රී.ල.වි.ප්‍ර.320) පිලිබඳව අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ. මෙහිදී මුළු වගකීම් වලට ණයහිමිශේෂයේ ප්‍රතිශතය= ණයහිමියෝ/(මුළු වගකීම්)×100 ගණනය කළ හැකිය. මෙමඟින් මුළු වගකීම් වලින් ණය හිමි ශේෂය කොපමණ ප්‍රතිශතයක්ද නැතහොත් ශේෂ පත්‍රයේ මුළු වගකීම්වලින් කොපමණ ප්‍රමාණයක් ණය හිමියන්ගෙන් නියෝජනය වන්නේද යන්න පිළිබඳව අවබෝධයක් ලබා ගෙන මූල්‍ය ප්‍රකාශන මට්ටමින් ණය හිමියන්ගේ වැදගත්කම පිළිබඳව අවබෝධ කරගත හැකිය.

පියවර 3

ආයතනය හා එහි පරිසරය පිළිබඳව ලබාගත් දැනුම තම විගණන කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන් සමග නිරන්තරයෙන් හුවමාරු කර ගැනීම (ශ්‍රී.ල.වි.ප්‍ර.300) මගින් කණ්ඩායමේ සියළුම සාමාජිකයන්ගේ දැනුම සමාන මට්ටමට ගෙන ඒමත් ඉදිරි විගණන ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමටත් වැදගත් වනු ඇත.

පියවර 4

ශ්‍රී.ලං.වි.ප්‍ර. 520 අනුව ණය හිමියන් හා ගැණුම්වලට අදාලව විග්‍රහාත්මක සමාලෝචනයක් සිදුකිරීම. විගණනයට අදාලව විග්‍රහාත්මක සමාලෝචනය යනු මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරුවල සම්බන්ධතාවයන් විශ්ලේෂණය කිරීම මගින් මූල්‍ය තොරතුරු ඇගයීමේ හා අර්ථකථනය කිරීමේ ක්‍රියාවලියකි. ඉහත උදාහරණයට අදාලව තොරතුරු උපයෝගී කර ගෙන විග්‍රහාත්මක සමාලෝචනය සිදු කිරීම පිළිබඳව සලකා බලමු.

X අධිකාරිය
ප්‍රාදේශිය කාර්යාලය -Y පළාත
2020/12/31 දිනට ශේෂ පත්‍රය

වත්කම්	2020	2019
ජංගම නොවන වත්කම්		
දේපල පිරියත හා උපකරණ	52,000	44,700
අස්පෘශ්‍ය වත්කම්	3,000	4,000
ජංගම වත්කම්		
තොගය	16,000	14,000
ලැබිය යුතු ගිණුම්	24,500	18,500
මුදල් හා බැංකු	4,500	3,800
මුළු වත්කම්	100,000	85,000
හිමිකම් හා වගකීම්		
හිමිකම්		
සමුච්චිත අරමුදල	50,000	50,000
සංචිත	24,250	18,150
ජංගම නොවන වගකීම		
බැංකු ණය	3,000	4,000
ජංගම වගකීම්		
ගෙවිය යුතු ගිණුම්	19,500	10,000
උපචිත වියදම්	2,500	2,300
බැංකු අයිරාව	750	550
මුළු හිමිකම් හා වගකීම්	100,000	85,000

X අධිකාරිය - පොදු ලෙජරය

ගැණුම්

XX ණය හිමි පාලන	27,000		

උපදේශන සේවා

XX ණය හිමි පාලන	60,000		

ණය හිමි පාලන ගිණුම

		1/1 ශේෂය ඉ/ගේ	10,000
XX බැංකු	77,500	XX ගැණුම්	27,000
12/31 ශේෂය	19,500	XX උපදේශන සේවා	60,000
	97,000		97,000

X අධිකාරිය- <u>ණය හිමි ලෙජරය</u>

ABC Services

XX බැංකු	21000	1/1 ශේෂය ඉ/ගේ	1,000
XX බැංකු	29500	XX උපදේශන සේවා	20,000
12/31 ශේෂය	500	XX උපදේශන සේවා	30,000
	51,000		51,000

P Suppliers

XX බැංකු	2,000	1/1 ශේෂය ඉ/ගේ	2,000
XX බැංකු	4,000	XX සැපයුම්	8,000
12/31 ශේෂය	11,000	XX සැපයුම්	7,000
	17,000		17,000

Q Suppliers

XX බැංකු	9,000	1/1 ශේෂය ඉ/ගේ	3,000
XX බැංකු	4,000	XX සැපයුම්	6,000
ශේෂය ප/ගෙ	2,000	XX සැපයුම්	6,000
	15,000		15,000

R Services

XX බැංකු	400	1/1 ශේෂය ඉ/ගේ	4,000
XX බැංකු	400	XX උපදේශන සේවා	400
ශේෂය ප/ගේ	6,000	XX උපදේශන සේවා	600
	14,000		14,000

ඉහත උදාහරණය සඳහා මූල්‍ය අනුපාත විශ්ලේෂණය ප්‍රායෝගිකව භාවිතා කිරීම පිළිබඳව සලකා බලමු. මේ සඳහා ඔබ දැනටමත් ඉගෙනගෙන ඇති අනුපාත සහ ඔබ විසින්ම නිර්මාණය කරන ලද අනුපාත හා විශ්ලේෂණයන් භාවිතා කළ හැක.

ණය හිමියා	ණය හිමි පිරිවැටුම් අනුපාතය = ණයට සැපයුම් සේවාවන් / සාමාන්‍ය ණය හිමියෝ	සාමාන්‍ය ණය ගෙවීමේ කාලය = සාමාන්‍ය ණය හිමියෝ / සැපයුම් සේවන් X 365	සැපයුම් හා සේවා ප්‍රතිශතය = එක පුද්ගල සැපයුම් / මුළු සැපයුම් හා සේවා X 100		සාමාන්‍ය ණය හිමි ශේෂය මුළු සාමාන්‍ය ණය හිමියන්ගේ ප්‍රතිශතයක් ලෙස = සාමාන්‍ය ණය හිමි ශේෂය X 100 / මුළු සාමාන්‍ය ණය හිමි ශේෂය
01).ණය හිමි පාලන ගිණුම්	87000 / 14750 =6 times	14750 / 87000 x 365 =62 days	-	X	-
02).ABC Services	50000 / 750 = 67 times	750 / 50000 x 365 =5 days	50000 / 8700 x 100 =57.9%	ABC	750 / 14750 X 100 = 5%
03).p suppliers	15000 / 6500 =2.3 times	6500 / 15000 x 365 =158 days	1500 / 87000 x100 =17.3%	P	6500 / 14750 X 100 = 44%
04).Q suppliers	12000 / 2500 =4.8 times	2500 / 12000 x 365 =76 days	12000 / 87000 x100 =13.8%	Q	2500 / 14750 X 100 = 17%
05).R services	10000 / 5000 =2 times	5000 / 10000 x 365 =183 days	10000 / 87000 x100 11.4%	R	5000 / 14750 X 100 = 34%

ඉහත අනුපාත ගණනය කිරීම ඒ පිළිබඳ සාමාන්‍ය දැනුමක් තිබෙන අයෙකුට උවද සිදුකල හැක. නමුත් වඩාත් වැදගත් වන්නේ එම ගණනය කළ අනුපාත අර්ථකථනය කිරීමට (වඩාත් ඵලදායි ලෙස පැහැදිලි කර ගැනීම) ඇති හැකියාවයි. ඒ අනුව ඉහත ගණනය කරන ලද අනුපාත වඩාත් ප්‍රයෝජනවත් ආකාරයට අර්ථකථනය කර ගනිමු.

පළමුව අනුපාත මගින් පිලිඹිබු වන ආයතනයේ සමස්ත තත්වය පිලිබඳ අවබෝධකරගෙන ඉන් අනතුරුව එය එක් එක් සැපයුම්කරුවන්ගේ තත්වය සමඟ සංසන්දය කර බලමු.

<u>ණයහිමි පිරිවැටුම් අනුපාතය</u>

ණයහිමි පිරිවැටුම් අනුපාතය සැලකීමේදී සමස්ථ ආයතනය එහි සාමාන්‍ය ණයහිමියන් මෙන් 06 ගුණයක සැපයුම් හා සේවාවන් වර්ෂයක් තුලදී මිලදී ගනී. එක් එක් ණය හිමි ගිණුම්වල ණය හිමි පිරිවැටුම් අනුපාතය මුළු ණය හිමි පිරිවැටුම් අනුපාතය සමඟ සැලකීමේදී P,Q හා R ණයහිමියන්ගෙන් ආයතනයේ සමස්ථ ණයහිමි පිරිවැටුම් අනුපාතයට වඩා අඩු අනුපාතයක සැපයුම් හා සේවාවන් ලබාගනී. නමුත් ABC Services හි සාමාන්‍ය ණය ශේෂය මෙන් 67 ගුණයක සේවාවක් වර්ෂය තුලදී ලබාගෙන ඇත. එය ආයතයේ සමස්ත තත්වය වන 06 ගුණය හා සැලකීමේදී අසාමාන්‍ය තත්වයක් නිරූපණය වේ. මෙය විගණක විසින් අවධානය යොමුකළ යුතු තත්වයක් වේ. එය අනෙකුත් අනුපාතවල ප්‍රතිඵල සමගද සංසන්දය කර ඉදිරි විගණන ක්‍රියාමාර්ග තීරණය කල යුතුවේ.

<u>සාමාන්‍ය ණය ගෙවීමේ කාලය</u>

ආයතයේ ණය ගෙවීමේ සාමාන්‍ය දින 62 ක් වේ. එය එක් ඒක් ණය හිමියන්ගේ තත්වය සමග සංසන්දන කිරීමේදී ABC Services හැර අනෙකුත් ණය හිමින්ට ගෙවීම් කිරීම සඳහා ඊට වඩා දින ගණනක් ගතවී ඇත. නමුත් ABC Services ආයතනයට දින 05 ක් වැනි ඉතා අඩුකාලයකදී ගෙවීම් කර ඇත. මෙම තත්වය විගණකගේ අවධානය යොමු විය තත්වයක් බව නිරීක්ෂණය වේ.

<u>එක් ණය හිමියෙකුගේ සැපයුම් මුළු සැපයුම් වල ප්‍රතිශතයක් ලෙස</u>

ආයතනයේ මුළු සැපයුම් හා සේවා වලින් එක් එක් සැපයුම්කරුවන් විසින් දක්වන ලද දායකත්වය සැලකීමේදී ABC Services මුළු සැපයුම් හා සේවා වලින් 57.9% ක් ලබා දී ඇත. එය අනෙකුත් සැපයුම්කරුවන්ගේ දායකත්වය හා සැලකීමේදී සැලකියයුතු තත්වයක් වන අතර ABC Services විසින් සපයන ලද සේවාවන් විගණනය කිරීම මගින් ආයතනය ලබාගත් සැපයුම් හා සේවාවලින් 60% කට ආසන්න ප්‍රමාණයක් විගණනයට ලක් කල හැකි බැවින් විගණක විසින් ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වේ.

ඒ අනුව ABC Services සැපයුම්කරුට ආයතනයේ සාමාන්‍ය තත්වයට වඩා වැඩි වාසිදායක ආකාරයකට කටයුතු කර ඇති බව මූලිකව පෙනීයන බැවින් ඒ පිළිබඳව විගණක වඩා සැලකිලිමත් විය යුතු අතර ඒ පිළිබඳව විෂය නිලධාරීන්ගෙන් හා කළමණාකරණයෙන් විමසිය යුතුය. ඇතැම් විට ආයතනයේ කාර්යභාරය අනුව යම් සැපයුම්කරුවකු ආයතනයේ ප්‍රධානම සේවා සැපයුම්කරු (Key services supplier) විය හැක. නැතහොත් එම ආයතනය සම්බන්ධිත පාර්ශවයක් (Related Party) හෝ වංචනික ණය හිමියෙකු විය හැක. (ශ්‍රී ලං.වි.ප්‍ර. 240 බලන්න) සම්බන්ධිත පාර්ශව ගණුදෙණු විගණනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලං.වි.ප්‍ර. 550 බලන්න.

පියවර 5

ණයහිමි ශේෂය හෝ මුළු සැපයුම් හා සේවාවන් විගණනය කිරීමේදී ප්‍රායෝගිකව සියළුම ණය හිමිශේෂ හෝ සැපයුම් හා සේවාවන් විගණනය කිරීම අපහසු වේ. එම නිසා ඉහත විග්‍රහාත්මක සමාලෝචනයෙන් පසුව සමස්ත ණය හිමිශේෂයෙන් (population - සංගණනය) ප්‍රමාණවත් හා යෝග්‍ය නියදියක් (sample) තෝරා ගැනීම අවශ්‍ය වේ. නියදි තෝරා ගැනීම සම්බන්ධ විගණන ප්‍රතිපාදන සඳහා ශ්‍රී ලං.වි.ප්‍ර. 530 අධ්‍යනය කරන්න. ඉහත විශ්ලේෂණය අනුව මුළු ණය හිමියන්ගේ හා/හෝ මුළු සැපයුම් හා සේවාවලින් හෝ වැඩි ප්‍රතිශතයක් ආවරණය වන ලෙස නියැදිය තෝරා ගත හැකි අතර නියදිය තෝරා ගැනීමට පහත පරිදි තොරතුරු විශ්ලේෂණය කර ගත හැක.

ණය හිමියා	මුළු සැපයුම් හා සේවා		අවසාන ශේෂය	
	වටිනාකම	ශේෂය	වටිනාකම	ප්‍රතිශතය
-ABC Services	50,000	57%	500	3%
- P Suppliers	15,000	17%	11000	56%
- Q Suppliers	12,000	14%	2000	10%
- R Services	10,000	12%	6000	31%
	87,000		19,500	

පියවර 6

විගණන ක්‍රියාවලියේදී අවදානම් හඳුනාගැනීම හා ඇගයීමේදී එම අවදානම් මගින් බලපෑමට ලක්විය හැකි සැදහුම් (assertions) පිළිබඳව අවධානය යොමුකර ඉදිරි විගණන ක්‍රියාපටිපාටි (Further audit Procedures) ඇතුලත් කර ණයහිමියන් හා ගැණුම් විගණනය කිරීම සඳහා විස්තරාත්මක විගණන සැලැස්මක් පිළියෙල කර ගත යුතුය. විගණන සැලැස්ම පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය පොදු විගණන ක්‍රියාපටිපාටි අන්තර්ජාලය පරිශීලනය කිරීමෙන් ලබාගත හැකි අතර විගණක විසින් විගණිත ආයතනයට අදාල වූ විශේෂිත විගණන ක්‍රියාපටිපාටි විගණක

විසින්ම නිර්මාණය කරගත යුතු වේ. ගණුදෙණු හා සිදුවීම් (උදා: සැපයුම් හා සේවා) ගිණුම් ශේෂ (උදා: ණය හිමියෝ) හා අදාල හෙළදරව්කිරීම් (උදා: සම්බන්ධිත පාර්ශව ගණුදෙණු) වලට අදාල සැදහුම් හා ඉහත අවදානම් හදුනාගැනීම හා ඇගයීමේදී බලපෑමට ලක්වේයැයි අපේක්ෂාකල හැකි සැදහුම් පිලිබද විස්තරයක් පහත දැක්වේ.

ගණුදෙණු හා සිද්ධීන් වලට අදාල සැදහුම් (උදා.සැපයුම් හා සේවාවන්)	සැදහුම් විස්තර කිරීම	සැදහුම් පරීක්ෂා කිරීමට යොදාගත හැකි විගණන ක්‍රියාපටිපාටි සඳහා උදාහරණ
1. Occurrence - සිදුවීම	ගණුදෙනුව සිදුවී ඇති බව	ඉන්වොයිස් හා ගෙවීම් වවුචර නියැදියක් තෝරාගෙන විධිමත් පරිදි සැපයුම් හා සේවා ලබාගැනීම සඳහා අනුමැතිය ඇති බව තහවුරු කර ගැනීම.
2. Completeness - සම්පූර්ණබව	සම්පූර්ණයෙන් වාර්තා කර ඇති බව	ලෙජර් ගිණුම්වල නිවැරදි සංඛ්‍යා සටහන් කර ඇති බව සහතික කිරීම සඳහා මුල් ලේඛණ සමඟ පරීක්ෂා කිරීම.
3. Accuracy - නිරවද්‍යතාවය	නිවැරදිව පොත්පත්වල වාර්තා කර ඇති බව	තෝරාගත් සැපයුම් ඉන්වොයිසිවල ගණිතමය නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා නැවත ගණනය කිරීම.
4. Cut off-කාලින බව	නියමිත ගිණුම් කාලච්ඡේදයට වාර්තා කර ඇති බව	නිවැරදි කාලසීමාව තුළ ගණුදෙණු වාර්තා වී ඇති බව තහවුරු කිරීම සඳහා වවුචර සාම්පල තෝරා වවුචරයේ දිනය තහවුරු කරන්න.
5. Classification - වර්ගීකරණය	නියමිත පරිදි වර්ගීකරණය කර ඇති බව	මිලදී ගත් භාණ්ඩ හෝ සේවාවන් නියමිත ලෙජර් ගිණුම්වල සටහන් කර ඇති බවට සැපයුම් ඉන්වොයිස් සමඟ පරීක්ෂා කරන්න.
6. Presentation & Disclosure- ඉරිපත් කිරීම හා හෙලිදරව් කිරීම	අවශ්‍ය හෙලිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන වල සිදු කර ඇති බව	මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වල හෙලිදරව්කිරීමේ අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට පරීක්ෂා ලැයිස්තුවක් පිළියෙල කර පරීක්ෂා කිරීම.

ගිණුම් ශේෂ වලට අදාල සැදහුම් (උදා. ණය හිමියෝ)	සැදහුම් විස්තර කිරීම	සැදහුම් පරීක්ෂා කිරීමට යොදාගත හැකි විගණන ක්‍රියාපටිපාටි සඳහා උදාහරණ
1. Existence - පැවැත්ම	ශේෂ පත්‍ර දිනට පවතින බව	ශේෂ තහවුරු කිරීම් ලබාගැනීම
2. Right & Obligation - අයිතිය හා බැදීම	අයිතිය හා ගෙවීම් කිරීමට ඇති බැඳියාව	මිලදීගැනීමේ ඇණවුම්, ගිවිසුම්, ඉන්වොයිසි, ජර්නල් වවුචර සහ බැංකු වාර්තා වැනි මූලාශ්‍ර ලේඛණ ගණුදෙනු ආරම්භයේ සිට අවසානය දක්වා පරීක්ෂා කිරීම.
3. Completeness - සම්පූර්ණත්වය	සෑම අතින්ම ගිණුම් ශේෂ සම්පූර්ණ බව	පසුගිය වසරේ අවසාන ශේෂය ප්‍රවර්තන වර්ෂයේ ආරම්භක ශේෂය සමඟ සංසන්දනය කිරීම.
4. Accuracy- නිරවද්‍යතාව	නිවැරදිව ගිණුම් පොත්පත්වල සටහන් කර ඇති බව	මුළු ණයහිමි ශේෂය සමඟ එක් එක් ණයහිමි ගිණුම් ශේෂ පරීක්ෂා කිරීම.
5. Classification- වර්ගීකරණය	නියමිත පරිදි වර්ගකර ඇති බව	ණයහිමි ගිණුම්වල පවතින හරශේෂ ලැබිය යුතු ගිණුම් ලෙස වර්ගීකරණය කර ඇති බව තහවුරු කිරීම.
6. Presentation & Disclosure- ඉදිරිපත් කිරීම හා හෙලිදරව් කිරීම	අවශ්‍ය හෙලිදරව් කිරීම් සහිතව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති බව.	මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් වල හෙලිදරව් කිරීමේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇති බවට පරීක්ෂා ලැයිස්තුවක් ආධාරයෙන් පරීක්ෂා කිරීම.

මේ අනුව ඉහත පරිදි අවදානම් හඳුනාගැනීමේ හා ඇගයීමේ ක්‍රියාවලියේදී ණය හිමියන් හා සැපයුම් හා සේවාවන්ට අදාලව බලපෑමට ලක්විය හැකි සැඳහුම් හඳුනාගත් පසුව එම බලපෑමට ලක්වන සැඳහුම් ඉලක්ක කර විගණන සැලැස්මක් පිළියෙල කර සැලසුම් කළ විගණන ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමෙන් සිදුවිය හැකි වැරදි හා වංචා ඉලක්කර අරමුණු ගතව විගණනය ක්‍රියාත්මක කර මූල්‍ය ප්‍රකාශනවලට සිදුවිය හැකි ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රකාශන වැරදි හා වංචා අනාවරණය කර ගත හැක.

මෙහිදී ඉටුකරනු ලබන සෑම විගණන ක්‍රියාපටිපාටියකටම අදාලව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි රැස්කර වාර්ථා ගත කළ යුතුය. ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි සම්බන්ධයෙන් ශ්‍රී ලං.වි.ප්‍ර. 500 සිට 620 දක්වා අදාල වේ.

පියවර 7

විගණන සාක්ෂි ලේඛණගත කිරීම

විගණන සාක්ෂි ලේඛණගත කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම ශ්‍රී ලං.වි.ප්‍ර. 230 හා ඊට අමතරව අනෙකුත් සියළුම විගණන තත්වපාලන ප්‍රමිත හා විගණන ප්‍රමිත මගින් අවධාරණය කර ඇත. මෙම ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි වලට විගණක විසින් තමා විසින්ම පිළියෙල කළ ලේඛණ (උදා.ආයතනය හා එහි පරිසරය අවබෝධකර ගැනීම, විගණිත කණ්ඩායම අතර සාකච්ඡා සටහන්, මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු විශ්ලේෂණය කිරීම) මෙන්ම ආයතනයෙන් ලබාගත් අදාල ලේඛණ ගොණු ගත කළ යුතුය. නමුත් බොහෝ අවස්ථාවල විගණක විසින් සිදුකරනු ලබන අතපසුවීමක් වනුයේ විගණක තමා විසින් කළ වැඩ සනාථ කිරීමට ලේඛණ පිළියෙල කර ලේඛණගත නොකිරීමයි. බොහෝ විට ප්‍රමාණාත්මක බව හා අදාල බව පිළිබඳව අවධානය යොමු නොකර ආයතනයෙන් ලබාගන්නා ලේඛණ විශාල ප්‍රමාණයක් විගණන ලිපිගොනුවල, ලේඛණගත කිරීමයි. ඒ අනුව විගණක විසින් මේ පිලිබඳව අවධානය යොමු කර විගණන ප්‍රමිතිවලට අනුකූලව අවදානම් හඳුනාගැනීම සඳහා අනුගමනය කල ක්‍රමවේදය, හඳුනාගත් අවදානම්, ක්‍රියාත්මක කළ විගණන ක්‍රියාපටිපාටි, විගණන වැඩසටහන් හා පරීක්ෂා ලැයිස්තු පිළියෙල කර හා අදාල විගණිත ආයතනයෙන් ලබාගත් ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි නිසි පරිදි වෘත්තිය විනිශ්චයන්ට එළඹීම, පසු පරිශීලනය, පසුවිපරම් කටයුතු හා අවශ්‍ය උවහොත් නීතිමය කටයුතු සඳහාද ඉදිරිපත් කල හැකි වන පරිදි ලේඛණගත කළ යුතු අතර එම ලේඛණ හා ලිපිගොණු කාලීනව යාවත්කාලීන කළ යුතුය. ලේඛණ යාවත්කාලීනව පවත්වා ගැනීම පසුවිපරම් කටයුතු සඳහා මෙන්ම ඉදිරි විගණන කටයුතු සඳහා ඉතා ප්‍රයෝජනවත් වේ.

සාරාංශය

විගණයේදී දේශීයවත් ජාත්‍යන්තරවත් පිළිගත් විගණන ක්‍රමවේදය (Audit Methodology) වන්නේ අවදානම් පාදක විගණන ප්‍රවේශයයි. (Risk Based Audit Approach) නමුත් මුල් අවස්ථාවලදී මෙය ප්‍රායෝගිකව තේරුම් ගැනීම අපහසු විය හැක. නමුත් ක්‍රමානුකූලව හා අඛණ්ඩව මෙම ක්‍රමවේදය අධ්‍යයනය කිරීමෙන් හා භාවිතා කිරීමෙන් ඉතා හොද ප්‍රතිඵල විගණනයේදී ලබා ගතහැක. විගණනයට තර්කානුකූලව හා විධිමත්ව ප්‍රවේශවීමටත්, විගණනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, වාර්ථාකිරිම හා පසුවිපරම් කිරීමටත්, අවශ්‍ය ඕනෑම විටක විගණන ලිපිගොනු විශ්වාසයෙන් යුතුව තෙවන පාර්ශව සමාලෝචනය (peer-review) හෝ නීතිමය කටයුතු සදහා ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති වේ. තවද විගණන වෘත්තීයභාවය පවත්වා ගැනීමටත්, විගණිත ආයතනයට හා රටේ සංවර්ධනයටද එමගින් අගය එකතු කිරීමක් සිදු කල හැකිය.

එමනිසා විගණනයේදී බොහෝ විගණකවරුන් විසින් අත්දැකීම් ලබා ඇති ව්‍යාජ ණය හිමියන් සම්බන්ධ ඉහත උදාහරණය භාවිතා කර ප්‍රායෝගිකව අවදානම් පාදක විගණක ක්‍රමවේදය (Risk Based Audit Methodology) පැහැදිලි කර ඇත. ඒ අනුව මෙම අවදානම් පාදක විගණන ක්‍රමවේදය ඕනෑම විගණනයක් සදහා භාවිතා කල හැක. මෙම විගණන ප්‍රමිත නිර්මාණය කරන ආයතන විසින් විවිධ පර්යේෂණ සිදුකරමින් විගණන ප්‍රමිත හඳුන්වා දී ඇති අතර ඉදිරියේදීද එයට විවිධ සංශෝධන කාලීනව සිදු වේ. එම නිසා වෘත්තීය විගණකවරුන් වශයෙන් මේ පිළිබදව අධ්‍යයනය කිරීමෙන් හා එම ප්‍රමිතිවල අවශ්‍යතාවයන් ප්‍රායෝගිකව භාවිතා කිරීමෙන් තම වෘත්තීයභාවය හා ජාතික විගණන කාර්යාලයේ ප්‍රතිරූපය ඉහළ නැංවීමට හා රටේ සංවර්ධනයට අවශ්‍ය විගණකගේ දායකත්වය ලබාදීමටත් හැකිවනු ඇත.

එන්. එච්. .ඒ. ආර්. කේ. ගුණරත්න

විගණන අධිකාරි (INS/A)

Procurement is a process applied by the auditee institutions to procure goods, services, works and consultancies in their operations. It generates lot of transactions that will cause to create an asset or an expense that are recorded in accounting records. Finally those transactions are link to the accounting output that is known as financial statements. Therefore, it will have ability to give an assurance about the compliance of Laws, Rules and Regulations while testing the economy, efficiency and effectiveness of such transactions. As the world has moved from traditional procurement to the e-procurement, it is better to learn about it and the way it could be applied

e-Government Procurement (e-GP) is defined as the collaborative use of information and communications technologies by government agencies, bidding community, regulatory and oversight agencies, other supporting service providers, and civil society in conducting ethical procurement activities of the government procurement process cycle for the procurement of goods, works and services, and management of contracts ensuring transparency, accountability and value-for-money in public procurement contributing to the socio-economic development of country.

About the System

PROMISe -Procurement Management Information System is the single Web based interactive Government Procurement System introduced under the initiative of the Department of Public Finance of the Ministry of Finance and Mass Media. This system contains the following modules.

- Vendor Registration module
- Procuring Entity Registration Module
- Goods and Services categorization module
- Procurement type, Procurement Plan and Procurement Activity Entering Module
- Preparation of (Bidding/Proposals) Documentation including Technical Specifications module
- Bidding Process, Clarification and Procurement Announcement / Request for Bids Module
- Publication of Request for Bids (RFB)/Request for Quotations/Request for Expression of Interest Sub Module
- Issuance of Bid/Quotations/Proposal/EOI/ Sub Module
- Clarification Process Sub Module
- Submission of Bid/Receipt of Bids/ Bid Opening Sub Module
- Evaluation of Bids Module (automatically and manually)

- Purchase Order Handling and Contract Awarding Module and e-Catalog System
- Complaints and Appeal handling module
- Payment Module
- Contract Administration and Project Monitoring
- e-Learning Platform

Procurement Planning

Procurement Planning is the first step in the Public Procurement process provides direction and time targets for procurement activities. This will also help procuring entities their procurement actions and ensure required budgetary provisions for each activity in advance. Procurement Entities are requested to prepare their Procurement Plan and upload that into the PROMISe soon as their budgetary allocations are confirmed. This will also help vendors and contractors to plan their bidding for public procurement well in advance and respond to those Notices on time.

Registration of Vendors

With the launching of the PROMISe all the vendors registered with the system will be able to submit their bids, have the access to the Tender Notices, EOIs, and RFPs under any government organizations, seek clarification, interpretation on any matter pertaining to respective procurement system and able to submit bids, access to the decisions of procurement committees online from any geographic location in the world. This will reduce the cost of bidding on the part of venders which eventually help reduce the cost of goods and services to the government.

Registration of Procuring Entities

With the introduction of the e-GP system (PROMISe), the Procurement Entities (PEs) are able to publish their Bid Notices, EOIs, Bid Documents and RFPs online. Additionally, using the e-GP system, PEs can provide clarifications and interpretation on any matter related to the bidding documents, conduct pre-bid meeting, receive bids as well as evaluation of bids and publish the final procurement decisions and awards online.

Types of procurements

Procurement of goods, services, works including procurement of infrastructure services through PPP method, information systems and consultancy services can be managed using the PROMISe. Goods ranging from basic office stationeries to motor vehicles and medical devices, work, from simple civil works to complex Plant or Infrastructure Procurement can be moved using PROMISe.

Standard Bidding Documents

Procuring Entities may use the Standing Bidding Documents (SBD) or adapted SBDs and prepare their own Bidding Documents with suitable amendments based on the SBDs prepared by the CIDA which are available on the PROMISe system. It is always advisable to use the SBDs to minimize ambiguities and needs for clarifications and subsequent amendments, which is one of the issues for unexpected delays in the procurement process.

Procurement of goods, services, and works including procurement of infrastructure services through PPP method, information systems and consultancy services can be handled using the PROMISe. Goods ranging from basic office stationeries to motor vehicles and medical devices.

The Promise.lk is capable to process any procurement. This includes procurements Goods, works and non-consulting services and consulting services. Procurement under single stage or two stages methods are capable to process under the system. It is also capable to manage bids either single envelop or two envelope system. Also procurements under shopping procedure, national and international bidding, direct procurement, request for expression of interest (EOI) and request for proposals (RFP) for consultants recruitments and request for qualification documents (RFQ) or to issue RFP for shortlisted companies to procure any contract under PPP method are well included in the system.

The system is also capable to manage to, from the stage of contract award to contract completion, using standard conditions of contracts based on FIDIC conditions of contracts. It possible to login to the User Guide in the internet as shown below.



Procurement guidelines and manuals are also available in the system and it is so user friendly.


Promise
promise.lk//?p=front_cont&a=guideline
Home
CPV Codes
Publications
Procurement Announcements
User Guides
eMarket
Registration
Login
PROMISe
Procurement Guidelines & Manuals
Home > Procurement Guidelines
Procurement Guidelines 2006 Goods and Works
Procurement Manual 2006
Guide to project management & contract management for infrastructure development projects (Works)
Selection & Employment Of Consultants
Consulting services manual- November 2007
Guidelines on Private Sector Infrastructure Projects (Government Tender Procedure - Part II)
Guidelines for procurement of pharmaceuticals and medical devices-2006
Bidder's guide to success in public procurement archive of NPA publications
HOT LINE
e-GP Secretariat
Contact Us
6:25 PM
1/6/2022

CPV Codes

The Common Procurement Vocabulary (CPV) consists of a main vocabulary for defining the subject of a contract, and a supplementary vocabulary for adding further qualitative information. The main vocabulary is based on a tree structure comprising codes of up to 9 digits (an 8 digit code plus a check digit) associated with a wording that describes the type of supplies, works or services forming the subject of the contract.

The CPV consists of a main vocabulary and a supplementary vocabulary. The main vocabulary is based on a tree structure comprising codes of up to nine digits associated with a wording that describes the supplies, works or services forming the subject of the contract. The supplementary vocabulary may be used to expand the description of the subject of a contract. The items are made up of an alphanumeric code with a corresponding wording allowing further details to be added regarding the specific nature or destination of the goods to be purchased. Additionally, for the purpose of PROMISe, some standard CPV Codes have been customized.

Any information can be obtained from the following address.

e-GP Secretariat

General Treasury
Ministry of Finance,
2nd Floor, New Building,
The Secretariat,
Colombo-01, Sri Lanka.

I write this article to direct you to use the e-procurement system for procurements and also to educate you on the subject to enable you to use this knowledge in conducting procurement audits where e-procurement had been applied.

Indika Samantha

Superintendent of Audit (AGS)

රාජ්‍ය ආයතනයක, වැඩසටහනක, ව්‍යාපෘතියක හා වියදම් ඒකකයක තෝරාගත් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ආර්ථිකබව, කාර්යක්ෂමබව, ඵලදායීබව හා පාරිසරික බලපෑම ද ඇගයීමට ලක්කර අදාළ විගණන නිරීක්ෂණ අනුව සිදු කළ යුතු වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් නිර්දේශයන් ඇතුළත්ව වාර්තා කිරීම කාර්යසාධන විගණනය මගින් සිදු කරනු ලැබේ.

රාජ්‍ය ආයතනවල විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් හා විගණන ශාඛාවලින් ඉදිරිපත් කරනු ලබන යෝජනා තෝරා ගෙන එමගින් ඇති කරන ආර්ථික, සාමාජයීය හා පාරිසරික බලපෑම් ඔස්සේ කාර්යසාධන හා පරිසර විගණනයන් සිදු කරනු ලැබේ. කාර්යසාධන හා පරිසර විගණන වාර්තාවන් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. එසේම මෙම ක්ෂේත්‍රයට අදාළ ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් පුහුණු කිරීම ද සිදු කරනු ලැබේ.

කාර්යසාධන විගණනය ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යඵල පදනම් කරගත් අයවැය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හා එක් එක් ආයතනය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක නිශ්චය කිරීම ඉතා වැදගත් වේ. නමුත් ශ්‍රී ලංකාවේ දැනට කාර්යඵලය පදනම් කරගත් අයවැය ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර කාර්යසාධන දර්ශක ප්‍රමාණවත් පරිදි නොමැති වීම තුළ නිශ්චය කර කාර්යඵල මැනීමක් සිදු නොකෙරේ.මේ හේතුවෙන් එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළව කාර්යසාධන දර්ශක අප විසින් නිශ්චය කර කාර්යසාධන විගණනය ක්‍රියාත්මක කරනු ලබයි.

<u>කාර්යසාධන විගණන තාර්කික සැලැස්ම</u>



ආර්. සී. තෙන්නකෝන්
විගණන අධිකාරි
කාර්යසාධන විගණන අංශය

ප්‍රගතිය

SUMMARY OF TAX PROPOSAL OF BUDGET 2022

The Budget for 2022 mainly focused on collection of tax revenue and rationalising of Government Expenditure. As a short-term measure to increase the tax revenue, many proposals were put forward, such as to implement one-time taxes in the form of Surcharge Tax together with other tax reforms to strengthen the Government tax revenue in the long run. Following are the key tax changes proposed by the Budget 2022.

- **One-time taxes**

  - A one-time tax surcharge of 25 percent is proposed to be imposed on persons or companies with taxable income over Rupees 2,000 million for the year of assessment 2020/2021. **Rupees 100 billion is expected to be earned through this tax.**

  - VAT on banks and financial service providers under supply of financial services by specified institutions is proposed to be increased to 18 percent from 15 percent. This tax should be paid monthly from 01 January 2022 to 31 December 2022. Furthermore, this tax should not be shifted to the customer. Rupees 14 billion is expected to be earned through this tax.

- **New Exemption from the Value Added Tax when supply or import of;**

  - Medical equipment
  - Machinery
  - Apparatus
  - Accessories and parts thereof
  - Hospital furniture
  - Drugs and chemicals

Provided that above items to be donated to a Govt Hospital or the Ministry of Health for the provision of health services to address any pandemic or public health emergency, and approved by the Minister of Finance on the recommendation of the secretary to the ministry of the Minister assigned with the subject of health. **Effective date 1, January 2022.**

- **Social Security Contribution**

A new tax on turnover aiming to rebuild Sri Lanka economy affected by the Covid pandemic was proposed and the tax rate is 2.5% on the annual threshold turnover

exceeding LKR 120M. This will be effective from 1 April 2022. **It is expected to raise Rs 140 billion.**

- **Implementation of Special Goods and Services Tax**

A new tax termed Special Goods and Services tax ("SGST") is proposed to be implemented with effect from January 2022 to cover all goods and services that will be specified in the proposed legislation.

SGST may cover certain taxes and levies currently monitored under various fiscal laws and administered by various statutory institutions. The scope of this tax was not yet finalized, however at present following taxes were being charged in different industries.

Industry	**Current Tax**
Alcohol	VAT at 8% Excise Duty
	(Various Duty rates applicable for specific items)
Cigarettes	VAT at 8% Excise Duty
	(Various Duty rates applicable for specific items)
Telecom	VAT at 8% Excise Duty
	(Various Duty rates applicable for specific items)
Betting & Gaming	VAT at 8% or Levy on Gross Collection at 10% Annual Levy
Motor Vehicle	Excise Duty
	(Various Duty rates applicable for specific items)

- Tax Administration

  - **Strengthening Large Tax Payer's Unit**

It is proposed to further strengthen the Large Tax Payers Unit (LTU) and Upper Corporate Unit (UCU) and to improve revenue collection from large tax payers.

  - **Improve Digital Revenue Collection systems**

it is proposed to remove weaknesses in the digital revenue collection systems of the revenue collection bodies; Revenue Administration Management Information System (RAMIS) of the Department of Inland Revenue and Single Window System of the Sri Lanka Customs.

- Proposed to expedite the implementation of the digital revenue collection system of the Excise Department and simplify the excise licensing process.

- Also proposed to introduce a mechanism to examine the accuracy of the tax documents when filing through the above systems, and allow, at every possibility, to present digital invoices and documents as valid documents.

M. D. I. J. Silva

Superintendent of Audit (PUR/D)

ව්‍යාපෘති කළමනාකරණයේදී ක්‍රමෝපායන් භාවිත කිරීම : සාහිත්‍ය විමර්ශනයකි

Practicing techniques in project management: a literature review

සාරාංශය

වර්තමාන තරඟකාරී සමාජය අභිමුවේ කවරාකාර ආයතනයක හෝ සංවිධානයක පැවැත්ම රඳා පවතින්නේ නිසි කළමනාකාරීත්වය හේතුවෙනි. එහිදී ආයතනයක් ස්වකීය අරමුණු සාධනය උදෙසා විවිධාකාර වූ උපායමාර්ග යොදා ගන්නා අතර ඒ සඳහා නොයෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි. ව්‍යාපෘති කළමනාකරණයේදී ව්‍යාපෘතියක් සාර්ථකව අවසන් කිරීමට විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු පිළිබඳව මෙහිදී විමර්ශනය කරන ලදී. ව්‍යාපෘති කළමනාකරණය කළමනාකරණ විෂයෙහි ප්‍රධාන අනුමාතෘකාවකි. පශ්චාත් උපාධි පාඨමාලා හදාරණ විද්‍යාර්ථීන්ට දැනුම ලබාදෙන ව්‍යාපෘති කළමනාකරණය විෂය යටතේ ලියැවුනු සිංහල පොතපත සුලබ නොවන බැවින් ඔවුන්ට ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමෝපායන් භාවිත කිරීම පිළිබඳ මූලික අවබෝධයක් ලබාදීමේ පරමාර්ථයෙන් මෙම සාහිත්‍ය විමර්ශනය සිදුකරන ලදී. දත්ත එක්රැස් කිරීමේ ක්‍රමශිල්ප වශයෙන් විෂයට අදාල ලිඛිත මූලාශ්‍ර, හා ද්විතීක දත්ත උපයෝගී කරගනු ලැබීය.

මූලික පද

උපායමාර්ගික කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, ශදූඅත විග්‍රහය, ව්‍යාපෘති සැලසුම් කිරීම, ව්‍යාපාර තර්කය

Abstract

The sustainability of any institution or organization in the current society depends on the proper management. In this context, different strategies are used by the institutions in order to implement their projects and achieve their organizational objectives. A Specific reference is made here on the components on projects management in order to implement a project successfully. Project management is a major part of the management process. Due to lack of reading materials in Sinhala language this literature review has been done through written sources and secondary data in order to give the scholars basic knowledge.

Key Words

Strategic Management, Project Management, SWOT Analysis, Project Planning, Business Case

හැඳින්වීම

උපායමාර්ගික කළමනාකරණයේදී ඊට අදාලව කුසලතා, තාක්ෂණය හා ක්‍රමවේදයන් අවශ්‍ය වේ. උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේලා එක් වැදගත් සාධකයක් වනුයේ ආයතනය සතුව ක්‍රම සහ විධි පැවතීමයි. මේ අනුව ආයතනයේ ව්‍යුහය, සේවක සම්බන්ධතා යනාදිය සකස් වේ. මෙහිදී නීති රීති හා රෙගුලාසි සේම ආයතනික සංස්කෘතිය හා ආචාර ධර්ම පද්ධතියද බෙහෙවින් වැදගත් වේ. ආයතනයේ දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා උපායමාර්ග සකස් කරගනු ලබන අතර තමන්ගේ අරමුණු සහ ඉලක්ක කරා ළඟා වීමට ආයතන විසින් විවිධ ව්‍යාපෘති දියත් කරනු ලැබේ.

අධ්‍යයනයේ අරමුණු

ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමෝපායන් හඳුනාගැනීම

ක්‍රමෝපායන් තීරණය කිරීම සඳහා සලකා බැලෙන සාධක හා නිර්ණායක අධ්‍යයනය කිරීම

සාර්ථක හා ඵලදායී ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය උපායමාර්ගික සැලසුම් විශ්ලේෂණය කිරීම

අධ්‍යයනයේ වැදගත්කම

මෙම අධ්‍යයනයෙන් ඕනෑම පුද්ගලයෙක්, ආයතනයක් හෝ සංවිධානයක් ව්‍යාපෘති කළමනාකරණයේදී භාවිත කරන ක්‍රමෝපායන් පැහැදිලිව අවබෝධ කර ගත හැකිය. එසේම ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන්ට ගතානුගතික නොවූ නිර්මාණශීලී ව්‍යාපෘතියක් සාර්ථකව නිමකිරීමට අවශ්‍ය වන්නා වූ සැලසුම් සකස් කළ යුතු ආකාරය පිළිබඳ මූලික අවබෝධයක් ලබා දේ.

උපායමාර්ගික කළමනාකරණය(Strategic Management)

ඕනෑම ආයතනයක් ස්වකීය දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා උපායමාර්ග සකස් කළ යුතු අතර. ඒ සඳහා පහසු ඉලක්ක ගොඩනගා ගතයුතු වේ. මේ සියල්ල කිරීමට සිදුව ඇත්තේ වෙනස්වන සමාජ, ආර්ථික, දේශපාලනික හා තාක්ෂණික පසුබිමකය. එසේම වෙනත් තරඟකරුවන්ගෙන් බලපෑම් එල්ල වෙමින් තිබෙන පසුබිමකය. කාලයක් තිස්සේ ආයතනය ගොඩනගා ගෙන ඇති අභ්‍යන්තරික ශක්තීන් මේ සඳහා උදවු විය හැකි වුවද ඊට සමාන්තරව ගොඩ නැගී ඇති දුර්වලතා මීට එරෙහි විය හැකිය. ඒ නිසා දැක්මක් ඇති කර ගැනීම ප්‍රමාණවත් නොවේ. ඒ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ඉලක්ක ගොඩනගා ගැනීමත් ඒ ඉලක්ක ළඟාකර ගැනීම සඳහා පවතින පරිසරය හා ආයතනික ශක්තීන් හා දුර්වලතා සැලකිල්ලට ගනිමින් උපායමාර්ග සකස් කර ගැනීමත් වැදගත්ය.



1 රූප සටහන

ආයතනය සාර්ථකව මෙහෙයවමින් ඉලක්ක ළඟාකර ගැනීම සඳහා මනා උපායමාර්ගික කළමනාකරණයක් අවශ්‍යවීමට පහත හේතු සාධක බලපායි.

- ❖ සම්පත් සීමා සහිත වීම.
- ❖ ව්‍යාපාර ආයතන අතර ඇති තියුණු තරඟය.
- ❖ ව්‍යාපාරික පරිසරයේ දැඩි විචලනකාරී ස්වරූපය.
- ❖ නිෂ්පාදිතයන්ගේ ගුණත්වය සම්බන්ධයෙන් දක්වන ඉහල උනන්දුව.

උපාය මාර්ගික මට්ටම් - Levels of strategies

- ★ ආයතනික උපායමාර්ග - Corporate strategies
- ★ ව්‍යාපාරික උපායමාර්ග - Business strategies
- ★ ප්‍රායෝගික උපායමාර්ග - Functional strategies

මේ උපායමාර්ග තීරණය කිරීම සඳහා සලකා බැලෙන සාධක විශ්ලේෂණය කිරීම කළමනාකරණයේ විශේෂ නමකින් හැඳින්වේ. ඒ SWOT විශ්ලේෂණය ලෙසය.

ශදුඅත විග්‍රහය - SWOT Analysis

මෙය සංවර්ධන ව්‍යාපෘතියක හෝ වාණිජ ව්‍යාපාරයක ශක්තීන් (Strength), දුර්වලතා (Weaknesses), අවස්ථා (Opportunities) හා තර්ජන (Threats) හඳුනාගැනීම සඳහා භාවිතා කරන සැලසුම් මෙවලමකි. මෙම විග්‍රහය උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලියේදී නිතර භාවිතා කරන්නකි. මෙහි ශක්තීන් හා දුර්වලතා අභ්‍යන්තර සාධක (Internal Factors) වන අතර අවස්ථා හා තර්ජන බාහිර සාධක (External Factors) ලෙස සැලකේ.

ශදුඅත න්‍යාසය - TRICXME OVERVIEW SWOT

	උපකාරී Helpful	හානිකර Harmful
අභ්‍යන්තර හේතු සාධක Internal Factors	ශක්තීන් Strengths	දුර්වලතා Weaknesses
බාහිර හේතු සාධක External Factors	අවස්ථා Opportunities	තර්ජන Threats

1 වගුව

ශඳුඅත විග්‍රහය නම්‍යශීලී සංකල්පයක් වන අතර සූක්ෂම කළමනාකරණ මෙවලමකි. එසේම සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදාගත හැකිය. ආයතනය සම්බන්ධයෙන් මෙම විග්‍රහයට නිදසුන් මෙසේය.

ශක්තීන් - Strengths

* ආයතනය සතු වාණිජ කුසලතාවය
* සේවා සහ නව ඉදිරිපත්කිරීම්වලට ඇති හැකියාව
* ආයතනයේ පිහිටීම
* නිෂ්පාදනවල ඉහළ ගුණාත්මකභාවය
* නිෂ්පාදන හා සේවා අගය වර්ධනය කරන වෙනත් කරුණු

අවස්ථා - Opportunities

* දියුණු වෙළඳපොළක් පැවතීම
* සමූහ වාණිජ ව්‍යාපාර සඳහා ඉඩ ප්‍රස්ථා තිබීම
* නව වෙළඳපොළ අවස්ථා පැවතීම
* ජාත්‍යන්තර වෙළඳපොළට අවතීර්ණ වීමට ඇති හැකියාව

තර්ජන - Threats

* වෙළඳපොළට නව තරඟකරුවන්ගේ ප්‍රවිෂ්ටය
* මිල මට්ටම් සඳහා තරඟකරුවන් අතර පවත්නා තරඟකාරී බව
* තරඟකරුවන් විසින් නව නිෂ්පාදන හා සේවා වෙළඳ පොළට ප්‍රවිෂ්ට කිරීම
* තරඟකරුවන් සතුව සුපිරි බෙදාහැරීම් ජාලයක් පැවතීම
* නිෂ්පාදන හා සේවා සඳහා නව බදු ව්‍යුහයක් පැවතීම

දුර්වලතා - Weaknesses

* වාණිජ කුසලතාවය දුබල වීම
* තරඟකාරී වෙළඳ පොළ තුළ නිෂ්පාදන හා සේවාවල අනන්‍යතාවක් නොමැති වීම
* ආයතනයේ පිහිටීමේ අයෝග්‍ය බව
* නිෂ්පාදන හා සේවාවල ගුණාත්මක බව අඩුවීම
* ආයතනයේ කීර්තිනාමයට හානිදායක වීම

ශඳුඅත විග්‍රහය ආයතනයේ ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විග්‍රහ කිරීම සඳහා සරල හා කාර්යක්ෂම සැලසුම් රාමුවක් සපයන අතර දුර්වලතා හා තර්ජන අවම කරගනිමින් ශක්තීන් හා අවස්ථාවන්ගෙන් උපරිම ඵල නෙලා ගැනීමට ඉඩ ලබා දේ.

ව්‍යාපෘති සංකල්පය - Project Concept

ව්‍යාපෘතියක් යනු විශේෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කිසියම් සංවිධානයක් සම්පත් උපයෝජනය හා කළමනාකරණය තුළින් ඒකිනෙකට සම්බන්ධ වූ ක්‍රියාකාරකම් මගින් සිදු කරන්නකි. මෙය ආයතනයේ අරමුණු කරා ළඟා වීමට යොදාගන්නා යානයක් ලෙස හැඳින්විය හැකිය.

ව්‍යාපෘතියක විශේෂ ලක්ෂණ - Characteristics of a Project

- විශේෂිත අරමුණු හා ඉලක්ක මැනවින් හඳුනාගැනීම
- ආරම්භය හා අවසානය ඇතුළත් කාල රාමුවක් තිබීම
- එකිනෙකට සම්බන්ධ වූ ක්‍රියාකාරකම්, අභිප්‍රායන් තිබීම
- විශේෂිත අයවැයක් තිබීම
- විශේෂිත භූගෝලීය ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මක වීම

ව්‍යාපෘති චක්‍රය - Project Cycle

සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් ලෙස අනුගමනය කළයුතු පියවරයන් සහිතව ව්‍යාපෘති චක්‍ර හඳුන්වා දී තිබේ. ශ්‍රී ලංකාවේ බොහෝ සැලසුම් ආයතන විසින් භාවිතා කරන්නේ බාවුම්ගේ ලෝක බැංකු ව්‍යාපෘති චක්‍රයයි. එය පියවර 7කින් සමන්විතය.

1. හඳුනා ගැනීම - Identification
2. සකස් කිරීම - Preparation
   I පූර්ව ශක්‍යතා අධ්‍යයනය - Pre-Feasibility Study
   II ශක්‍යතා අධ්‍යයනය - Feasibility Study
   III සවිස්තරාත්මක සකස් කිරීම - Detailed Design
3. තක්සේරු කිරීම - Appraisal
4. සාකච්ඡා කිරීම හා මණ්ඩල අනුමැතිය - Negotiation & Board Approval
5. ක්‍රියාත්මක කිරීම - Implementation
6. ව්‍යාපෘති නිමාව - Project Completion
7. පශ්චාත් ඇගයීම - Ex-Post Evaluation



2 රූපසටහන

ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන - Project Feasibility Studies

ශක්‍යතා අධ්‍යයන සිදු කරනු ලබන්නේ ව්‍යාපෘතියේ සියලු අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ව්‍යාපෘතියේ සමස්ත ශක්‍යතාව තීරණය කිරීම සඳහාය. ශක්‍යතා අධ්‍යයනයේදී පහත සඳහන් විග්‍රහයන් සිදු කරනු ලැබේ.

- ★ වාණිජ ශක්‍යතාව - Commercial Feasibility

කිසියම් සේවාවක හෝ නිෂ්පාදනයක ඉල්ලුම හෝ වෙළඳපොළ පිළිබඳ ශක්‍යතාවය විමසීම වාණිජ ශක්‍යතාවය මගින් සිදු කෙරේ.

- ★ කාර්මික ශක්‍යතාව - Technical Feasibility

මෙහිදී ව්‍යාපෘතිය කාර්මික හා තාක්ෂණික වශයෙන් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව විමසා බලයි.

- ★ මූල්‍ය ශක්‍යතාව - Financial Feasibility

ආදායම හා වියදම පිළිබඳ විග්‍රහයක් මූල්‍ය ශක්‍යතා අධ්‍යයනයේදී සිදු කෙරේ.

- ★ ආර්ථික ශක්‍යතාව - Economic Feasibility

ආර්ථික විග්‍රහයේදී සිදු කරනු ලබන්නේ ව්‍යාපෘතිය මගින් ආර්ථිකයට ඇති කරන නිශ්චිත බලපෑම තක්සේරු කිරීමයි.

- ★ ආයතනික ශක්‍යතාව - Institutional Feasibility

ව්‍යාපෘතියක් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික ව්‍යුහය ශක්තිමත්ව පැවතිය යුතුය. මනා කළමනාකරණය හා ව්‍යාපෘති පාර්ශවකරුවන්ගේ පූර්ණ දායකත්වය මෙහිදී වැදගත් වේ.

- ★ පාරිසරික ශක්‍යතාව - Environmental Feasibility

සියලුම ව්‍යාපෘති පාරිසරික ශක්‍යතාවයෙන් යුක්ත විය යුතුය. මක් නිසාද යත් පරිසරයට හානියක් සිදු වුවහොත් එයට නැවත පිළියම් යෙදීම අසීරු කාර්යයක් වන බැවිනි.

අවිනිශ්චිතතාව පිළිබඳ විග්‍රහය - Uncertainty Analysis

අනාගත ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රක්ෂේපණය කිරීමට කාල රාමුව, නිමැවුම, මිල මට්ට, වියදම යන උපකල්පනයන් යොදා ගැනේ. අනාගතය වූ කලී බෙහෙවින් අවිනිශ්චිතය. ව්‍යාපෘතිය හා බැඳුණු අවිනිශ්චිතතාවය ඇගයීමෙන් අනාගතයේදී සිදුවිය හැක් අයහපත් ප්‍රතිඵල අවම කර ගත හැකිය. මේ සඳහා පහත ක්‍රම අනුගමනය කළ හැක.

I. සමුච්ඡේදන ලක්ෂ්‍යය විග්‍රහය - Break-even Analysis

II. සංවේදීතා විග්‍රහය - Sensitivity Analysis

III. අවදානම් විග්‍රහය - Risk Analysis

සමාජ/දේශපාලන විග්‍රහය - Social/Political Analysis

ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයනයේදී සමාජ/දේශපාලන විග්‍රහය සිදු කරනු ලබන්නේ කලාතුරකිනි. ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් නොවී ව්‍යාපෘති අසාර්ථකවීම කෙරෙහි සමාජ/දේශපාලන සාධක

හේතු වේ. එබැවින් මෙහිදී සමාජ/දේශපාලන අධ්‍යයනයක් සිදු කළ යුතුය. සමාජ, ආර්ථික හා දේශපාලනික දත්ත එක්රැස් කිරීම මෙහිදී වැදගත් වේ.

ව්‍යාපෘති හඳුනාගැනීම - Project Identification

ව්‍යාපෘතියක් සැලසුම් කළ හැක්කේ සුදුසු සංවර්ධන ව්‍යාපෘතියක් හඳුනාගැනීමෙනි. මෙහිදී මූලිකව සිදු කළ යුත්තේ ව්‍යාපෘතියක අවශ්‍යතාව අධ්‍යයනය කිරීමයි.නමුත් අවශ්‍යතාව තිබූ පමණින්ම ව්‍යාපෘතියක් ආරම්භ කළ නොහැක. ඒ සඳහා සම්පත් තිබිය යුතුය. එබැවින් ව්‍යාපෘතියක් ආරම්භ වන්නේ අවශ්‍යතා පදනම(Need Base) හා සම්පත් පදනම(Resource Base) සලකා බැලීම තුළිනි.

ව්‍යාපෘති හඳුනාගැනීමේ ක්‍රියාවලිය - Process of Project Identifications

- පවතින ක්‍රමය ඇගයීම - Evaluation of the present system
- අදාළ ප්‍රතිපත්තිමය ප්‍රශ්න හඳුනා ගැනීම - Identification of relevant policy issues
- ව්‍යාපෘති තාර්කික බව - Establishing the project rationale
- ව්‍යාපෘතියේ සංකල්පය හා රාමුව ගොඩනැගීම - Developing the project design and concept
- ව්‍යාපෘතියේ පරිමාණ සැකසීම - Setting the project's scaleප්‍රාථමික පිරිවැය ඇස්තමේන්තු සහ ප්‍රතිලාභ සකස් කිරීම - Preparing preliminary cost estimates and benefits
- සංවිධාන හා කළමනාකරණ ව්‍යුහය යෝජනා කිරීම - Proposing the organization and management structure

ව්‍යාපෘති වර්ගීකරණය - Classification of Project

ව්‍යාපෘතීන්හි පරිමාව අනුව සංවර්ධන ව්‍යාපෘති පහත සඳහන් ලෙස වර්ගීකරණය කෙරේ.

1. ක්ෂුද්‍ර ව්‍යාපෘති - Micro Projects
2. කුඩා ව්‍යාපෘති - Small Projects
3. මධ්‍ය පරිමාණ ව්‍යාපෘති - Medium Projects
4. විශාල ව්‍යාපෘති - Large Projects
5. අති විශාල ව්‍යාපෘති - Mega Projects

යෝග්‍ය ව්‍යාපෘති තොරාගැනීමේ නිර්ණායක - Criteria for selecting viable projects

- අදාළත්වය - Relevance
- ශක්‍යතාවය - Feasibility
- පවත්නා සමරූපී වැඩසටහන් සමඟ ඒකාබද්ධ කිරීමේ හැකියාව - Integration with similar existing programmes
- බලපෑම - Effectiveness

දත්ත සහ තොරතුරු රැස් කිරීම හා විග්‍රහ කිරීම - Collection and analysis of data and information

දත්ත සහ තොරතුරු වැදගත් වන්නේ පවත්නා සංවර්ධන ගැටළු සහ අවශ්‍යතා හඳුනා ගැනීමටත්, ව්‍යාපෘති මෙහෙයුම්කරණය හා ඇගයීමත් සඳහාය. දත්ත සහ තොරතුරු ප්‍රාථමික දත්ත(Primary Data) සහ ද්විතීක දත්ත(Secondary Data) යනුවෙන් කොටස් දෙකකට බෙදේ. ප්‍රාථමික දත්ත යනු අප විසින් ක්ෂේත්‍රයට ගොස් සමීක්ෂණ හා නිරීක්ෂණ මගින් එකතු කර ගන්නා දත්ත සහ තොරතුරුය.

උදාහරණ :- ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, සමීක්ෂණ

ද්විතීක දත්ත යනු ඒ ඒ ආයතන විසින් ස්වකීය අවශ්‍යතා සඳහා සකස් කර ඇති වාර්තා, පොත්පත්, ලිපි, සිතියම් වැනි තොරතුරු සංග්‍රහයන්ය.

උදාහරණ :- කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා, චක්‍ර ලේඛ

මෙලෙස ලබා ගන්නා තොරතුරු ඇසුරින් දත්ත විශ්ලේෂණය(Analysis of Data) සිදු කරනු ලැබේ. දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව එම තොරතුරු මත සමීක්ෂණ වාර්තාවක් සකස් කෙරෙන අතර සම්පත් පැතිකඩක්(Resource Profile) සකස් කිරීමද මෙහිදී වැදගත් වේ.

ව්‍යාපෘති සැලසුම් කිරීම - Project Formulation

ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී පහත සඳහන් විශ්ලේෂණයන් උපයෝගී කර ගත හැක.

ගැටලු විග්‍රහය - Problem Analysis

ගැටලු ගස විග්‍රහයේ (problem Tree Analysis) අරමුණ වන්නේ පවත්නා ගැටලු ස්වභාවය මත පවත්නා තත්ත්වය විග්‍රහ කිරීමත් , මූලික ගැටලු හඳුනා ගැනීමත්, ගැටලු අතරින් ප්‍රධාන ගැටලුව විග්‍රහ කරගැනීමත්, හේතු සිධක සහ බලපෑම අතර ඇති සම්බන්ධතාවය හඳුනා ගැනීමත්ය.

අරමුණු විග්‍රහය - Analysis of Objectives

අරමුණු වූ කලී ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත එනම් සාක්ෂාත් කිරීම බලාපොරොත්තු වන අවසන් ප්‍රතිඵල ලෙස හැඳින්විය හැකිය.

ව්‍යාපාර තර්කය - Business Case

ව්‍යාපාර තර්කය යනු දියත් කිරීමට යන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මතභේදයට තුඩු දිය හැකි කරුණු පිළිබඳව කරනුලබන තාර්කික, අරමුණු ගත, විස්තරාත්මක විශ්ලේෂණයකි. මෙය සැකසීමේදී ව්‍යාපෘතියට අදාල වාසි සහ අවාසි සහගත සාධක සමතුලිත අයුරින් තක්සේරු කොට මතුවිය හැකි ගැටළු සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණයක් සිදු කරනු ලැබේ. මෙම විශ්ලේෂණයෙහි මූලික අභිප්‍රාය වනුයේ ව්‍යාපෘතිය පිළිබඳව තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහයෝගය දැක්වීමයි. එනම් ව්‍යාපෘතිය සඳහා කාලය හා සම්පත් ආයෝජනය කිරීම මගින් ප්‍රමාණවත් ප්‍රයෝජන ලබාගත හැකිද යන්න තීරණය කිරීමට සහාය ලබා දීමයි.

ව්‍යාපාර තර්කය මගින් විනිවිද භාවයෙන් යුතු සාධාරණීයකරණය කළහැකි නිර්දේශ ඉදිරිපත් කරයි.

ව්‍යාපාර තර්කය සඳහා ආකෘතිය

- ➢ විධායක සාරාංශය(Executive Summary)

මෙහිදී සමස්ත ව්‍යාපාර තර්කය පිළිබඳව ප්‍රධාන කරුණු සාරාංශ ගත කිරීමක් සිදු කෙරේ. කියවන්නාට ලියවිල්ලේ ඉතුරු කොටස් ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් තොරතුරු සාරාංශයෙහි අඩංගු විය යුතුය.

- ➢ මූලික කාර්ය දර්ශක(Key Performance Indicators)

ව්‍යාපෘතිය අවසානයේදී ව්‍යාපෘති නිමැවුම් තක්සේරු කිරීම සඳහා භාවිතා කරන මිණුම් දණ්ඩක් ලෙස ව්‍යාපෘති කාර්ය දර්ශක සැලකේ. දර්ශක ප්‍රමාණාත්මක දත්ත (Quantity Data) එනම් සංඛ්‍යාව, ප්‍රතිශතය, අනුපාතය ලෙසින් සහ ගුණාත්මක දත්ත (Quality Data) එනම් තොරතුරු හා දැනුම ලෙසින් දැක්වේ. මෙහෙයුම්කරණ සහ ඇගයීම් ක්‍රියාවලියේදී දර්ශක අත්‍යවශ්‍ය සැලසුම් මෙවලමකි. දර්ශක වර්ග කිහිපයක් වේ.

1 ක්‍රියාවලි දර්ශක - Process Indicators - මෙමගින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් මැන බැලේ

2 ප්‍රතිඵල දර්ශක - Outcome Indicators - ප්‍රතිඵල දර්ශක තුළින් ව්‍යාපෘතිය විසින් ජනිත කල ප්‍රතිඵල මැන බැලීම සිදු කෙරේ

3. බලපෑම් දර්ශක - Impact Indicators - මෙමගින් ව්‍යාපෘතියේ දිගුකාලීන බලපෑම මැන බැලීම සිදු කෙරේ

ව්‍යාපෘති දර්ශකයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු

- ✓ සංක්ෂිප්ත විය යුතුයි
- ✓ මැනවින් නිර්වචනය කළ හැකි විය යුතුයි
- ✓ විශ්වසනීය විය යුතුයි
- ✓ වලංගුභාවය තිබිය යුතුයි
- ✓ මැනිය හැකි විය යුතුයි

දර්ශකය නිවැරදිව සකස් කර ගැනීම සඳහා SMART සංකල්පය යොදා ගත හැකිය.

(Specific, Measurable, Attainable, Relevant, Tractable)

- ➢ **පාර්ශවකරුවන් හඳුනාගැනීම(Stakeholder Identification)**

පාර්ශවකරුවන් යනු මෙම ව්‍යාපෘතියට සක්‍රියව දායක වන හෝ එහි අවසාන නිමවුමෙන් ධනාත්මක හෝ ඍණාත්මක බලපෑමකට ලක්වන පුද්ගලයින් හා සංවිධාන වේ. ඔවුන්ට විවිධ ආකාරයෙන් ව්‍යාපෘතියට බලපෑම් කල හැකිය. මෙම පාර්ශවකරුවන් අභ්‍යන්තර(Internal) සහ බාහිර(External) යනුවෙන් කොටස් දෙකකට බෙදේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන්, වෘත්තීය සමිති නායකයින්, ව්‍යාපෘතියේ කණ්ඩායම් සාමාජිකයින් අභ්‍යන්තර පාර්ශවකරුවන් වන අතර අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාව සේම ඔවුන් සේවයේ නියුතු ආයතන හා සමාගම් බාහිර පාර්ශවකරුවන් ලෙස මෙහිදී හඳුනාගත හැක.

ව්‍යාපෘති කළමණාකරු විසින් ව්‍යාපෘතියේ අභ්‍යන්තර සහ බාහිර පාර්ශවකරුවන් හඳුනාගෙන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඔවුන්ගේ අවශ්‍යතාවන් සහ අපේක්ෂාවන් හඳුනාගත යුතුය.

පාර්ශවකරුවන් විශ්ලේෂණයේදී කොටස් තුනකට බෙදා දැක්විය හැකිය.

* ප්‍රධාන පාර්ශවකරුවන්(Key Stakeholders)

ව්‍යාපෘතියට විශාල බලපෑමක් සිදුකරන පාර්ශව

* ප්‍රාථමික පාර්ශවකරුවන්(Primary Stakeholders)

වාසි සහගත හෝ අවාසි සහගත බලපෑමකට ලක්වන පාර්ශව

* ද්විතීය පාර්ශවකරුවන්(Secondary Stakeholders)

ඉහත ගණයට නොවැටෙන අනෙකුත් සියලු පුද්ගලයින් සහ ආයතන

ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට සියලුම පාර්ශවකරුවන්ගේ බලපෑම් මනා ලෙස කළමණාකරණය කිරීම වැදගත් වේ. මෙහිදී ධනාත්මක පාර්ශවකරුවන්ගේ සහාය වැඩි කිරීමටත් ඍණාත්මක පාර්ශවකරුවන්ගේ ප්‍රතිරෝධ අවම කිරීමටත් අවශ්‍ය උපාය ක්‍රම සැලසුම් කරමින් සියලුදෙනාගේ අවශ්‍යතාවයන් හැකිතාක් දුරට සැපිරීමෙන් ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට හැකියාව ලැබේ.

- ව්‍යපෘතියේ අරමුණු (Project Objectives)

ව්‍යාපෘතිය සකස් කිරීමේදී හොඳ අරමුණක් සකස් කර ගැනීම මුලික කාර්යයයි. ඒ සඳහා අරමුණු ගස විග්‍රහයෙන් හඳුනාගන්නා සමස්ත අරමුණ සහ විශේෂිත අරමුණු හැකිතාක් දුරට SMART මුලධර්මයට අනුව සකස් කිරීමෙන් එම අරමුණ නියමිත පරිදි සාක්ෂාත් කරගත හැකිය.

S – Specific

M – Measurable

A – Attainable

R – Realistic

Time Bound

මෙහිදී ව්‍යාපෘතියේ ප්‍රධාන අභිප්‍රායන් ඉතාම කෙටියෙන් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

- **පසුබිම (Background)**

ව්‍යාපෘතියේ ඉතිහාසය සහ එය ගොඩනැගුනු ආකාරය, ව්‍යාපෘති විෂය පථය, ක්‍රියාත්මක කරන කාලය හා ස්ථානය යනාදිය මෙහිදී කෙටියෙන් දැක්වේ.

- **අභියෝග (Challenges)**

ව්‍යාපෘතියට මුහුණ දීමට සිදුවන අභියෝග මොනවාද, කුමන කාලයක පැන නැගේ යැයි අපේක්ෂා කළ හැකිද, ඒ සම්බන්ධයෙන් දැරීමට සිදුවන පිරිවැය කොපමණද යනාදී කරුණු මේ යටතේ විස්තර කළ යුතුය. මෙම අභියෝගයන්ට මුහුණ දීම සඳහා ක්‍රියාත්මක කළ හැකි විකල්පයන් හඳුනා ගැනීමත් මේ යටතේ සිදු කරයි.

උදා :- ව්‍යාපෘතිය මාස 06කින් නිම කිරීමට උපදෙස් ලැබීම

➢ **ව්‍යාපෘති විෂය පථය (Scope of the project)**

ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී ප්‍රථමයෙන් එහි විෂය පථය නියම ආකාරයෙන් නිර්ණය කරගත යුතුය. විෂය පථය යනු ව්‍යාපෘතිය විසින් නිර්මාණය කරනු ලබන නිමැවුම සහ ව්‍යාපෘතියේ සීමාව තීරණය කිරීමය. ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමට අවශ්‍ය සියලුම කාර්යන් සහ වැඩ හඳුනාගැනීම මෙහිදී සිදු කෙරේ. ව්‍යාපෘති විෂය පථය සැලසුම්කරණයේදී එය අනු සැලසුම් 3ක් ආධාරයෙන් සිදු කෙරේ.

1. **අවශ්‍යතා හඳුනා ගැනීම**

ව්‍යාපෘතිය තුළින් ප්‍රතිලාභ ලබන පාර්ශවකරුවන්ගේ (කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාව) අවශ්‍යතාවන් සහ අපේක්ෂාවන් මොනවාද යන්න හඳුනා ගැනීම මෙහිදී සිදු කෙරේ. ඒ සඳහා පහත ක්‍රමවේද යොදා ගත හැකිය.

- ✓ සම්මුඛ සාකච්ඡා - Interviews
- ✓ ඉලක්ක ගත කණ්ඩායම් - Focus Group
- ✓ වැඩමුළු - Workshops
- ✓ බුද්ධි කලම්බනය Brainstorming
- ✓ නාමික කණ්ඩායම් ශිල්ප ක්‍රමය - Nominal Group Technique
- ✓ සමානතා රූපසටහන - Affinity Diagram
- ✓ අදහස් සිතියම්ගතකරණය - Mind Mapping
- ✓ කණ්ඩායම් තීරණ ගැනීමේ ක්‍රම - Group Decision Making
- ✓ ප්‍රශ්නාවලි හා සමීක්ෂණ - Questionnaires & Surveys
- ✓ නිරීක්ෂණ - Observation
- ✓ නිදර්ශන - Prototype

2. **විෂය පථය නිර්වචනය කිරීම**

ව්‍යාපෘතිය සහ නිශ්පාදිතය පිළිබඳව සවිස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීම මෙහිදී සිදු කෙරේ

3. **වැඩ විඛණ්ඩ ව්‍යුහය නිර්මාණය කිරීම**

ව්‍යාපෘතියේ වැඩ පහසුවෙන් පාලනය සහ ක්‍රියාත්මක කළ හැකි වන පරිදි කුඩා කොටස්වලට වෙන් කිරීම මෙහිදී සිදු කෙරේ.

➢ **පිරිවැය ඇස්තමේන්තුව (Cost estimation)**

ව්‍යාපෘතියේ ඒ ඒ ක්‍රියාකාරකම් සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය මෙහිදී සංක්ෂිප්තව ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපෘතියේ ප්‍රධාන අංශවලට අවශ්‍ය වියදම් දළ වශයෙන් මෙහිදී පෙන්නුම් කෙරේ. ව්‍යාපෘතිය ඉදිරියට පවත්වාගෙන යන විට පලමු අදියරේදී සිදු කළ පිරිවැය ඇස්තමේන්තු බොහෝ විට වෙනස් වේ. ඒ අනුව මෙය නැවත නැවත සිදු කළ යුතු පියවරකි.

➢ **පිරිවැය හා ප්‍රතිලාභ විශ්ලේෂණය (Cost - Benefit Analysis)**

ව්‍යාපාර තර්කය පිළියෙල කිරීමේදී පිරිවැය හා ප්‍රතිලාභ විශ්ලේෂණයකෙරෙහි මනා අවධානයක් යොමු කරමින් ක්‍රමවත්ව සිදු කළ යුතුය. මෙය දීර්ඝ බැවින් කොටස් කිහිපයකට බෙදා වෙන් කිරීම වඩාත් යෝග්‍ය වේ.

* **ආදායම්(ප්‍රතිලාභ) විශ්ලේෂණය - Revenue or Benefit Analysis**

ව්‍යාපෘතිය මගින් ඉපයිය හැකි වේ යැයි අපේක්ෂිත මුදල් ගැලීම් හෝ ආදායම් මෙහිදී ගණනය කරනු ලබයි. ගණනය කිරීම් සඳහා පදනම් කරගත් උපකල්පන හා ආදායම් ගණනය කිරීම උදෙසා දත්ත උකහා ගනු ලැබුවේ කෙසේද යන්න මෙහිදී පෙන්විය යුතුය.

* **පිරිවැය විශ්ලේෂණය - Cost Analysis**

ඉහත ආදායම් විශ්ලේෂණය සිදු කළ අයුරින්ම ව්‍යාපෘතියෙහි අපේක්ෂිත පිරිවැය තක්සේරු කිරීමක් මෙහිදී සිදු කෙරේ. තවද ව්‍යාපෘතිය නිමවූ පසු නිෂ්පාදන වැඩිදියුණු කිරීම උදෙසා වන වැය කිරීම්ද, පුනරාවර්තන විකුණුම් පිරිවැයද මෙයට ඇතුළත් කළ යුතුය.

* **ව්‍යාපෘති ඇගයීම - Project Evaluation**

ආදායම් හා පිරිවැය සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම තුලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රයෝජන සහිතද නැත්ද යන්න නිර්ණය කිරීම උදෙසා අවශ්‍ය තොරතුරු සැපයීම මෙහි මූලික අභිප්‍රාය වේ.

* **ආපසු අයකර ගැනීමේ කාලය - Pay Back Period**

මූලික ආයෝජනය ආවරණය කර ගැනීම උදෙසා වර්ෂ කීයක් අවශ්‍යද යන්න නිර්ණය කිරීම සඳහා භාවිත කළ හැකි සරලම ක්‍රමවේසය ලෙස මෙය හැඳින්විය හැකිය. මූලික ආයෝජනය (පිරිවැය) අපේක්ෂිත වාර්ෂික ආදායමෙන් බෙදීමෙන් ආයෝජනය ආපසු අයකර ගැනීම සඳහා අවශ්‍ය කාලය ගණනය කර ගත හැක.

* **අභ්‍යන්තර ඉපයුම් අනුපාතය - Internal Rate of Return**

ව්‍යාපෘතිය මත පවතින අභ්‍යන්තර ඉපයුම් අනුපාතිකය ගණනය කොට එය අපේක්ෂිත ඉපයුම් අනුපාතය සමග සංසන්දනය කිරීම තුලින් ව්‍යාපෘතිය ප්‍රයෝජන සහිතද යන්න නිර්ණය කළ හැකි වේ.

* **ශුද්ධ වර්තමාන අගය - Net Present Value**

පිරිවැය හා ආදායම ගණනය කිරීම උදෙසා භාවිතා කළ හැකි වඩාත් උචිතම ක්‍රමව ලෙස මෙය හැඳින්විය හැකිය.

නමුත් රාජ්‍ය ආයතන යනු හුදෙක් ලාභ ලබන ආයතන නොව මහජන සේවා සපයන ආයතනයි. එබැවින් කාර්යක්ෂම මහජන සේවාවක් සැපයීම අරමුණු කරගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.

➢ සමාජ බලපෑම් විශ්ලේෂණය (Social Impact Analysis)

ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් නොවී ව්‍යාපෘතිය අසාර්ථකවීම කෙරෙහි සමාජ සාධක හේතු වේ. එබැවින් මෙහිදී සමාජ/දේශපාලන අධ්‍යයනයක් සිදු කළ යුතුය. සමාජ, ආර්ථික හා දේශපාලනික දත්ත එක්රැස් කිරීම මෙහිදී වැදගත් වේ.

➢ උපකල්පන හා අවදානම (Assumptions & Risk)

ව්‍යාපෘතියේ සාර්ථකභාවය සඳහා පැවතිය යුතු තත්ත්වයන් උපකල්පනය කිරීම වැදගත්ය.

උපකල්පනයන්ගේ විශේෂිත අරමුණු පහත පරිදි වේ.

1. ව්‍යපෘති සැලසුම්කරුවන්ගේ ආරම්භක පියවරේ සිට අවසානය දක්වා ව්‍යපෘති සංකල්පයේ සැබෑ අවදානම තක්සේරු කිරීම

2. ව්‍යපෘතිය ක්‍රියාත්මක කිරීමේදී මෙහෙයුම්කරණ අවදානම විමසීම

3. ව්‍යපෘතිය සඳහා අවශ්‍යතාවයන් පැන නැගි විට අවශ්‍ය වෙනස්කම් සඳහා සුදුසු පදනමක් සැකසීම

ව්‍යාපෘතියට අනාගතයේදී මුහුණ දීමට සිදුවන අවිනිශ්චිත තත්ත්වයන් අවදානම් යනුවෙන් හැඳින්වේ. එම අවදානම් හඳුනාගෙන ඒවා වැලැක්වීමට සහ පාලනය කිරීමට සැලසුම් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. අවදානම් හඳුනාගැනීම සඳහා පහත ක්‍රම උපයෝගී කරගත හැකිය.

Brainstorming, Delphi Technique, Interview, Root Cause Analysis, Assumption Analysis, Checklist Analysis, Process Flow Charts, SWOT Analysis, Risk Analysis

➢ නිගමනය (Conclusion)

ව්‍යාපාර තර්කයෙහි අන්තර්ගත කළයුතු අවසාන කොටස මෙය වේ. ව්‍යාපෘතිය වැදගත් වන්නේ කුමන කරුණු නිසාද යන්න මෙහිදී පැහැදිලිව තහවුරු කළ යුතුය.

නිගමන හා නිර්දේශ

සඵලදායී නව ව්‍යාපෘතියක් හඳුනාගැනීම ඉතා සංකීර්ණ අභියෝගයක් වන අතර ව්‍යාපෘති ආරම්භයේදී එම ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු හා දැනුම අල්පවීම තුළ එහි ගැබ්වන අවදානමද වැඩිය. ව්‍යාපෘතියක් සාර්ථක අයුරින්රින් නිමා කිරීමට නම් ඒ පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදුකළ යුතු වේ. ව්‍යාපෘති කළමනාකරණයේදී භාවිත කරන ක්‍රමෝපායන් පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමෙන් සඵලදායී ව්‍යාපෘතියක් සාර්ථකව නිමාකල හැකිය.

විමර්ශන

Books

කමලදාස, නිශාන්ත. (2010), කළමනාකරණය, බත්තරමුල්ල: කර්තෘ

වීරරත්න, දුමින්ද. (2015), ව්‍යාපෘති කළමනාකරණය, කොළඹ: ගොඩගේ

සරත්චන්ද්‍ර, එදිරිවීර. (2017), ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය, කොළඹ: ගොඩගේ

Boardman, Anthony E. (2012), Cost-benefit analysis: Concepts and practice, Delhi: Pearson

Pearce, J. A. , Robinson, R. B. and Mital, Amita. (2010) Strategic Management: Formulation, implementation and control, New Delhi: McGraw Hill

Stoner, James A. , Freeman, R. Edward and Gilbert, Daniel R. (2009), Management, seventh rev ed. Delhi: Pearson

Web

Introduction to Project Management. OVERVIEW. The purpose of presentation is to provide leaders and team members of projects, Retrieved Feb 2021 from www.edo.ca/downloads/project-management.pdf

Project Management Retrieved Feb 2021 from www.opentextbooks.org.hk/system/files/export/.../pdf/Project_Management_15694.p...

එම්. කේ. ශිවෝන් යානිකා නන්දසේන
වරලත් පුස්තකාලයාධිපතිනි
ජාතික විගණන කාර්යාලය

සීගිරි ගීත සහ පුරාණ සිංහලයාගේ රසවින්දනය

සීගිරිය යනු ශ්‍රී ලංකාවේ අතීත ශ්‍රී විභූතිය ලොවට කියාපාන අද්විතීය නිර්මාණයක් බව අවිවාදයෙන් කිව හැක. සීගිරිය යුනෙස්කෝව විසින් ලෝක සංස්කෘතික උරුමයක් ලෙස නම්කර ඇත්තේ එහි ඇති සුන්දර ගෘහනිර්මාණ ශිල්පය, ඓතිහාසික වටිනාකම නිසාවෙනි. සීගිරිය නම ඇසූ පමණින් අපගේ මනස දිවයන්නේ එහි ඇති අතිශය අලංකෘත චිත්‍ර, සිංහ පා සහ කැටපත් පවුර වෙතයි. වර්තමානයේ දුටුවන් පවා මවිත කරවන මහා කලාගාරයක් වන සීගිරියේ කැටපත් පවුර පුරාණ සිංහලයාගේ සාක්ෂරතාව, බුද්ධිය, රසවින්දන හැකියාව මනාව කියාපාන්නකි.

සීගිරි චිත්‍ර මෙන්ම සීගිරි ගීද කලාකෘතින් ලෙස සැලකිය හැකිය. එමෙන්ම ඕනෑම ජන සමාජයක කලාවන්, සාහිත්‍ය, විශ්වාස, චාරිත්‍ර වත්පිළිවෙත් තුලින් ඒම සමාජය පිළිබඳ මනා විග්‍රහයක් සිදු කරයි. අනුරාධපුර යුගයේ මෙන්ම ඉන් පසු යුගයේ සාහිත්‍ය ග්‍රන්ථ පිරික්සා බැලීමේදී එකී ග්‍රන්ථ සමාජයේ උගත්යැයි සම්මත තෙරුන්වහන්සේලා සහ පඬිවරු විසින් රචනා කල ග්‍රන්ථ ලෙස දැකිය හැක. එසේනම් එම යුගවල සාමාන්‍ය ජනතාව කුමන ආකාරයේ සාහිත්‍යක් රසවින්දේද යන්න ගැටළුවකි. මෙම ගැටළුවට පිළිතුරු සපයන හොඳම මූලාශ්‍රය ලෙස හඳුන්වා දිය හැක්කේ සීගිරි ගීතයි.

සීගිරි පර්වතය පුරාතන අනුරාධපුර රාජධානියට ඉතා ආසන්නව පිහිටි ශේෂ කන්දක් වශයෙන් භූවිද්‍යාත්මකව දැක්විය හැකිය. සීගිරිය ආසන්නයේ ඇති පිදුරංගල සිදුකරන ලද කැණීම්වලදී හමුවු සාධක ප්‍රාග් ඓතිහාසික සාධක අනුව සීගිරිය අවට ප්‍රදේශය ප්‍රාග් මානවයාගේ වාසභූමියක්ව පැවත ඇත. ක්‍රි.පූ. 3 වන සියවසේ සිට සීගිරිය ආසන්නයේ ඇති පර්වත ගුහා බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ වාසස්ථාන කරගත් බවට සාධක පවතී. ලිඛිත මූලාශ්‍ර අනුව කාශ්‍යප රජු සීගිරිය තම රාජධානිය කරගන්නේ ක්‍රි.ව 477 සිට 495 දක්වා කාලය තුලයි. සීගිරි ගීතවල කාලවකවානු සලකා බලනකල සාමාන්‍ය ජනතාව සීගිරිය නැරඹීමට පැමිණ ඇත්තේ ක්‍රි.ව 7 වන සියවසේ සිට බව විද්වතුන්ගේ මතය වේ. සීගිරි කැටපත් පවුරේ දැනට සොයාගෙන ඇති ඇති මුළු ගී 835න් 685 ක්ම කියවා ඇත්තේ මහාචාර්ය සෙනරත් පරණවිතානයන් විසිනි. මෑතකාලීනය තවත් ගී 150ක් පමණ කියවීමට සමත්ව තිබේ. මෙම ගීවලින් බහුතරය ලියා ඇත්තේ ක්‍රි.ව. 8 සහ 9 වන සියවස් දෙකේදීය.

සීගිරි ගීත හෙළ සාහිත්‍ය නව මානයකට ගෙන යන්නකි. හෙළ ජනයා සතුව පැවති සාක්ෂරතාවය, සංයමය මෙන්ම රසාස්වාදනයද මෙම සීගිරි ගී තුලින් මොනවට පැහැදිලි වේ. සීගිරි ගී මේ වනවිට කියවා විශ්ලේෂණය කර ඇති පර්යේෂකයන්ට අනුව සීගිරි ගී රචකයන් එකල සමාජයේ පැවති විවිධ සමාජ ස්ථරවලට මෙන්ම විවිධ සංස්කෘතීන්වලටඅයත් වූවෝය. එමෙන්ම ග්‍රාම වාසීන්, නගරවාසීන්, රාජකීයයන්, වෘත්තිකයින්, වෙළෙන්දන්, පැවිදි උතුමන්, ගිහියන්ද මෙම සීගිරි කවියන් අතර සිටිති. තවද කුලවත් කාන්තාවන් ද තෙරණියන්ද සාමාන්‍ය කාන්තාවන්ද තම සිතැඟි සීගිරි කැටපත්පවුර මත සටහන් කර ඇත. මෙයින් පෙනීයන කරුණ වන්නේ සමාජ පන්ති බේධයකින් තොරව සාක්ෂරතාවයෙන් යුතු පිරිසක් අතීත ශ්‍රී ලංකාවේ සිට ඇති බවයි.

මහාචාර්ය පරණවිතානයන්ට අනුව සීගිරි ගී රචනාකල බහුතරයක් දෙනා තම සමාජ තරාතිරම දක්වා තිබේ. මෙහිදී තමා හොබවන නිලතල නම්බු නාම මෙන්ම තම කුලගොත්ද දැක්වීමට කවීන් උත්සුක වී ඇත. මහාචාර්ය පරණවිතානයන් විසින් කියවනලද ගී අතරින් 185 වන ගීතයේ "අසිගි සගල මලන" යනුවෙන් දක්වා ඇත්තේ අසිග්ගාහක නම් තනතුර දරනාගෙන් පැවත එන්නෙක් වශයෙනි. අසිග්ගාහක නම් තනතුර අනුරාධපුර යුගයේ රජතුමාගේ ආරක්ෂක තනතුරක් බව විද්වත් මතයයි. තවද 53 වන ගීයේ සඳහන් වන්නේ "මිහිදල ඇපාගේ වංශයට අයත් සිත්" එම ගීතය ලියූ බවකි. ඇපා තනතුර අනුරාධපුර යුගයේදී රුහුණු දේශය පාලනය කල ප්‍රාදේශීය පාලකයාවෙත හිමිවූවකි. ඔවුන් රජ පරපුරට නෑකම් ඇති රාජකීයයෝ වෙති. 522වන ගීතය රචනා කල තැනැත්තා රාජකීය වෛද්‍ය සිවගේ ඥාතියෙකි. විහාරාරාම පරිපාලනයේ යෙදී සිටි ගිහි නිලධාරීන්ද සීගිරිය නැරඹීමට පැමිණ තිබේ. කොත්මලේ අමරවංශ හිමියන්ට අනුව 49 වන ගීතය රචනා කර ඇති " බුද්ගමු විහාරයේ නියම්ජෙට් තනතුර දැරූ සග" යනු බුද්ගමුව විහාරයේ විහාර පරිපානය සිදුකල ගිහි තැනැත්තෙකි.

සීගිරි ගී ලියූවන් අතර විවිධ වෘත්තිකයින්ද දක්නට ලැබේ.

සති වෙණජ කිතලු ගී

නිලි මහානෙල නිලුපුල වන දිගඇස නිසසල

එ බලමිනි සිටි ජනන බල දිග නුයුන

කිතලු නම් වාණිජ්‍යයා හෙවත් වෙළෙන්දා සීගිරි ළඳුන්ගේ නිසසල ඇස් මහනෙල් සහ නිලුපුල් මල්වලට උපමාකර තිබේ.

තවද පැවිදි තැනැත්තන්ද සීගිරිය නැරඹීමට පැමිණ කැටපත් පවුරේ සටහන් තබා ඇත. මිතිල් නම් පැවිද්දා සීගිරිය නැරඹීමට පැමිණ දිගු කලක් මාර්ගයේ ගතකල බව දක්වා ඇත. ඇතැම් පැවිද්දන් තමා අවබෝධ කරගත් ලෝකයේ යථා ස්වභාවය සීගිරි ගීතයක් ලෙස කැටපත් පවුරේ සටහන් කර ඇත.

මෙසෙ සිති පහසක් සෙ වී මුළ රුවෙහි එත රිසි

යෙත එළෙ සෙ පු නුබ සිරිබර්නි පින්සබර් ජන්ම

එහි අර්ථය ලෙස විද්වතුන් දක්වා ඇත්තේ රූපයෙන් මුලා වී ආශාවන් ඇතිවත්ම මෙම කාන්තාවන් පහස සඳහා යෝග්‍ය බවට ඔබ සිතයි. ආශාව අහසට විසිකල යමක් මෙන් මුලාවකි. ඔවුන්ගේ රූප සම්පත් ඔවුන් කල පුන්‍ය සම්භාරයන්ය.

සීගිරි ගී ලියූ කවියන් අතර කාන්තාවන්ද සිටී. මහාචාර්ය පරණවිතානයන්ට අනුව 87 වන සීගිරි ගීය ලියා ඇත්තේ බතී නම් කාන්තාවකි.

බෙයන්ද්ගන සිර්බරිනි අග්නක් කෙලෙයි මෙය

ගැසූ එ අබියෙසැ නුයුන් මිණිකැල්ලේ පහස්නෙන්

සීගිරි අඟනන්ගේ රූසිරියෙන්ද මිණිකැට වන් දෙඇස්වල ශෝභාවෙන්ද වශීවූ කාන්තාවක් මෙය ලියූ බව බතී සටහන් කරයි.

කණ්ණා නම් කාන්තාවක් මෙසේ ලියා ඇත.

සර කත බව මිනිස් පිය නොසුලබැ බව

නො කිසි වී ජන්නහුන් ඇත අසතු නො වන නැසෙන්නට

සංසාරය කාන්තාරයක් බව මනුෂ්‍යාත්මය සුලබ නොවන බව යන කිසිවක් නොදන්නවුන් ඇත. විනාශයට ඇළුම් නොකරන්න යන්න එහි අදහසයි. ඇය ප්‍රකාශ කරන අදහස බුදු දහමේ මූලික හරය හා සම්බන්ධ වේ. කණ්නා නැමැත්තිය තම අදහස ජනගත කිරීමට සීගිරි කැටපත් පවුර අපූර්ව ලෙස යොදාගෙන ඇති.

සීගිරි ගී රචිකාවියන් අතර ගිහි කාන්තාවන් පමණක් නොව තෙරණියන්ද වෙති.මහාචාර්ය පරණවිතානයන්ට අනුව 88 වන සීගිරි ගීතය රචනාකර ඇත්තේ තෙරණියකි.

එමෙන්ම සීගිරි කවීන් තම පුද්ගලානුබද්ධ රසවින්දනයන් අනුව කැටපත් පවුරේ තම හැඟීම් සටහන් කර ඇත. මෙහිදී කාන්තාවන් පිළිබඳව ඔවුන් දරණ මතය බොහෝ අවස්ථාවල කුළුගැන්වීමට හේතු වී ඇත්තේ සීගිරි ළඳුන්ගේ අලංකාර චිත්‍රයි. මෙම කාන්තාවන් දකින සමහර කවීන් ඔවුන් වෙත ආසක්තව තම කවි රචනා කරන අතරම සමහර කවීන් ඔවුන් ප්‍රතික්ෂේප කරති.

මුහුන්දැ ගිනිපෙත් ගැසි

නියගින මැණික් විදැලී

කපුරුයෙ වැලැ තිප්ලි

යුන අසරු වි කා සිති

මෙම කවියේ අදහස වන්නේ මුහුදෙහි ගිණිමැලයක් ගසන ලදී, නිය අගින් මැණික් විදින ලදී, තිප්පිලි වැලක කපුරු සැදේ. මෙවන් කතුන් ආශ්‍රයට සුදුසු යැයි කවුරුන් සිතන්නේද? යන්නයි. මෙම කවියා වක්‍රව දක්වා සිටින්නේ කාන්තාවන් පිළිබඳ තම ආකල්පයයි. මහාචාර්ය පරණවිතානයන් කියවන ලද කවි එකතුවේ 306 වන කවිය දක්වන්නේ

ලැදි මන බන්ද්නා

පැහැබර් සිනා රැස්නා

කතක්හී තොස්නා

මිණිඅකුස් හිස්හි ලය් ගත්නා

මෙම කවියා ප්‍රකාශ කරන්නේ දුටුවන් මන බඳින පැහැඉර සිනහ රැසින් සිටින මෙම කාන්තාවන් කෙරෙහි සිත් බැඳීම මැණික්වලින් සැදි හෙන්ඩුවක් හිසේ ලා(ඇන) ගත්තාක්මෙන් වන බවයි.

මෙම කාන්තාවන් පිළිබඳව නොවුනත් විවාහය පිළිබඳව තම කලකිරීම් මනෝභාවයන් හෙළිකල තවත් සීගිරි කවියෙක් මෙසේ කියයි.

ඇතුළතින් ජු බැහැරියෙන් එවකට ගත

අබු මිනිසුන් ඉසලු කුළ පිනු සෙයිනි.

මෙම කවියේ අදහස වන්නේ ඇතුලාන්තයෙන්ද බාහිරින්ද එකවර අල්ලාගෙන ඇති හෙයින් මිනිසුන් විසින් කරන අඹුවන් රැකීම ගල්කුලකින් පහලට පැනීමක් බඳු බවයි.

මෙබඳු කවීන් අතර ශෘංගාරාත්මක වර්ණනයන්ගේ නිරත කවීන්ද හමුවේ.

අමඩක් ලෙඩි සි නොවේ වරල් නිල්වලා

සිහිල් ලබු ගැහැනි මය පෙලෙබු දී මන්ද්සිනා බැල්මක්

මෙම කවියා ප්‍රකාශ කරන පරිදි කොමඩු ගෙඩියක බීජ පෙළක් බඳු සිනහවකින්ද නිල්පැහැ වළාකුළක් බඳු වරළසක්ද ඇති ගැහැණිය මඳ සිනහා බැල්මක් දී ඔහු පෙළඹවූවාය.

සීගිරි ළලනාවකගේ සරාගී රූපශ්‍රීය දැකීමෙන් පුරුෂයෙකු තුල මතුවූ නිර්ව්‍යාජී ශෘංගාරාත්මක භාවයන් සෘජුව ප්‍රකාශ කල අවස්ථාවක් මෙම කවියේ දැක්වේ.

පුයුත් මන්ද් මෙන් මියුලැස්නි කොට්

තොප රූ එක්

සා වඩයි මෙ ආ රස දියුණ් කෙළෙ අඩ්

බුද් සා

මියුලැසියෙනි, තොපගේ රූපයන් එක්කර බිව්වහොත් මඳ යැයි සිතේ. මට මෙම රසය සා ගිනි වඩයි. අඩක් බුදින ලද දෙයක් නිසා සා ගින්න දියුණු විය.

සාහිත්‍යය

මෙම කවීන් අතර වෙනස් අනුභූතීන් පදනම් කරගෙන ගී ලියූවන්ද වේ.

යෙමින් සිටැ ගමක් සිහි ගි කැටබිතට් නැඟි

ලියා ලියි ම ගියක් මිලැසියකට් බිතට් සොබ්නා

අත් ගමනක් යමින් සිටියදී සීගිරි කැටපත්පව්රට නැග කැටපත් බිත්තියකටත් මියුලැසියකටත් ගීයක් ලියූ බව මෙම කවියා ප්‍රකාශ කරයි. තම බිරිඳ සමග සීගිරිය නැරඹීමට පැමිණි කවියෙක් තම අද්දැකීම මෙලෙස සඳහන් කරයි.

ලබුතිරියෙන් මා ලී ගනතනි සවලී

ගළවමිනි මලක් ආත බය් එහි රනවනතට

ඔහුගේ බිරිඳගේ එල්බෙන උතුරු සළුවෙහි තබාගත් සවලී මලක් ගලවා රන්වන් කාන්තාවක් වෙනුවෙන් තබා ආ බව මෙම කවියා කියයි.

බුදල් නම් රැඩිකල් කවියෙක්ද සීගිරි ගී අතර අපට මුණගැසේ

"බුදල් මි

සියොවැ ආමි

සිහි ගිරි බලීමි

බැලු බැලු බොහො ජනා

ගී ලියුයෙන් නොලිමි"

තමා නමින් බුදල් ලෙස හඳුන්වන ඔහු සීගිරි නැරඹීමට පිරිසක් සමග පැමිණ ඇත. බලන බලන අත ජනයා ගී ලියන බැවින් ඔහු නොලියන බව කැටපත් පවුරේ සටහන් කරයි.

එච්.සී.පී බෙල්, ආනන්ද කුමාරස්වාමි, සෙනරත් පරණවිතාන වැනි ඉතිහාසඥයන්ගේ සිට වර්තමානයේ ශිරාන් දැරණියගල දක්වා ඉතිහාසඥයන් සීගිරි ලළනා චිත්‍ර සඳහා විවිධ අර්ථකථනයන් ලබා දී තිබේ. මේ වැනි විවිධ මතවාදයන් අතීත සීගිරි කවියන් අතරද තිබී ඇත.

බෙයන්ද්හි රන්වනු නිරින්ද් ඉසිරා වියෙව්හි

මෙසිනි මියහෙම්හ ගල් ඇගැනි හෙනයුන් වැන්නෝ

මෙම කවියා විසින් ප්‍රකාශ කරන්නේ නිරිඳාගේ වියෝගය නිසා ලෙන් හි සිටින රන්වන් ස්ත්‍රීන් ශෝකයෙන් මියයමි කියමින් ගල මුදුනින් පහතට පනින බවයි.

සීගිරි කාන්තාවන් අප්සරාවන් ලෙස දකින කවියන්ද සිටඇත.

කිම්ජබරවිල්හි අත්යුගලෙන් ඉගිලි

ගෙල ල විජලි නිව ගිම් දිවඅසර අස මෙහි ආ

මෙම කවියා ප්‍රකාශ කරන්නේ ආකාශ තඩාගයේ කිමිද දෙඅත්යුගලෙන් (පියාපත් ලෙස) ඉගිලී විදුලි ලතාවන් ගෙල පළඳා වෙහෙස නිවා දිව්‍ය අප්සරාව මෙහි ආ බවයි.

සීගිරි කවීන් අතර චිත්‍ර නරඹා රස විඳීමෙන් නොනැවති සිත්තරාව අගයකල කවීන්ද වෙති. මෙම බෙනයේ සිත්තරා මනා ලෙස කාන්තාව ඇඳ ඇති බවත් ඇය කතා නොකලත් අත සහ නෙත් දෙස බලන කල්හි ඇය ජීවමානව සිටිනාලෙස පෙනෙන බව ඔහු කියයි.

සොන්ද සෙ කත් බෙ යන්හි මෙ සිතුවර් ලියවයි

නොලැබි ජු වජනන් මෙ අත නෙත බලත සිත් ඇති මෙන්



සීගිරි ගී නිරීක්ෂණය කිරීමේදී විවිධ ආකෘතිගත ශෛලීන් තම නිර්මාණ සඳහා යොදාගත් අවස්ථා දක්නට ලැබේ. පහත සඳහන් නකවිය සිව්පද ආකෘතියෙන් එළිසමය සහිතව ලියන ලද්දකි.

"කොමුල් අමඩ් ලෙඩ් ලින සී

එ බොන්ද මියුර් යහ බැසී

එ කපල්දල වන් දිගැසී

මන ජල්වයි සිත් නො මුසී"

මෙම කවියා කොමඩු ගෙඩියේ ලෙල්ලේ හැඩය කාන්තාවන්ගේ ඇස් උපමා කර තිබේ. ඔහුගේ මනස ඇගේ නෙත් කැළුමෙන් දැල්වෙන බව සිව් පද රීතියෙන් ගෙන හැර දැක්වීමට කවියා පොහොසත් වී තිබේ. නිදහස් ආරක් ගත් කවීන්ද බොහොමයක් සීගිරි ගීතය තුල දක්නට ලැබේ. පහත කවියාද එවැන්නෙකි.

"විජු රක්බෝ පැවිජ්ජන් ලී මේ ගී

නෙලෙන් වී පිරිපත

නළල කෙහෙ පිහිටි හුන

මලදම ගැනැ විසිර

බියපත් වැ අප බෙයඳ නැගියෙ"

වජිර අග්බෝ නම් පැවිද්දෙක් විසින් මේ ගීය ලියන ලද්දකි. කාන්තාවන් සුළං හේතුවෙන් පැළඳ සිටි මල් මාලය, කෙස් රොද පවා විසිර ගියහෙයින් බියපත්ව බෙනයට නැගුන බව පවසයි.

මේ සියල් කරුණු සලකා බලන කල හෙළ සාහිත්‍ය වංශ කතාවේ සුවිශේෂී පරිජේදයක් සීගිරි ගීතයට හිමිව තිබෙන බව අවිවාදයෙන් සඳහන් කල හැක. තවද අතීත ශ්‍රී ලාංකික සාමාන්‍ය ජන ජීවිතය පිළිබඳව අධ්‍යනය කරන්නෙකුට වුවත් සුවිශාල වැදගත් කමක් සහිත මූලාශ්‍රයක් බවට සීගිරි ගීත සඳහන් කල හැකිය. පුරාතන හෙළ සමාජය විවිධ සමාජ ස්ථරවලින් සැදුම් ලද්දක් බවත්, සමාජයේ ඉහල ස්ථරයන් සතුව මෙන්ම සාමාන්‍ය මහජනයා සතුවද සාක්ෂරතාවය පැවති බවත්, කාන්තාවන් වුවත් සාක්ෂරතාවයෙන් යුක්ත වූ බවත් සීගිරි ගීත ඔප්පු කර පෙන්වයි. උපමා අලංකාර සහ වක්‍රෝක්ති සහිත විචිත්‍ර භාෂා රටාවකට පුරාණ හෙළයා උරුමකම් කී බවත් තම සිතට නැගි අදහස් නිර්භයව ප්‍රකාශ කිරීමේ ශක්තියකින්ද මෙකී කවීන් පොහොසත් බවටත් සීගිරි ගීතය සාක්ෂි දරයි. රස හා භාවයන් කැටි වූ මෙම අපූර්ව නිර්මාණ පුරාතන සිංහල සාමාන්‍ය ජනතාව අතින් නිර්මාණය වී ඇති ආකාරය සබැවින්ම ආශ්වාදජනක නොවන්නේද?

(මෙම ලිපියේ සඳහන් සීගිරි ගීවල අර්ථයන් ආචාර්ය ප්‍රශාන්ත පෙරේරාගේ "ගිරි බිතෙහි තී " ග්‍රන්ථය ඇසුරෙනි)

එස්.ජී.තුෂාරි ඉන්දිකා

INS/A විගණන ශාඛාව

දැනුමට ලිපි

What is the only fruit which has seeds outside?

Clues: It is the only fruit with seeds in its peel.

Its color is bright red.

It's a juicy fruit with sweet taste.

It grows well in cold climates.

It is rich in vitamin C.

Doctors say that it helps to protect people from

- Cancer
- Heart diseases
- High blood pressure
- Diabetes and,
- Constipation

To get the answer – Read the below letters from right to left

YRREBWARTS

D.M.J.P.Kumari

Performance Audit Division

தாய் மொழி அல்லாத இன்னொரு மொழியைக் கற்பதிலுள்ள நன்மைகள்

மொழி என்பது இன, மத, நிற வேறுபாட்டுக்கு அப்பாற்பட்டது. மொழி இல்லாமல் ஒருவருக்கொருவர் தொடர்பு கொள்ளவோ, உரையாடவோ முடியாது. ஒரு நாட்டிற்குள் பல மொழி பேசுகின்றவர்கள் வாழ்கின்றனர். உதாரணமாக எமது நாட்டில் பிரதான இரு மொழிகளைப் பேசும் சமூகத்தினர் வாழ்கின்றனர்.

இலங்கையின் மொழிப் பிரச்சினையும் முப்பது வருடகால யுத்தத்திற்கு காரணமாக விளங்கியது. இவ்வாறு பல மொழிகளில் மக்கள் உரையாடுவதால் தாய் மொழி அல்லாத இன்னொரு மொழியையும் அறிந்திருத்தல் அவசியமாகும். தாய் மொழியில் தம் இனத்தவருடன் மாத்திரமே உரையாட முடியும். ஒரே நாட்டில் வாழும் மக்கள் மற்ற இனத்தவரோடும் இணைந்து செயற்பட வேண்டுமானால் நிச்சயமாக மற்றுமொரு மொழியே அறிந்திருந்தல் அவசியமாகும். எமது அயலவர் வேற்று மொழி பேசுபவராக இருக்கலாம் அவர்களுடன் உரையாட வேண்டும்.

இன்று நாம் பல கொடுக்கல் வாங்கல்களில் ஈடுபடுகின்றோம். போக்குவரத்து தொடர்பாடலிலும் ஈடுபடுகின்றோம். இவ்வாறான சந்தர்ப்பங்களில் வேற்று மொழிகள் எமக்கு பயணளிக்கும். அவ்வாறு நாம் தாய் மொழி அல்லாத இன்னொரு மொழியை அறியாதிருந்தால் எம்மை பலரும் ஏமாற்றி விடுவார்கள். இன்று விஞ்ஞான தொழில்நுட்பத்துறை வளர்ச்சியடைந்துள்ளது. இதனை நாம் அறிந்து கொள்ள, கற்றுக் கொள்ள எமது தாய் மொழியால் மாத்திரம் முடியாது. குறிப்பாக ஒன்று எமது கையிலுள்ள கையடக்க தொலைபேசி முதல் மற்றும் கணிணி வரை அத்தனை தொழில்நுட்ப உற்பத்தி பொருட்களும் வெளி நாடுகளில் இருந்தே கொண்டு வரப்படுகின்றன. இவற்றை நாம் பயன்படுத்த ஆங்கில மொழி போன்ற வேற்று மொழி அறிவு தேவைப்படுகின்றது.

இவ்வாறே உள்நாட்டில் வேலை வாய்ப்புக்களைப் பெறுவதற்கும், வெளிநாட்டில் வேலை வேலை வாய்ப்புகளைப் பெறுவதற்கும், சமூகத்தோடு ஒன்றினைந்து செயலாற்றுவதற்கும் எமக்கு அந்த நாட்டு மொழி அவசியம். எனவே நாம் நம் நாட்டின் ஏனைய சமூகத்தோடு இணைந்து வாழவும், வெளிநாட்டு சமூகங்களுடன் செயலாற்றவும். எமக்கு பிற மொழிகள் பல பயன்களை பெற்றுத்தரும்.

எம். அய். எப். டிராயா

செயலாற்றல் கணக்காய்வுப் பிரிவு

ගම්මැද්දේ ජන කතා



අප්පුහාමි : මගෙ කුඹුර කැව නේද..?

අලියා : මම කැවෙ මට කන්න තියෙන හරිය..

අප්පුහාමි : තොට කන්නද මම කුඹුරු හදන්නෙ...?

අලියා : තෝ මොකටද අපේ අලි මංකඩේ කුඹුරු හැදුවෙ..?

අප්පුහාමි : මේක කොහොමද උඹේ වෙන්නෙ..? මේ අපේ අප්පොච්චිගෙ කුඹුර.

අලියා : උඹේ අප්පොච්චිගෙ කාලෙත් මේක මම කැවා..

අප්පුහාමි : ඉතිං අප්පොච්චි අපිට එහෙම කියලා නෑනේ..

අලියා :

ඒක තමයි අප්පොච්චිගෙයි උඹෙයි වෙනස.. උඹේ අප්පොච්චි මේකෙ කුඹුරු කලා.. කුඹුරු කරල පැලක් හදල ගොයම පරිස්සං කලා. උඹ වගේ බුදියගන්න ගෙදර ගියෙ නෑ. උන්දෑ පැල්කවි කියන සද්දෙ අහගෙන ගියා මිසක් අපි කුඹුර කැවෙ නෑ. හැබැයි උන්දෑ වී අරං යනකොට අපේ කොටහ ඇරල ගියේ. ඒ ඇරපු කුඹුරෙන් අපි හය මාසයක් කෑව. ඉතිරි හය මාසෙ බොගෙ අප්පොච්චි කෑව. එහෙමයි උඹෙ අප්පොච්චියි අපියි ජීවත් උනේ. උඹ වගේ මේකට ඉලුක් තෙල් ගැහුවෙ නෑ උන්දෑ. උඹගෙ අප්පොච්චි කැලේට ඇවිත් බේතක් හේතක් හොයාගෙන ගියාට උඹ වගේ වැව වටේට වැට ගැහුවෙ නෑ.. උඹ වගේ කැලේ ගස්ටික කැපුවෙ නෑ... ඒකයි උඹෙ අප්පොච්චිගෙ කාලෙ උන්දැයි අපියි අතරෙ ප්‍රශ්න තිබුණෙ නැත්තෙ..

(අපට අමතක අපේ අතීතය .. අපට අමතක අපේ කම... අන්තර්ජාලය ඇසුරිනි)

බිඳුණු කළයේ කථාව

දුෂ්කර ගම්මානයක පිහිටි නිවාස පෙලකට දෛනිකව පානීය ජලය සැපයීම, සිය ජීවනෝපාය කරගත් දුප්පත් පුද්ගලයෙක් චීනයේ විසීය. දිග ලීයක දෙපැත්තේ අමුණාගත් කළගෙඩි දෙකක් සහිත කදක් උපයෝගී කරගනිමින් කන්ද පාමුල පිහිටි ජල මූලාශ්‍රයක සිට දිය ඇද දීමේ දුෂ්කර ව්‍යායාමයක උදේ සිට සවස් වනතුරු ඔහු යෙදී සිටියේය.

අවාසනාවක මහත! මෙම කළගෙඩි දෙකින් එකක සුළු පිපිරීමක් තිබීම හේතුවෙන් එක්වරකට ඔහුට ගෙන යාමට හැකිවූයේ කළගෙඩි එක හමාරක ජලය පමණි. කලගෙඩියේ වූ පළුද්ද හේතුවෙන් එක් ගමනකදී කළගෙඩි බාගයක ජලය අපතේ ගියේය.

තමන්ගෙන් මෙම දුප්පත් පුද්ගලයාට වන සේවය සම්බන්ධයෙන් පිරිපුන් කළය බෙහෙවින් ආඩම්බර විය. සේවය සඳහා තමන්ගේ කැපවීම ගැන පුරසාරම් දෙඩීය. එහෙත් බිඳුණුකළය තමන්ගේ අඩුපාඩුව සම්බන්ධයෙන් නිරන්තරයෙන් කණගාටුවට පත්විය. තම දුප්පත් ස්වාමියාට තමන්ගෙන් විය යුතු යුතුකම ඉටුකිරීමට නොහැකිවීම සම්බන්ධයෙන් පසුතැවීමට පත්විය. සේරටම වඩා පිරිපුන් කළයේ පුරසාරම අසාසිටීමයි, අපහසුම කාරිය වූයේ.

මේ අවනඩුව ඉවසාගෙන සිටින්නටම බැරිම තැන, වර්ෂ දෙකක් ඉකුත් වූ පසු, එක්තරා උදෑසනක ජල මූලාශ්‍රය අසලදී, බිඳුණු කලය සිය කණගාටුව දුප්පතා වෙත ප්‍රකාශකර සිටියේය. කවදාවත් නිවැරදි කල නොහැකි තමන්ගේ අඩුපාඩුව නිසා සිය වගකීම ඉටු කිරීමට නොහැකිවීම සම්බන්ධයෙන් ශෝකය පල කර සිටියේය. තමන්ගෙන් නිසි ප්‍රයෝජනයක් නොලැබෙන නිසා තමන්ව අත්හරින ලෙසත් අඩුපාඩු රහිත අළුත් කළයක් සොයාගන්නා ලෙසත් බිඳුණු කළය සිය ස්වාමියාගෙන් ඉල්ලා සිටියේය.

දුප්පතා සිනාසුනි. බිඳුණු කළයෙන් වූ සේවය අගැයීමට ලක්කලේය. තමන් මුලසිටම බිඳුණු කළයේ අඩුපාඩුව හඳුනාගෙන සිටි බවත්, එම අඩුපාඩුව මඟ හැරීමට තමන් කටයුතුකල බවත් දුප්පතා බිඳුණු කළයට පැවසීය.

ඒ කෙසේදැයි බිඳුණු කළය විමසීය.

"මේ බලන්න. මෙම ජල මූලාශ්‍රයේ සිට අර පෙනෙන කන්ද මුදුනේ පිහිටි නිවාස පේළිය දක්වා අප හැමදාම ගමන් කරන මාර්ගයේ එක් පැත්තක තිබෙන මල්ගස් වල පිපුණු මල් නැලවෙන හැටි ඔබට පෙනේද? ඒ ඔබ නිසයි."

"ඔබේ පළුද්ද හේතුවෙන් නිරතුරුවම ජලය වැස්සෙන නිසා මා ඔබ රැගෙන යන පැත්තෙ මඟ දිගටම මල් බීජ වැපිරුවා. ඔබෙන් වැස්සෙන වතුරෙන් ඒ බීජ පැලවී මේ මල් ගස් සරුවට වැඩුනා. දැන් කොතරම් ලස්සනද?"

"අර නිවාසවල වෙසෙන ළමයි හැමදාම මල් කඩාගෙන ගිහින් තමන්ගේ කාමර සරසා ගන්නවා. කොයිතරම් අපූරුද? ඒ නිසා තමන්ගේ අඩුපාඩු ගැන මැසිවිලි නොනඟන්න. අඩුපාඩු තුලින් ලෝකයට යමක් දීමට උත්සාහ කරන්න." දුප්පතා අවසාන වශයෙන් පැවසුවා.

(චීන ජන කථාවක් ඇසුරිනි)

ජී. ඒ. එම්. අයි ගුණරත්න

විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති

ලිඳේ සිටි ගෙම්බා

ලිඳක ගෙම්බෙක් වාසය කලේ ය. බඩගිනි වූ විට ගෙම්බා ලිඳේ සිටින කෘමීන් අල්ලාගෙන කයි. පිපාසය ඇති වූ විට ලිඳේ ඇති දිය බොයි. ලිඳෙන් එපිට ලොවක් ගැන ගෙම්බා දැන සිටියේ නැත.

දිනක් කොවුලෙක් ලිං ගැට්ට මත විවේක ගනිමින් සිටියේ ය.

" කොහේද ඔහේ යන්නේ " ගෙම්බා උඩ බලා කොවුලාගෙන් ඇසුවේ ය.

" මං මේ හැතැම්ම සීයකට එහා ඉන්න මගේ යාලුවෙක් බලන්න යනවා මට මහන්සියි ඒ නිසයි මෙතන ටිකක් නැවතුනේ. " කොවුලා කීවේ ය.



" ඔහේ මොනවද ඔය කියන බොරු... අහස මේ ලිඳ තරම්වත් ලොකු නැති කොට ඔහේ කොහොමද හැතැම්ම සීයක් පියාඹන්නේ..."

" ඔහේ දන්න තරම... අහස සීමාවක් නැති තරමට ලොකුයි... "

" අනේ.. අනේ.. මෝඩයාට කියලා දෙන්න හැදුවට හරියන්නෙ නෑ.. මං මේ ලිඳේ අවුරුදු ගනනාවක් ඉඳලා තියෙනවා. මං දන්නවා අහසෙ තරම . ඔහෙ කොහොමද මාව රවට්ටන්නෙ..?" ගෙම්බා කීවේ ය.

අලි පරපුර වෙනුවෙන් දිවිදුන් පනාමුරේ ඇත් රජු

මඩුවන්වෙල පරපුරේ නින්දගමක් ලෙස පැවති කොළොන්න කෝරලයේ පිහිටා ඇති පනාමුරේ ග්‍රාමය මේ ඓතිහාසික සංසිද්ධිය සිදු වූ ස්ථානයයි. කඳු, බෑවුම්, මිටියාවත්, ඇළ දොළින් සපිරි මේ ප්‍රදේශය එකල අතිශයින් රමණීය වනාන්තරයක් විය. වන සතුන්ගේ නින්දගමක් වූ පනාමුරය හා ඒ අවට ප්‍රදේශ එකල වඩාත් ප්‍රකටව තිබුණේ අලි ඇතුන් බහුල ප්‍රදේශයක් ලෙසිනි. 1912 දී සිදුකළ අලි ගණනයට අනුව එහි අලි ඇතුන් 2300 ක් පමණ වාසය කළ බව සඳහන්ව තිබුණි. මඩුවන්වෙල පරපුර මේ සියල්ලම තමන්ට අයත් බූදලයක් ලෙසින් සැලකූහ.

සිය නින්දගමෙහි ජීවත් වූ අලි සම්පත අල්ලා විකිණීමෙන් ඔවුන් වරින් වර විශාල ආදායමක් ලැබූ බව ඉතිහාස කතාවන්හි සඳහන් වේ. ඔවුහු අවුරුදු පහකට වරක්වත් අලිගාල් පැවැත්වීම හෙවත් අලි ඇල්ලීම සිදු කළහ. 1912 දී මඩුවන්වෙල රටේ මහත්තයා එවැනි ඇත් ගාලක් පැවැත්වූ බව සඳහන් වේ. රජයේ අවසරයක් නොමැතිව වුවද ඇත් ගාලක් බැඳ අලි ඇල්ලීමේ බලය තිබූ එකම පුද්ගලයා වූයේ මඩුවන්වෙල රටේ මහත්තයාටය. අක්කර 64 ක භූමි ප්‍රදේශයක් පුරා එම ඇත්ගාල පවත්වා ගෙන ගිය බව සඳහන්ය.

පනහේ දශකය වන විට මඩුවන්වෙල පරපුරේ ජීවමාන උරුමකරවා වූයේ ෆ්‍රැන්සිස් මොලමුරේ මහතාය. ඔහු ඒ වන විට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම කතානායක ධුරයද දරමින් සිටියේය. අලි අල්ලමින් විශාල ආදායමක් උපයාගත් පරපුරක අයෙකු වශයෙන් ෆ්‍රැන්සිස් මොලමුරේද ඇත්ගාලක් පවත්වා ගෙන යාමට උත්සාහ දැරීය.

ඔහු සතුව අලි ඇල්ලීමේ මන්තර තිබූ බවටත් එකල බොහෝ දෙනකු අතර ප්‍රචලිතව තිබුණි. වනාන්තරය මැද ස්වභාවිකව පිහිටා තිබූ දිය බුබුලක් ආශ්‍රිතව ඔහු මෙම ඇත්ගාල ඉදිකරවන ලදී. මේ දිය බුබුලෙහි දිය කිසිදා නොසිඳෙන බවට විශ්වාසයක් එදා මෙන්ම අදද ජනතාව අතර පවතී.

අලිගාල ඉදිකොට තිබුණේ අක්කර හතරක පමණ භූමි ප්‍රදේශයක් වටකොටය. සුවිශාල බුරුත කඳන්වලින් අලි ගාල වටකොට තිබුණි. සද්දන්තයන් දියට බසිනා මාර්ගය සමීපව ඉදිකොට තිබුණු දොරටුවෙන් අලින් කොටුව තුළට පැන්නීම සිදුකර ඇත. ඉන්පසු කඩුල්ල සවිමත්ව බැඳ දමා ඇත. මෙතරම් සුවිශාල අලි වැටක් ඉදිකිරීමේ කාර්යය සිදුකර ඇත්තේ එම නින්දගමෙහි ජීවත් වූ ජනතාව විසිනි.

අලි ඇතුන් ගාල තුළට කොටු කරන අන්දම නැරඹීම පිණිස එකල සුවිශාල ජනකායක් පැමිණි බවද සඳහන් වේ. ඔවුන් මේ සඳහා ප්‍රවේශ පත්‍රයක් ද මිලදී ගත යුතු විය. එය නැරඹීම පිණිස සුවිශේෂී නැරඹුම් මැදිරියක් ද ඉදිකොට තිබුණි. ප්‍රැන්සිස් මොලමුරේ විසින් පවත්වන ලද

අලිගාල නැරඹීම සඳහා එවකට ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වූ සෝල්බරි සාමි, හමුදාපති රෝස් මෙන්ම කීර්තිමත් ඉංග්‍රීසි ලේඛක දොස්තර ආර්.එල්. ස්පිට්ල් ද සහභාගී වී ඇත.

අලි ඇල්ලීමේ කාර්යයේ යෙදී සිටින පුද්ගලයන් හඳුන්වනුයේ 'පනිත්තිලයන්' නමිනි. 'පනිත්තිලයන්' සියලු දෙනාද මේ කාර්යය සඳහා එක්වී ඇත.

වල් අලි කොටුකර බැඳ තැබීම සඳහා හීලෑ අලි 14 දෙනකු යොදාගෙන ඇත. ඔවුන් වෙනුවෙන් ඇත් ගොවුවෝ දෙදෙනෙක් ද ඊට සහභාගී වූහ. දින කිහිපයක පරිශ්‍රමයකින් පසු ඔවුන්ට වල් අලි 26 දෙනකු ගස් බැඳීමට හැකි විය. එහෙත් මේ අතර සිටි එක් සද්දන්තයෙකු කෙසේවත් මෙල්ල කළ නොහැකි විය. අඩි 9 ක් පමණ උසකින් යුතු වූ මේ සද්දන්තයාට වයස අවුරුදු 25 ක් තරම් විය. ඇතුන් ඇල්ලීමට නම් දැරූ අය පමණක් නොව අලි මන්තර දත් අයද දැරූ පරිශ්‍රමය වතුරේ ගියේය.

ඒ කිසිවක් ඉදිරියේ මේ සද්දන්තයාගේ ඔද තෙද සිඳී නොගියේය. පැමිණි වද හිංසා දුක් ගැහැට හමුවේ තව තවත් දරුණු වූ ඌ හීලෑ අලි ඇතුන්ගේ පස්සා ගාත් බිම ඇදෙන්නට පහර දුන්නේය. ගස් බඳින ලද තම රෑහේ එවුන් බේරා ගැනීමට එම ගස්වැල් වලට පහරපිට පහර දුන්නේය.

අලි ගාලේ අයිතිකාරයා වූ ෆ්‍රැන්සිස් මොලමුරේට ද මේ සද්දන්තයා සුවිශාල ප්‍රශ්නයක් විය. වියරුවෙන් සිය රෑහේ එවුන් වෙනුවෙන් මෙල්ල නොවී සටන් වදින මේ ඇතාට වරක් පිටව යන්නට ගාලේ දොර ඇර තැබුවේය. එහෙත් සිය පරපුරේ අනිත් එවුන් ගස් බැඳ තිබියදී බියගුල්ලකු මෙන් පලා යන්නට ඌ කිසිසේත්ම කැමැති නොවීය. තව තවත් රෞද්‍රව සටනට ආවා මිස පලායාමක් ඌට නොවීය.

පනාමුරේ මේ ඇත් රාජාගේ වික්‍රමය පිළිබඳ ඒ වනවිට දස දෙස ප්‍රචලිත වන්නට විය. ඇතාගේ වික්‍රමය අභියස අසරණ වූ ෆ්‍රැන්සිස් මොලමුරේ ගේ අවසාන තීන්දුව වූයේ මේ සද්දන්තයා මරා දැමීමයි.

රත්නපුරේ පොලීසියේ නිලධාරීන් හයදෙනෙකු ඒ සඳහා පැමිණියද එක වෙඩි පහරින් මේ සද්දන්තයා බිම හෙළීමට බැරි බව ඔවුහු ප්‍රකාශ කළහ. පසුව ඒ සඳහා කැඳවන ලද්දේ දිවයිනේ නම් දැරූ ඉලක්කයට වෙඩි තැබීමේ ශූරයාය. ඔහු නාවික හමුදාවේ සේවය කළ නාවික කොමදෝරු සෑම් කදිර්ගාමර් නම් විය.

හරියටම ඒ 1950 වසරේ අගෝස්තු මස 09 වැනිදාය. සිය වර්ගයා වෙනුවෙන් දිවි ඇති තෙක් සටන් කරමියි සිතා ඇත් රජු වෙඩික්කරු ඉදිරියට දූවිලි අවුස්සමින් දිව ආවේය. රයිෆලයෙන් නිකුත් වූ වෙඩි උණ්ඩය ඇත් රජුගේ වම් ඇසට ඉහළින් සිරුරට කිඳා බැස්සේය. චිත්‍රපට දසුනක් සේ මෙය නැරඹූ සියලු දෙනාගේ දෙනෙත් තෙත් කරවමින් සද්දන්තයා සිය උපන් භූමිය සිප ගත්තේය.

එදා මෙදා තුර පුරා වසර 62 ක් තිස්සේ අපේ මතකයේ මේ සද්දන්තයා ගැන කුඩා මතකයක් විය. ඒ මතකය යළි යළිත් අලුත් කළේ මේ ගීතයයි.

පනාමුරේ… පනාමුරේ…

පනාමුරේ ඇත් රාජා…//

අභීත නද පෑ හස්ති රජා ඒ

කැලේ සටන් පෑ තේජා

පනාමුරේ ඇත් රාජා..

සොහොයුරු කැල සොයනා වූ නිදහස

සඳහා පණ දුන් ආලේනී

ජාතිය උදෙසා ජීවේ පුදලා

සිහිවේ සිහිවේ නාමේ ඔබගේ

කළේ සටන් පා තේජා

පනාමුරේ ඇත් රාජා

තිරිසන් බවයේ උපනත් ඔබගේ

සිහිවේ එඩිතර භාවේ

සුදු මිනිසාගේ ඒ වෙඩි පහරින්

දිවිපා ළයදී ගියේද සුරලෝ

පනාමුරේ කැලයේදී

පනාමුරේ ඇත් රාජා

(පොත පත ඇසුරින් හා අන්තර්ජාලය ඇසුරින් උපුටා ගැනීමකි.)

2021 ස්වර්ණ පුස්තක සම්මාන සඳහා නිර්දේශ කෘති



කෘතිය - මුක්ති
කර්තෘ - සෝමරත්න බාලසූරිය
සරසවි ප්‍රකාශනයකි
මිල රු. 400

විශේෂයෙන් ම 70 දශකය අවසාන වන විට මෙරට විශ්ව විද්‍යාල දේශපාලනය ගොදුරු වූ පරිහානිය පසුබිම් කරගනිමින් ලියවුණ නවකතාවකි. වාමවාදී මුහුණුවරක් තුළ වුව හුදෙක් ඝෝෂාකාරී උද්ඝෝෂණයෙන් මෙන්ම තර්කවාද හි බුද්ධිහීන බව හමුවේ වික්ෂිප්ත බව කට පත්වන නව පරපුරේ උගත් තරුණයෙකු මෙහි කතා නායකයා වේ. ඊට එරෙහිව වඩාත් පුළුල් දේශපාලන දැක්මක් හා බුද්ධි ප්‍රබෝධයක මධ්‍යස්ථානයක් විය යුතු විශ්වවිද්‍යාල සංස්කෘතියක් වෙනුවෙන් කටයුතු කරන්නට ගන්නා උත්සාහය හමුවේ ඔහු මුහුණපාන අභියෝග ගැටුම් පාදක කොට තිබේ.

කෘතිය - හේරුණ්ඩ කැදැල්ල
කර්තෘ - රූපා ශ්‍රියානි
සූරිය ප්‍රකාශනයකි
මිල රු.700

සාහිත්‍යයේ චෞරවාදී හැසිරීම් ගැන පසුගිය කාලයේ දී මහත් සේ ආන්දෝලනයට ලක් වූ පසුබිමක මෙම නවකතාව එය ම නිමිති කරගැනීම එක් අතකට සමකාලීන උත්තේජනයක් වෙතින් ලද ප්‍රතිනිර්මාණයක් යැයි කිව හැකි ය. කෙසේ වෙතත් කතුවරිය මෙහිදී කැමති වෙන්නේ එවැනි චෞර හැසිරීමක් හමුවේ පැසවන තුවාලයක් සේ එහි වේදනාව උනුලමින් විඳවන ඒ චරිතය ම පාදක කරගනිමින් මෙම කතාව ගොඩ නැගීමට ය. හේරුණ්ඩ කැදැල්ලෙ හි විශේෂත්වය ද එයයි.

ප්‍රතිභා

කෘතිය - කඳ අරණී
කර්තෘ - නිශ්ශංක විජේමාන්න
විදර්ශන ප්‍රකාශනයකි
මිල රු. 500

ඌව බින්තැන්න කලාපයේ වැදි සම්භවයෙන් උපන් දියණියක නූතන අධ්‍යාපනය හමුවේ නව ලොවක් දකිමින් වෙසෙසින් ම අන්තර්ජාලය පරිහරණයෙන් නව්‍ය බුද්ධි සමාජය ආසන්නයේ ඒ ජයග්‍රහණ ද දකිමින් සිට එක්වනම සිය සම්ප්‍රදායේ අණ කිරීම පිළිගනිමින් කුටුම්භයක් තුළට කොටු වීමට අර සියලු හැකියාවන් ප්‍රතික්ෂේප කරන ඇගේ ඒ කතාව එක් අතකින් වැදි සමාජයේ නූතන ඛේදවාචකය පෙන්වා දෙන්නක් බව පැහැදිලි ය. කතුවරයා පවසන අන්දමට මෙය හුදෙක් තවත් එක් නව කතාවකට වඩා අතීත වැද්දාගේ නූතන කඩා වැටීම පිළිබඳ සමාජ විග්‍රහයක් ද වෙයි. විශේෂයෙන්ම ආදිවාසි වැදි සමාජය සම්බන්ධයෙන් ඔහුට ඇති සමීප අත්දැකීම් මෙම කෘතියේ විශ්වසනීයත්වය වෙනුවෙන් මහත් මෙහෙවරක් සිදු කොට තිබේ.



කෘතිය - මධුර මන්තර
කර්තෘ - සුමිත්‍රා රාහුබද්ධ
ජලැට්ෆෝම් ෆෝ
බිල්ටර්නේටි කල්චර් ප්‍රකාශනයකි
මිල රු.800

ගම අත්හැර නගරයට සංක්‍රමණය වෙමින් තමන් වෙනුවෙන් සමාජ පැවැත්මක් නිර්මාණය කරගැනීමට උත්සාහ කළ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයම අතීතයේ සිට ම ඒ හමුවේ ලද වේදනාවන් මානුෂීය අයුරින් ග්‍රහණය කරගැනීමට මෙන් ම සමාජ පෙරළි වශයෙන් එකී තත්ත්ව විග්‍රහ කිරීමට මෙරට සාහිත්‍යකරුවන් දැක්වූ උනන්දුව නවකතා ක්ෂේත්‍රය තුළ දැකිය හැක. එවැනිම පසුබිමකින් මතු වූ වෙනස් ආරක අත්දැකීම් ප්‍රකාශනයක් හැටියට සුමිත්‍රා රාහුබද්ධගේ "මධුර මන්තර" හඳුන්වා දිය හැකිය.

කෘතිය - සිදුරු පත්තර
කර්තෘ - සේපාලි මායාදුන්නෙ
එස්. ගොඩගේ ප්‍රකාශනයකි
මිල රු. 650

රටේ ඉන්නේ දෙපක්ෂයකි. එක් පක්ෂයක් පාක්ෂිකයන් ය. අනිත් පාක්ෂය සාමාන්‍ය රටවැසියන් ය.

අපේ වර්තමානය සම්බන්ධයෙන් පැහැදිලි මතු කිරීමක් වන උක්ත කියමන සම්බන්ධයෙන් අමුතු පැහැදිලි කිරීමක් අවශ්‍ය නොවේ. වර්තමානයේ අප හමුවේ දිග හැරෙන සිදුවීම් අප අත් විඳින්නේ ටෙලි නාට්‍යයක වෙළෙඳ දැන්වීම්වලටත් වඩා එහාට යමිනි. එවැනි සමාජීය දිවි පෙවෙතක් ගෙවන අප ඒ සම්බන්ධයෙන් කිසිවක් ම නොදැන සිටින්නවුන් නොවේ. අනිත් අතට මේ සිද්ධි ගැන දැන වුවත් නොදන්නාක් මෙන් සිටියත්, ඒ සිද්ධි තුළ නම් ගම් රහිතව කියවෙන්නේ අප නම් ගම් සහිතව හඳුනන පාඨය. කඳවුරු ය. පක්ෂ හා පාක්ෂිකයන් ය. එම පක්ෂ හා පාක්ෂිකයන්ට මුහුණ දෙන අනිත් පාර්ශ්



සාමාන්‍ය ජනතාව ය. එනම් අප ය. ඒ සාමාන්‍ය ජනයා කරන්නා වූ ඉල්ලීම් සිදුරු පත්තර තුළින් මෙන් නොරැඳී හැලී යනවා නොවේ දැයි සිතන කල්හි මෙම කෘතියේ සමස්ත කතා ප්‍රවෘත්තිය සමඟ ඒ නම කොතරම් දුරට ගැළපෙන්නේ දැයි සිතා බැලීම වටී. එවන් යුග ගණනාවක් පසු කළ පසු, පරම්පරා කිහිපයකටත් පසු ඊට ම මුහුණ දෙන තවත් පරම්පරාවක කලකිරීම මේ මොහොතේ අප හමුවේ පවතී.

නමක් නොදුන් කථා නායිකාවක් මෙහි එයි. ඒ සම්බන්ධයෙන් කතුවරිය පවසන්නේ සිදුරු පත්තර තුළ ගිලිහී යන ඉල්ලීම් සමඟ වෙසෙන ජනතාවක් වෙනුවෙන් එක් නමක් නියම කරන්නේ කෙසේ ද යන්න යි. එය එසේ එක නමකට ලඝු නොකොට පොදුවේ හැඳින්වීමෙන් තම තමන්ට ඒ වෙනුවෙන් ආරෝපණය වීමට ඒ නිසා ඉඩ සැලසෙන්නේය යන්න ද කතුවරියගේ අදහස යි.

කෘතිය - මැස්සා
කර්තෘ - එරික් ඉලිය-ප්ආරච්චි
එස්. ගොඩගේ ප්‍රකාශනයකි
මිල රු. 450

වර්තමාන සමාජයේ බුද්ධිමය කඩා වැටීම මෙහි ප්‍රස්තුථය යි. උගත් තරුණයෙකු සිය අධ්‍යාපනික පසුබිම හැර දමා බුද්ධි වංචා මෙන්ම ප්‍රලාප පසුපස හඹා යන තත්ත්වයකට පත් වූයේ මන් ද? එහිදී ඔහු කොතරම් සීමාන්තික තත්ත්වයන්ට ගමන් කරන්නේ දැයි කිවහොත් ලෝකය පිළිබඳව පැවැති මධ්‍යකාලීන ඇදහීම් පවා සත්‍ය යැයි පිළිගන්නා තැනකට ම පත් වෙයි. කතුවරයාගේ පෙන්වා දීමට අනුව තාර්කික හේතුවාදය, අත්හරිමින් ආපසු හැරී යන ඔහුගේ මේ ගමන පසුබිමේ පවතින්නේ සිය පවුලේ ඛේදනීය තත්වයන්, අවාසනාවන්ත මරණ හා බැඳුණ පරිහානිමය අත්දැකීම් ය.



ව්‍යාකූලත්වයෙන් මිදීමට ඔහු අසමත් වීම කතුවරයා දකින්නේ මෙසේ ය. "මේ සියල්ලෝ ම අධ්‍යාත්මික මරුවන්ගේ ගොදුරු වෙති. මේ නරුමවාදයෙන් නිදහස් වීමට ඔවුන්ට වාසනාවක් නැත." කතුවරයා පවසන ඒ යථාර්ථයේ ප්‍රතිනිර්මාණය වන්නේ "මැස්සා" ය.

කෘතිය - බාණ කුසුම්
කර්තෘ - කත්‍යානා අමරසිංහ
සූරිය ප්‍රකාශනයකි
මිල රු.650

මෙරට සමාජ පැවැත්ම හා එහි අදහස් ආකල්ප බරපතළ අන්දමින් සීමා වෙමින් පවතින්නේය යන අදහසින් ලියවුණ කෘතියක් වශයෙන් මෙය හඳුනාගත හැක. විශේෂයෙන් ම බ්‍රිතාන්‍යය යටත් විජිතවාදී පැවැත්ම අනුව ගිය වික්ටෝරියානු සුචරිතවාදි ආකල්ප ඊට හේතු වූයේ යැයි සිතිය හැකි බවක් මෙහි දැකිය හැක. කතුවරිය එය මතු කරගන්නා ආකාරයන් හැටියට පුද්ගල හැසිරීම්හි සීමාවන්, ලිංගිකත්වයේ බෙලහීනතා පෙන්වා දිය හැක. විශේෂයෙන් ම අතීත සමාජයන්හි පැවති බහු මෙන්ම විවෘත සමාජ හැසිරීම් නිදහස් ලිංගිකත්වය වර්තමානය තුළ අර කී ආකාරයට සීමාකාරී වීම කතුවරියගේ සිත රිදවා ඇති බවක් පෙනේ. බාණ කුසුම් යනු ඒ සමාජ විවේචනයක් සමඟ නිර්මාණය වූ කෘතියක් බව පැහැදිලි ය.

කෘතිය - ආරාමදාස
කර්තෘ - ආරියවංශ අබේසේකර
විදර්ශන ප්‍රකාශනයකි.
මිල රු. 700

ලංකාවේ වෙහෙර විහාර සංස්කෘතිය හා එහි සමාජ පසුබිමේ ගොඩනැඟුණ, එහෙත් ආගමික බලය හමුවේ විවෘතව කතා බහට ලක් නොවුණ විෂය පරාසයක් මෙම කෘතියෙන් ආවරණය වෙයි. ඒ අනුව මෙරට ආරාම සමාජය තුළ ඒ දාස මෙහෙකාරකම් කරමින් ජීවත් වූ ඒ නිසාම කුලීන සමාජයෙන් වෙන් කොට තැබූ මිනිස් කොටසකගේ දිවි පෙවෙත මෙම නවකතාවෙන් විදාරණය වේ. කතුවරයා මෙහිදී ඉතා දක්ෂ මෙන්ම ව්‍යක්ත ලෙසින් එම සමාජ සංස්කෘතිය තුළ පවතිමින් (හැදෑරීමෙන් හා අත්දැකීමෙන්) සිය කටයුත්ත සිදු කොට තිබීම කෘතියට මහත් වැදගත්කමක් ලබා දී ඇත.



කෘතිය - දෙගොඩවාරම
කර්තෘ - ගාමිණී කන්දෙපොළ
සූරිය ප්‍රකාශනයකි
මිල රු. 400

ඔහු රෝගියෙකි. නිකන්ම රෝගියෙකු නොව විකෘති ලිංගික කාමාශාවෙන් පෙළෙන තරුණයෙකි. මෙම තරුණ

රෝගියා දෙස භාෂණී නම් තරුණ වෛද්‍යවරියක විසින් හෙළන නිරීක්ෂණයද කතාවේ ගලා යෑම තුළ පවතී. නවකතාවේ මුඛ්‍ය තේමාව එය වේ. එහිලා කලාත්මක ප්‍රයෝගයන් වශයෙන් යොදාගෙන ඇති සාම්ප්‍රදායික සංස්කෘතික හඳුනාගැනීම් වන කළු කුමාරයා දෙවියන් විසින් වෙන් කළා වූ ගැහැනු - මිනිස් දෙබිඩි රූප යනාදිය යොදා ගැනීම කතුවරයාගේ නිර්මාණ ප්‍රයෝග ලෙසින් ගත හැකි වේ. මනෝ විද්‍යාත්මක දෘෂ්ටියකින් විකාශනය කිරීමට ගන්නා උත්සාහයක් තුළ ලිංගිකත්වය, උමතු භාවය හා සංස්කෘතික සීමාවල සීමා හේතු කොටගෙන මතුවන පීඩනය පුද්ගල ජීවිතවලට කරන බලපෑම මෙහි නිරූපිත ය. මතුපිට මිනිසා හා සැඟවුණ උමතු මිනිසා සම්බන්ධ හෙළිදරව්වක් වශයෙන් ද ගත හැකි තැනක "දෙගොඩ වාරම" පවතී. ඒ අනුව තමා තුළ සිටින තමාව ම හඳුගැනීමේ අවකාශයක් ඒ තුළින් ම නිර්මාණය වන්නේ ය.

කෘතිය - කෝමල මාණවක
කර්තෘ - ශමෙල් ජයකොඩි
මිල රු. 700
විදර්ශන ප්‍රකාශනයකි.

එක්තරා නගරයකට තදාසන්නව පිහිටි ගමක් පසුබිම් කරගත් මෙම කතාව හුදු සාම්ප්‍රදායික ගැමි සීමාවන් අතික්‍රමණය කරන්නා වූ නූතනවාදී අදහස් හා ක්‍රියාකාරීත්වයක් ඇති තරුණයෙකු හා තරුණියක ඉලක්ක කරගනී. මොවුන් දෙදෙනා තමන් අවට ඇති සාම්ප්‍රදායිකත්වය දෙස බලන්නේ වෛරී ඇසකින් නොවන බව පැහැදිලි ය. එය හුදු අප්‍රසාදයක් ද නොවේ. එය වනාහි සංවර්ධනාත්මක අදහස් වලින් සුසැදි තරුණ වියකින් මතුවන සාධනීය වුත් විවේචනාත්මක වුත් බැල්මකි. කතුවරිය පවසන අන්දමට ඔවුන් දෙදෙනා පෙමින් බැඳෙන්නේ සිංහල ජන සමාජයේ තරුණ ප්‍රජාව මුල් කොටගත් ආර්ථික දියුණුවත් කලා රස විවිධත්වය මත පදනම් වූ අභිලාෂයන් මත ය. ඒ අනුව ඔහුගේ ඉලක්ක පැහැදිලි ය. හුදු සාම්ප්‍රදායිකත්වය යන්න පිළිගත හැකි පැවැත්මක් නොවේ. කාලයත් සමඟ ප්‍රගමනය යන්න නියත අවශ්‍යතාවය ම වේ.



කෘතිය - I.D
කර්තෘ - මොහාන් රාජ් මඩවල
බිසෝ ප්‍රකාශනයකි
මිල රු. 750

නවකතාකරුවෙකු තමන් සම්බන්ධයෙන් ම ඇති කරගන්නා අවලෝකනය, අවසානයේ දී වෙනත් ම සිදුවීම් තුළ තැන්පත් වුව ද තමනගේ ජීවිත අනුභූති ඒ තුළ දැකීමට පුළුවන් කමක් කතුවරයෙකුට තිබේ. එහෙත් පාඨකයාට වැදගත් වන්නේ එය කතුවරයාගේ අත්දැකීමක් ද නොවේ ද යන්න නොවේ. එය තමන් විෂයයෙහි බද්ධ වන්නේ කෙසේ ද යන්න යි. ඒ නිසා ම නවකතාකරුවෙකු සිය අත්දැකීම් නිරූපණයේ දී එය කොතරම් විස්තෘත අත්දැකීම් ප්‍රවාහයක් බවට පත් වන්නේ ද යන්න ගැන ස්වයං විමසීමක යෙදීම වටී. මොහාන් රාජ්ගේ අයි. ඩී. නවකතාව කෘතියක් හැටියට ගත් කළ රහස් මං ඔස්සේ යමින් සොයාගන්නට තැත් කරන්නා වූ අනන්‍යතාවක් පිළිබඳ කතාවක් යැයි සිතමි. ඒ අනුව මුලදී කී ආකාරයට මෙහි එන චරිත කිහිපය සොයා යන්නේ ද කතුවරයාගේ අභිප්‍රාය පරිදි ඒ නොදත් අනන්‍යතාව ද? යන්න විමසීම වටී.

කෘතිය - ජීවිතයේ ඔසිල් පැල්ලම්
කර්තෘ - හරිඳු ශ්‍රී ලොකුගමගේ
සයුර ප්‍රකාශනයකි
මිල රු.750

පොදුවේ ගත් කළ සිංහල නවකතාවට ආගන්තුක රථ වාහන සංස්කෘතිය එමෙන් ම නිර්චිත ගාහරයකට ගොනු නොවූ ගාහර කිහිපයක් මත විකසනය වූ වෙනස්ම ආරක ආඛ්‍යානයක් වශයෙන් මෙය හඳුන්වා දී තිබේ. ඒ අනුව යමින් එහි මතුපිට පවත්නා ත්‍රිලර් ලක්ෂණ මත නොරැඳෙමින් ඔබ්බට යෑමට පාඨකයා තීරණය නොකළහොත් ඔහුට මෙහි ඇති බොහෝ අතුරු කතා මඟ හැරී යාමේ අවදානමක් පවතින බව ද ඒත් සමඟම පෙන්වා දී ඇත. මෙහිදී අපට ඇන්තනී, දිනේෂ්, ප්‍රතාපසිංහ, කපිලජිත් හෝ සමුද්‍රා තරමට ම ශ්‍රී විල් ජයන්ත ද පුත්තලමේ ධනා, වීනා ද පාහියන්ගල උපුල් ද කාකවත්තේ සිවා ද වැදගත් වන්නේ ඒ නිසා ය. ප්‍රතාපසිංහගේ ඔස්ටින් වාහන තරමට ම මදනායකගේ එස්කෝට් එක ද බිම්බාරාමයේ බෙන්ස් එක ද අනුඩිගේ වීල් බැරෝව ද වැදගත් ය. මේ සම්බන්ධයෙන් තවදුරටත් පෙන්වා දී ඇති අන්දමට නවකතාව යනු පාඨකයාත් සමඟ ඇති කරගන්නා යුද්ධයකි. දුර්මුඛ නොවන පරිදි සේනාධිපතිවරුන්ට සැලකීම යුද්ධය ඇති කරන්නාගේ වගකීමක් වේ. එමෙන් ම සැබෑ යුද්ධය පවතින්නේ පෙනෙන සතුරා සමඟ නොව නොපෙනෙන යක්ෂයෙකු සමඟ ය. එවැනි අත්දැකීමක් වෙනුවෙන් මේ නවකතාව පවතින බවක් ඉන් හැඟවේ යි.



සෙංකොට්ටං ඒ අපූරු සුවඳේ කතාන්දරය

2012 විශිෂ්ඨතම නවකතාව ලෙස රාජ්‍ය සම්මානය, විද්‍යෝදය සම්මානය හා ගොඩගේ සම්මානය දිනූ මහින්ද ප්‍රසාද් මස් ඉඹුලගේ "සෙංකොට්ටං " නවකතාව පහුගිය කාලයා පුරා බොහෝ කතා බහට ලක් වූ නවකතාවකි. 1930 දශකයේ රත්නපුරයෙ පල්ලෙබැද්ද නම් ග්‍රාමයක් මූලික කරගෙන දිග හැරෙන සෙංකොට්ටං නවකතාව මගින් මෙරට සමාජයේ පැවති හා පවතින කුල ක්‍රමය පිලිබඳවත් එම ජනයාගේ විකාශනය පිළිබඳවත් අපූරු කතන්දරයක් පාඨකයා තුල මවයි. අපේ සමාජ ක්‍රමයේ පැවති උස්මිටිකම් හා සංස්කෘතික ගැටුම මේ කතාවෙන් විස්තර වේ.

කතාවේ සාරාංශය

රෙදි හෝදන පවුලක වැඩිමහල් දියණිය වූ පොඩිනා අනගිහාමි නම් ප්‍රභූ පවුලක පිරිමියෙකු සමඟ එක් දිනක් තුළ හටගත් ප්‍රේමයක් නිසා ගැබ්බර වෙයි. ඇය තමාට සිදු වූ අනතුරට වන්දි ගෙවන්නේ තමාගේම කුලයේ, ගමේ නෝන්ජල් පිරිමියෙකු වූ නම්බු හේනයා උපක්‍රමශීලී ලෙස පෙම් දැලේ පටලවා ගනිමිනි. ඔවුන්ගේ දරුවා බබා හේනයා ය. (සැබෑ පියා අනගිහාමි වේ) නම්බු හේනයා පවුල් ජීවිතය විෂයෙහිදීත් සාමාන්‍ය එදිනෙදා වැඩපොලේදීත් පෙන්වන අසාර්ථක බව නිසා මේ පවුලේ වගකීම් සහගත පිරිමියා ලෙස නවකතාවේ විස්තර වෙන්නේ පොඩිනාගේ පියා වන වීරප්පුලි හේනයාය. වීරප්පුලි හේනයාත්, බබා හේනයාත් සමාජය ඉදිරියේ කුල හීනයන් ලෙස නොයෙක් නින්දා විඳියි. පොඩිනා තම පරණ ප්‍රේමය යළි හමුවන්නට යාමේ ප්‍රීතිය බුක්ති විඳීමට ගොස්" මරණය වැළඳ ගනියි. පොඩිනාගේ නංගී හීන් රිදී තම ගමේ දඩබ්බර තරුණයෙකු සමඟ ඇති කරගත් සරාගික සම්බන්ධය දුර දිග ගොස් විවාහ වී අවසානයේ අනාථ වී යළි නිවෙසට එයි. පවතින ක්‍රමය තුල බබා හේනයාට අධ්‍යාපනයේ අයිතියද අහිමි වී යයි. අවසානයේ වීරප්පුලි හේනයා මානසික රෝගියෙකු දක්වා පිරිහෙයි. මේ අතර වීරප්පුලි හේනයාගේ පුත්‍රයා – ලූවිස් හේනයා මැණික් ජාවාරම්කාර පොහොසතකු සමඟ මිත්‍ර වී ඔහුගේ අකාල මරණයෙන් පසු මුදලාලිගේ දේපළට උරුමකම් කියන දියණියක් විවාහ කරගෙන නාගරික ජීවිතයට ඇතුලු වී පොඩිතිස්ස මුදලාලි නමින් ප්‍රසිද්ධ වෙයි. බබා හේනයා තම ජීවිතයේ දෙවැනි අවධිය ගෙවන්නේ ඔහුගේ මාමා වන පොඩි තිස්ස මුදලාලි සමගය. නාගරික ව්‍යුහයට අතුළත් වන බබා හේනයා හොඳ අධ්‍යාපනයක් ලබයි. වර්ෂ 2006දී නවකතාව අවසානයේ ඔහු කෝටිපති ව්‍යාපාරිකයෙකුව තමන්ගේ මිණිබිරියගේ ලන්ඩන්- ඔක්ස්ෆර්ඩ් සරසවි ආචාර්ය උපාධි නිබන්ධනය වන "ආසියාතික රටවල පැරණි කුල ක්‍රම" පිළිබඳ තොරතුරු සොයා දීමට ඇයත් සමග උපන් ගමට වික්ටර් සූරතිස්ස ලෙස පැමිණීමෙන් කතාව අවසන් වේ.

නවකතාවේ පොඩිනාගේ චරිතය තුලින් හා ඒ වටා ගොනු වන සිද්ධීන්ගෙන් සමාජයේ පැවති ලිංගික පීඩනය හා පෙලඹුම නිරූපනය වේ. වරදෙහි බැඳෙන ගැහැණියක් උව එම වරදෙහිම ඵලය වන තම පුතු "බබා හේනයා" හා පොඩිනා අතර ඇති වන ධාරක ප්‍රේමය කතාව පුරාම අව්‍යාජව ඉස්මතු වේ.

115 පිටුව…….

නොදැනුවත්වම තම පිය සොයගෙන යන මේ දරුවාද එකහුස්මට යයි. මේ දරුවා අනගිහාමිගේ කපාපු පළුව යැයි පොඩිනාට සිතෙයි. ඇස් දෙක,නහය පමනක් නොව පැහැයද ඒ සමානයි.වෙනසකට ඇත්තේ බබා හේනය යන නම පමනි. ඒ නම තම දරුවාගේ අනාගතයම වෙනස් කර තිබේ. එහි පාපය තමාට අත් වනු නිසැක බව පොඩිනා හිතුයේ දැඩි කලකිරීමකිනි. අනගිහාමි හමුවී මේ දරුවාට සාධාරණ යම් දෙයක් කර ගැනීමට හැකිනම් පමනක් වුව සෑහෙන බව ඇය කල්පනා කලාය..

"මයෙ රත්තරන්ට යන්ට පුලුවන්ද" මන් උඹ වඩාගන්නද?"

"මට පුලුවන් අම්මේ..තව හුගක් දුරද"

"නෑ දැන් ලගයි මගෙ අම්මා"

"තව ස්වල්ප වේලාවක් ගමන් කල පසු යම් තැනකදී ඇයට යමක් දැනී පපුව තදින් ගැහෙන්නට විය. ඒ තමාගේ ආත්මය ආදරය නැමැති වට්ටිය මත තබා නෑඹුල් මල් මිටක් සේ දෝතින්ම නන්නාදුනන තරුණයෙකුට පුජා කල සුවිසල් ගල් තලාවයි."

කතාවේ සංවේදීම මොහොත පොඩිනාගේ මරණයයි. අශාව හඹා යන පොඩිනාට අවසානයේ අත්වන මේ ශෝචනීය ඉරණම මගින් නවකතාකරුවා පාඨකයා තුල මේ නොනිත් ආශාව පිළිබඳ ප්‍රශ්ණාර්ථයක් මතුකරයි. ඒ සිදුවීම පාඨකයා තුල ප්‍රකම්පනයක් ඇති කරවන අතර. එහිදී මස් ඉඹුල යොදා ගන්නා රචනා ශෛලිය ඉතා තාත්වික හා සිනමාත්මක වේ.

කතාව අවසන් වන්නේ අවුරුදු 70කට පසු "බබා හේනයා" වික්ටර් සූරතිස්ස නමින් කෝටිපති ව්‍යාපාරිකයෙක් ලෙස කල් ගෙවන සමයකිනි. ඔහු තව මිනිපිරිය සමග වන සංවාදය කතාවේ ඉලක්කගත දෘෂ්ඨිය වෙත අපව ගමන් කරවන්නේ හරිම අපූරුවටය. මෙතෙක් වෙලා දශක හතකට පෙර ජීවත් වූ චරිත හා ගැටගැසුනු කතාව නුතනය කරා එන්නේ කාලය විසින් වෙනස් කරන ලද මෙරට සමාජ ක්‍රමය පිළිබඳ සියුම් සහකම්පනයක් පාඨකයා තුළ රඳවමිනි. කුල හීන රෙදි අපුල්ලන පවුලක උරුමක්කාරයෙක් වන වික්ටර් සූරතිස්ස(බබා හේනයා) අවසානයේ කෝටිපති ව්‍යාපරිකයෙක් වූවත් ඔහුට ඔහුගේ යටගියාවේ සුවඳ දැනේ. තම ආතා වන වීරප්පුලි හේනයාගේ අව්‍යාජ සිතුම් පැතුම් හා තම මව සමග වූ ඒ අපූරු ජීවිත බැඳීම ගමට යන සූරතිස්සට දැනේ. මිනිපිරිය සමග තම මව නිදන් කල භූමියට යන ඔහුට තම අතීතයේ සුවඳ කතාව අවසානයේ දැනෙන්නේ මේ ආකාරයෙනි.

"ආයෙමත් අර සුවඳ දැනෙනවා….රෙදි සෝඩ කලවම් වෙච්චි තම්බපු රෙදි සුවඳ, ඒ සුවඳ මට හැමදාකට දැනේවි. ඔව්..ඉදිරියටත්, මියයන්න කලින් ගන්න අන්තිම හුස්මෙනුත් ඒ සුවඳ මට දැනෙයි…"

වීතරාගී විරාගයේ අරවින්දයක් වූ 'අරවින්ද'

1956 දී පළවූ විරාගය මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ශ්‍රේෂ්ඨ කෘතිය පමණක් නොව සිංහලයෙන් ලියා තිබෙන ඉතාම අගනා නවකථාව බව මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් ලියා තිබුණි. ගුණදාස අමරසේකරයන් ලියා තිබුණේ පසුගිය කාලය තුළ (1958) එම නවකතාව තමාගේ සුහද මිත්‍රයා වූ බවත් කලකිරීමෙන් හා හුදකලාවෙන් පීඩිතව ගිය සිත් ඇති ඇතැම් මොහොතක තමා එය රැගෙන කුමන පිටක් වුවද පෙරළා කියවීමෙන් මහත් අස්වැසීමක් ලද බවය.

සිංහල නවකථා මඟින් බිහි කෙරුණු චරිතයන් අතරින් වැඩිම විවේචනයන්ට හා වැඩිම දෝෂාරෝපනයන්ට ලක්වූ චරිතයක් වේ නම් ඒ විරාගයේ 'අරවින්ද' යි. 1965 දී මාර්ටින් වික්‍රමසිංහ විසින් ලියා පලකරන ලද 'නවකථාංග හා විරාගය' කෘතියේ ද දිගු පරිච්ඡේදයක් අරවින්දගේ චරිතය විවේචනය සඳහා වෙන් කොට ඇත. එමෙන්ම සාහිත්‍ය විචාරකයන්ගේ සිට විවිධ තරාතිරමේ පුද්ගලයන් විසින් 'අරවින්ද' ගේ චරිතය නෙක කෝණයන්ගෙන් අරුත් ගන්වා ඇත.

'විරාගය' මූලික වශයෙන් ගලා යන්නේ අරවින්ද නම් එක් පුද්ගලයෙකුගේ ස්වයං ආත්ම විවේචනයක් ලෙසය. එය ඔහුගේ මරණින් පසු එය කියවන 'සැමී' විසින් සංස්කරණය කොට ඉදිරිපත් කරන්නක් සේ නවකථාවෙහි දැක්වේ.

"කවර මනුෂයෙකුගේ චරිතයෙහි වුවද චරිතයෙහි අංග එකිනෙකින් වෙන් කොට හැඳිනගත නොහැකි දේදුන්නක් වැන්නයි අරවින්දගේ සංකීර්ණ චරිතයෙහි එක් අංගයක් වත් නිශ්චය වශයෙන් හඳනාගත නොහැකි වූ මම සිතුවෙමි. දේදුන්නෙහි වර්ණ එකිනෙක වෙන් කොට හැඳිනගැනීමට වැයම් කරන්නා මිරිඟුව ඔස්සේ ගිය එකකු මෙන් වෙහෙසෙයි" – පිටුව 4, පළමු පරිච්ඡේදය (විරාගය)

"අරවින්ද තමාගේ මව්පියන්ටත් සහෝදරියටත් දැඩි ලෙස ඇල්ම කළේය. එහෙත් ඔවුන්ගේ වුවද හොඳගති මෙන් නරක ගති මිනිහෙකුගේ මළකඳ කපා පිරික්සන ව්‍යවච්ඡේදකයකු මෙන් ඔහු හෙළි කරයි. ඔහු තමාගේ චරිතයෙහි හොඳ තැන් මෙන්ම නරක තැන්ද අහුමුළු වල සැඟවුණු අශෝබන තැන්ද හෙළි කරනුයේ පාපෝච්ඡාරණයෙන් ආත්ම ශුද්ධිය පතන්නෙකු ලෙසිනි" – පිටුව 11, පළමු පරිච්ඡේදය (විරාගය)

"ඔහු බුද්ධියට වඩා දියුණු කල හැඟීම් ඇත්තෙක් යි මට නිසැකවම වැටහිණි. ඔහු අනුන්ට දැක ගත හැකි සේ කෝප නොවීය; ශෝක නොවීය; ඔහු තමාගේ දයාව, කරුණාව, ආදරය වචනවලට නඟා කටින් පිට නොකළේය. එහෙත් ඔහු අප මෙන් කෝප වන්නෙක් විය. කෝපය නැඟුණු වහාම ඔහු එය අනුකම්පාවට හරවා ගත්තේය. කෝපය වුවද ආදරය වුවද මැඩ ගන්නට වැයම් කරන්නා සිතින් පීඩා විඳියි. අරවින්ද ගැනියකට ආලය නොකරන, කෝප නොවන කෙළෙසුන් මැඩ ගත්තෙකු ලෙස ජීවත් වූයේ තමාගේ ඇතුලු හදට වද දීමෙන් බව නිසැකය. අරවින්දගේ චරිතය හාරා ගරා එහි ඇති තිරුවාණ ගල් හා බොරළු මෙන්ම මැණික් ද සෙවීමට මා තුළ දැඩි කුහුලක් හට ගත්තේය" – පිටුව 5, පළමු පරිච්ඡේදය (විරාගය)

අරවින්දගේ චරිතය කියවීමකින් තොරව විරාගය කියවිය නොහැක. අරවින්දගේ චරිතය තනිකමෙන් පෙළුණු හා තර්ක බුද්ධියේත්, ව්‍යවහාරයේත් සට්ටනයන් හේතුවෙන් ජීවිතය කෙරෙහි දැඩි උදාසීනත්වයක් දැක්වූයෙකු ගැන හෙළි කරයි. විරාගයේ ඇති අනෙක් චරිත අතරින් මේනකා, සරෝජනී, සිරිදාස හා බතී ප්‍රධාන වෙති. අරවින්දගේ චරිතය බොහෝ විට හැඩ ගැසෙන්නේත්, ගලා යන්නේත් ඔවුන් මූලික කොටගෙන ඔවුන් වටාය.

"මගේ ජීවිතයේ හතරමං හන්දිය සරෝජනී නිසා උපන් ආලයයි. ගතයුතු මඟ නිශ්චය කොට දැඩි සිතින් ඒ මඟ ගැනීමට තරම් ධෛර්යක් මට නොවීය. සරෝජනී සිරිදාස හා විවාහ වූ පසු මා විසින් ගතයුතු දෙමඟින් එකක්වත් ගැනීමට වුවමනා නිර්භයත්වයෙන් මම හීනයෙක් වීමි. වලට වැද හෝ අරමකට වී අපිස් ලෙස ජීවත් වීමට නිර්භයබාවයකුත් දැඩි සිතකුත් වුවමනාය. මම ඒ දෙකින්ම තොර වූවෙක්මි." – පිටුව 190, (විරාගය)

තමන්ගේ නිවස සොයුරිය විසින් අත්පත් කර ගනිද්දීත්, තමන් ප්‍රෙමකළ තරුණිය අනෙකකු විසින් විවාහ කර ගනිද්දීත් ඔහු ඒ සියල්ල උපේක්ෂාවෙන් ඉවසීය. තම නිවසේ මෙහෙකාරියගේ දියණියට තම වියදමින් උගන්වා පසුව ඇයව විවාහ කරදුන් ඔහු ඊට එරෙහිව වූ සමාජ අපවාදයන් කෙරෙහි නැසු කන්ව සිටියේය. අවසානයේ ඒ හේතුවෙන්ම සිතින් හා කයින් දුර්වල අයෙකු විය. නමුත් අවසානයේදී ඔහු මියයන්නේ ඒ හේතුවෙන් ඇතිවූ කළකිරීමෙන් නොවේ. ජීවිතයේ අවසාන භාගයේදී ඔහු මනුෂ්‍යය ජීවිතය සම්බන්ධයෙන් වූ සනාතන සත්‍යයක් සාක්ෂාත් කර ගනියි.

"බතීත් සරෝජනීත් පිළිබඳ මගේ හැඟීම මැරෙන්නට යන පක්ෂියෙකු මෙන් අත්තටු සලතියි මට සමහර විට හැඟේ. නොතින් ආසාව මට දැන් මගේ ශෝකයට නොව සොම්නසට හේතුවෙයි. මගේ ආත්ම විශ්වාසය නැතිවිය. තැණවතීගෙන් සාත්තු ලබමින් මා ජීවත් වූ කාලය මරු කතරක ජීවත්වීමක් ලෙස හැඟේ. මගේ ලෙඩේ සුව නොවේ. එහෙත් කරුණාව, දයාව, ඇල්ම යන ආදී මිනිස් දහමින් නොතොර තැනක ජීවත්වීම නිසා මගේ කල කිරීම දුරු විය. මා වඩාත් කලකිරුණේ බතී නිසාය. ඈ නිසාම මගේ කලකිරීම තුනී විය. මනුෂ්‍ය ජීවිතය මැනෙන මිනුමක් වශයෙන් නම් කුල සිරිත් හා ගුණ දහම් වූ කලී කාලය, දේශය, අවස්ථාව අනුව වෙනස් නොවන කෝදුවක් නොවේ." – පිටුව 201, (විරාගය)

විරාගය නවකතාවේ අරවින්දගේ චරිතය බිහි වූ අයුරු පිළිබඳව වික්‍රමසිංහ ශූරීන් මෙසේ දක්වා ඇත.

"දවසක් පාණදුරේ මගේ නෑයෙකුගේ ගෙදර ගිය ගමනකින් තමයි අරවින්ද නම් චරිතයට වස්තු බීජය ලැබුණේ. මගේ නෑයාගේ ගෙදරින් දවල් බත් කා බොහෝ වේලාවක් කතා කරමින් අපි හිටියා. අප සිටි ගෙදර ඉදිරිපිට පාරෙන් අනික් පැත්තේ ගෙයක් පෙන්නමින් මගේ නෑයා අපූරු තොරතුරක් හෙළි කළා.

"ඒ ගෙදර ඉන්නේ තනිකඩයෙක්. එයා වැඩ කළේ ආණ්ඩුවේ කන්තෝරුවක ක්ලාක් කෙනෙක් හැටියට. එයාට අභිධර්මය ගැන හොඳ දැනුමකුත් තියෙනවා. පුස්කොළ පොත් එයා එකතු කරන්නේ ලොකු සතුටකින්. ඉස්කෝලේ යන කාලේ රසායන විද්‍යාව ඉගෙන ගත්තලු. දැනුත් රසායන විද්‍යාව පොත් කියවනවා. මිනිහට කෑම උයලා දෙන්නේ ඩ්‍රයිවර් කෙනෙකුගේ දුවක්. ඩ්‍රයිවර් කුලියට කාර් එළවනවා. ඩ්‍රයිවරුයි එයාගේ දුවයි එක්ක මිනිහා ඔය ගෙදර ඉන්නේ. මේ නිසා සේරම නෑයෝ එයාව අතහැර දාල."

අපි යමුද ඒ ගේ පැත්තට. එයා දැක ගන්න මම ආසයි" මගේ ආසාව නෑයට කිව්වා.

"යමු"

ඔහු අපිස් ලෙස ජීවත්වෙන හොඳ මිනිසකු ලෙසයි මට ඔහු හා කතා කිරීමෙන් වැටහුණේ. මගේ නැයා කිව්ව වගේ ඔහුගේ මේසය මත අභිධර්ම පොත්, රසායන විද්‍යා පොත් ගොඩ ගහල තිබුණා. ටික වේලාවක් කතා කළාම ඔහු යන්තර, මන්තර, කෙම් ගැනත් කතා කළා. එයාගේ මනස පිරිලා තිබුණේ. අභිධර්මය, රසායන විද්‍යාව, පැරණි කවි පොත් වලින්.”

මාටින් වික්‍රමසිංහයන්ගේ විරාගය කෘතියට වස්තු බීජ වී ඇත්තේ මොහුය.

වරක් තිස්ස අබේසේකරයන් ප්‍රවීණ ගීත රචක බණ්ඩාර ඇහැලියගොඩට පවසා තිබුණේ අරවින්ද සැබෑ විප්ලවකාරී චරිතයක් බවය. ඔහු නිෂ්ක්‍රීය හෝ පරාජිත හෝ චරිතයක් නොවන බවය. 71 කරන ලද අරගලයට වඩා අර්ථවත් අරගලයක යෙදුණු අයකු ලෙස ඔහු මා පිළිගන්නා බවය. කොටින්ම අරවින්ද චරිතය තුළ සිදුහත් චරිතය තමා දකින බවද පවසා තිබුණි.

අරවින්දගේ (කටහඬ)

නොනිත් ආශාව දැන් මගේ ශෝකයට නොව සොම්නසට හේතු වෙයි. මගේ ආත්ම විශ්වාසය නැති විය. මගේ ලෙඩේ සුව නොවේ. එහෙත් කරුණාව දයාව ඇල්ම යනාදී මිනිස් දහමින් නොතොර තැනක ජීවත්වීම නිසා මගේ කලකිරීම දුරුවිය.

“පැතුම් පතන්නේ නෑ
පෙරුම් පුරන්නේ නෑ
ඇලුම් කරන්නේ නෑ
යළි කිසිදා
නිසසල සුවය සදා”
(විරාගය සිනමාපටය/තිස්ස අබේසේකර)

https://www.lankadeepa.lk/Rasawitha

https://gayanthapandula.wordpress.com

පොතක වත

එක්තරා සවස් යාමයක තරමක් ගොත ගසන පුද්ගලයෙන් කුඩා ගැහැනු දරුවන් තිදෙනෙක් සමඟ බෝට්ටුවකින් තේම්ස් නදිය තරණය කලේ ය. බෝට්ටුවෙන් බැස පැය තුනකට පමණ පසු මෙම පුද්ගලයා අතින් ලියැවුනු එම කතාව අදටත් කා අතරත් කතාබහට ලක්වෙයි. මොහු නමින් ඩොජ්සන් ය. (චාල්ස් ලුට්විජ් ඩොජ්සන් (1832 - 1898)) එනමුත් ඔබ මොහුව හඳුනන්නේ ඒ නමින් නොවේ. එනමුත් ඔහුගේ සැබෑ නම එයයි. ඉරිදා දිනවල පල්ලියේ

දේශනා කල නිසා මොහුව ෆාදර් ඩොජ්සන් යැයි සමහරු ඇමතුවේ ය. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ගණිතය උගන්වන දිනවලදී මොහුව මහාචාර්ය ඩොජ්සන් යැයි සිසුන් හා අනෙක් ගුරුවරුන් ඇමතුවේ ය.

පෙරදි කී බෝට්ටු සවාරියේ දී මොහු විසින් කුඩා ගැහැණු ළමුන් තිදෙනාට පුදුමාකාර කතාවක් තමන් විසින් ගොතා කියන ලදි. එය කෙතරම් සාවධානව ඔවුන් අසා සිටියේද කිවතොත් තමන් යන්නේ බෝට්ටුවක යැයිද එම දැරිවියන්ට අමතක විය. ඔහු ඔවුන්ට කීවේ නින්දට පත් වූ පුංචි ගැහැණු ළමයෙකු හාවෙකුගේ ගුලකට වැටී විශ්මලන්තයක අවධි වන සැටි ඇතුලත් වන කතාවකි. මෙම ගැහැණු දරුවන් තිදෙනාගෙන් එක්කෙනෙක්ගේ නම ඇලිස් විය. මෙම දරුවන් තිදෙනා කියා සිටියේ එම කතාව නැවත කියවීමට ලියා දෙන ලෙසයි. එමනිසා මෙම මහාචාර්යවරයා මෙම ඉල්ලීම නිසා එදිනම රෑ නොබලා මෙම කතාව ලිව්වේ ය. මොහු මෙම කතාවට නම දැම්මේ ' විශ්ම දේශයට ගිය ඇලිස්ගේ හපන්කම් ' ලෙස ය.



පොත මෙසේ ලීවත් ඔහු එය මුද්‍රණය කරන්නට සිතුවේ නැත. මන්ද ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙක් විකාර ළමා කතා ලියන්නෙක් යැයි මිනිසුන් දැනගන්නවාට ඔහු අකමැති විය. එය තමන්ගේ ගෞරවයට හානියක් යැයි ඔහු සිතුවේ ය.

දිනක් ඩොජ්සන්ගේ මිතුරෙක් දූලි අතර තිබූ මෙම පොත සොයාගෙන කියවූ අතර ඔහුගේ සිත මෙම පොතට තදින්ම ඇදී ගියේ ය. ඔහු මෙම පොත මුද්‍රණය කිරීමට මූලිකත්වය ගත් නමුත් ඩොජ්සන් එයට කැමැත්තක් නොදැක්වීය. මන්ද පෙර දැක්වූ හේතුව යි. එමනිසා ' විශ්ම ලන්තයේ ඇලිස් ' (Alice In Wonderland) ප්‍රකාශයට පත් වූයේ ව්‍යාජ නමක් යටතේ ය. ඒ නම ' ලුවිස් කැරොල් ' විය.

එය අති සාර්ථක පොතක් බවට පත් විය. ඉංග්‍රීසි කතා කරන ලෝකය අතර එය ඉතා සීග්‍රයෙන් ජනප්‍රිය විය. ඉතා ඉක්මනින්ම එම කතාව විවිධ භාෂා ගණනාවකටම පරිවර්තනය විය. වසරින් වසර මෙම කතාව තව තවත් ජනප්‍රිය විය. 1865 දී ලියන ලද මෙම කෘතිය එනම් වසර එකසිය පනහකට ආසන්න කාලයකට පෙර ලියන ලද මෙම කෘතිය අදටත් ලොව ජනප්‍රියම ළමා කතාව ලෙස වැජඹේ.

Web

https://wasithaya.blogspot.com/2016/10/blog-post_18.html

දෙසැම්බර් 31

දින දසුන තුල ඉතිරි වී ඇත   එකම එක තව එක්   දිනක්
නිදිවරාගෙන බලා ඉන්නේ ගෙවෙන තුරු   අන්තිම   පැයක්
පන්සලේ දේවාලේ සමහරු සිටිති ගෙන   අත මල්   මිටක්
පුරා මදු විත බදාගෙන ගත ගෙවති මේ   රැය තව   අයෙක්

කැරකෙනා බව මෙලොව සැතපුම් දහක් තුලදී   එක් පැයක්
ගෙවෙන බව ඒ අනුව කාලය කිසිවෙකුට නැත   නිච්චියක්
අන්ද මන්දව කුස පුරන්නට වෙහෙස වෙනු මිස නැත   යමක්
අළුයමින් පසු වටය කැරකී නැවත එනු ඇත   කළුවරක්

සිනාසෙනු ඇත දින දසුන නව සුබ පතාගෙන   හෙට දිනක්
සම්මතය ලෙස පටන්ගනු ඇත තවත් තුන්සිය   හැට පහක්
දුවන මුත් අප නොදන්නෙමු එහි තිබේ   පොදු එක   චක්‍රයක්
දෙසැම්බර් තිස් එක උදාවිය සිතන්නට දී තව   යමක්

ජී. ඒ. එම්. අයි. ගුණරත්න

විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති

දසුනට කවියක්

කන්තෝරුවේ කොරිඩෝරය මැදක ඉඳං
වේවැල් කැඩුනු පැරණිම පුටු ලඟට කරං
එක සීරුවට මුව, ගෙල බිම දෙසට යොමං
මෙහෙයුම කරනයුරු පෙනුනා හිතට අරං

අරුමැති රටාවට වේවැල් අතින් ගෙන
පුටු මත එහේ මෙහෙ දිව්වා තැනින් තැන
වියමන් අපූරුව නිමවූ එකක් ගෙන
බැලුවා අගය කරමින් ඔබෙ දෙඅත් ගැන

නොපෙනෙන නමුත් ඔබ පෑ අසිරිය පෙනුනා
සිටි තැන මගේ හදවත නවතිනු දැනුනා
තිබුණත් දෙනෙත් නොපෙනෙන ඇතැමුන් කරනා
දිරියක් නොමැති වැඩ ගැන කඳුලක් වැටුනා

තැන තැන කතා කරමින් වැඩකට නොමැතී
කාලය කා දමන මිනිසුන් හෙටත් වෙතී
නොගෙනම නැවතුමක් කරනා වැඩ හැඩැතී
ලොව දිනු ඔවැනි මිනිසුන් පැසසුම් ලබතී

රම්‍යා ලාලනී

විගණන අධිකාරී (AGL/B)

හිතන්නට යමක්

හුස්ම දෙන පරිසරය
රැකගන්නට වෙහෙසෙන්න
යුතුකමක් වගකීමක්
ලෙසින් සලකමු බිඳක්

කුසට අහරත් සොයගනු රිසියෙන්
දළ ඇතා බල ඇතා සතා සිව්පාවන්ද
ගම්වදි සැම විටම
හේතුව කුමක්දැයි විශ්ලේෂණය
කලොතින් සිහිසන්ව
නිරීක්ෂණ, නිගමන, නිර්දේශ කා හටද?

වරද ඇත්තේ
අප තුළම යැයි
පිළිගන්න වෙයි අපට
අවිවාදයෙන්ම

එකතුවන ප්ලාස්ටික්, පොලිතීන් කසළ ලෙස
විසි නොකර තැනින් තැන
ප්‍රතිචක්‍රීය කරණයට
යොමු කරොත් හැම විටම

පස ජලය හා වායු දූෂණයද වලක්වා ගත හැකිය හෙට දින
අලි මිනිස් ගැටුමකින් තොර
පරිසරයක් තනන්නට
දායක විය හැකිය සැමවිටම

මනුසතා යහපත්ව කළොත් යුතුකම පරිසරයට
පෙනෙන නොපෙනෙන සතා සිව්පාවා
රැකගනි තම ජීවිතය
නිදහස්ව රිසි ලෙසින්

එක්වන්න ඔබ සැවොම
මිහිතලය සුරකින්න
විගණනයේ ඇසින්
නිරතුරුව පුරෝගාමිවෙමින්

එස්. එස්. කොඩිප්පිලි
විගණන අධිකාරි (FWL/B)

2022

ගතවූ වසරේ සිදුවූ දේවල් මතක් වෙන වාරයක් ගානේ
අළුත් වසරට සුබ පතන හැටි සිතාගන්නට තවම බැහැනේ
පැලැස්තර අලවමින් යන මේ ගමන ගැන දුක හිතෙනවානේ
අඳුරටම දොස් කියනු වෙනුවට එළිය දල්වමු අපිම පහනේ

අනාගතයක් නැහැ කියාගෙන එකම තැන කැරකෙන්න බැහැනේ
නහය කැපුවොත් පාඩු එමටයි ඇති වැරුද්දට සමඟ මුහුණේ
පිල් බෙදීගෙන ගුටිත් ඇනගෙන ගියොත් අපහට හෙටක් නැහැනේ
වෙනස් කලයුතු දේ සොයාගෙන කරමු වෙනසක් එයයි ඕනේ

ජී. ඒ. එම්. අයි ගුණරත්න

විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති

සුරකෙමු !

දිවි මාවතේ රිසි සේ අපි ඇවිද ගියා
අපටත් හොරා මුළු විශ්වය ඇවිල ගියා
මල්විය, යෞවනය මේ සැම අඳුරේ තියා
ජීවන හුස්ම ලද සැනෙකින් රැගෙන ගියා

පාසල් බිමේ රන් කිරිලියො විලස සරා
සමනල වියේ රස මුසු තැන් සිතෙහි දරා
දරුවන් සැවොම සිර කුටියක සගව තියා
කොවිඩ් අපේ මුලු දිවියම අඳුරු කරා

සතුටෙකි සැවොම පිළිවෙත් නිති රකී නම්
දිවියෙහි රැකුම වේ ඇතින් සිටී නම්
මිතු දම්- සබඳ කම් මදකට දුරින් නම්
රෝබිය නොමැත සැම එක සේ සිතයි නම්

නදීපිකා පෙරේරා
විශේෂ වාර්තා අංශය

ළය සහ ලැම

දිනක වෙහෙසට සමුදෙමින ගත
නිශාචර සිහිනයක රස විද
සිටින මොහොතක ඇමතුමෙන් ලද
සූතිකාගාරයට පිවිසෙමි.........

දරා දරුගැබ විලිරුදා විඳි
ඔබේ බියපත් මුහුණ එකවර
මගේ මතකය රැගෙන ගිය දුර
සරසවියෙ පෙම් වියෝගය තෙක්....

මගෙම දරුවෙකු පැතූ ඔය කුස
සැත්කමට කඩිනමින් ලක්කර
රැගෙන දෝතට සුරගනාවක
ඔබට පිළියම් කරන අතරෙක....

බිළිඳි හඩනා මහ හැඩුම් මැද
ඇයට මවුකිරි දෙන්න අම්මේ...
පවසමින් ඔබ වෙතට ආයේ
සූතිකා ගාරෙන් යන්න පෙර...

සියල්ලන් හඩවමින් එහි සිටි
හඩන බිළිඳිය රැගෙන දෝතට
ඔබේ ලැම මත තබන මොහොතෙයි
දුටුවෙ හසගුන් ඉවත් කළ බව...........

ඔබේ මතකය තුරුලු කරගෙන
පියෙක් වූවද ,මා ඇගේ වී
මවක් වූවද ,ගිලන් කලෙ ඔබ
ළය පැලුණු විරහවද සොදුරිය........

ඩයනා නිරෝෂනී
SYA/A විගණන ශාඛාව

අරුණෝදයේ සුළං රැල්ල

සුළං රැල්ලක් හමාවිත් සයුරින්
කීවේය මෙසේ 'දෙනු මැනවි මීදුම මටත් ඉඩක්'
ඇමතුවේය එය නෞකාපෙළට, කෑගැසීය.
නැවියනි, යන්න දිගටම අරුණ උදා වී ඇත.
කියා විගසින්, නික්මුණි. ඈත ගොඩබිම දෙසට
හඬ නඟමින්, 'පිබිදෙන්න මේ උදෑසනයි'
කීවේය.එය වනයට 'හඬ නඟන්න,
එල්ලන්න ඔබේ පත්‍ර පිරි දජයත්'
පිරිමැදීය නැමුණු වඩුකුරුළු පියාපත,
කීවේය මෙසේ, 'පිබිදී ගයනු මැන සියතුනි'
ගොවිබිම් මතින් ගොස්, 'සැවුලාණනි'
නඟනු මැන ඔබේ සර; අරුණෝදය ළංව ඇත.

කෙදිරීය, එය තිරිඟු බිම් වෙතට,
නමන්න හිස, එළඹෙන දිනය පිළිගන්න'
හඬනැඟීය එය සණ්ටා කුළුණ අතරින්
'පිබිදෙනු මැනවි සණ්ටාවෙනි, දක්වන්න හෝරාව.'
පසු කළේය සොහොන් බිම සුසුමක් ලමින්,
කීවේය,'නවම් කාලය එළඹ නැත, එතෙක් සැතපෙන්න සුවසේ'

The wind at Day-break / H. W. Longfellow

සිංහල පරිවර්තනය
සමන්ති බණ්ඩාර මිය
භාෂා පරිවර්තක (RQC)

මතකය.....

අරුමෙකි ජීවිතය

පොත් ගුලක පිටු වැනිය

හුදකලා මොහොතක

ඒ අතර සැරි සරන විට

මට මා කවුදැයි වටහා ගැන්මට

මං පෙත් විවර කරවූ

මතක පොතෙහි පිටු

එකින් එක පෙරලුවෙමි

විදීම්, විඳවීම්..........

මතකයට ඉඩ දුනිමි.

නිමක් නැත - ඉමක් නැත

විසිරී පැතිරී යන දසත

එනමුදු එයයි ජීවිතය

බැඳීම් - වෙන්වීම් කැටිවුනු

මතුයම් දිනක

නිශ්ක්‍රාන්තියට එලබෙන තුරු ....

නදීපිකා පෙරේරා
විශේෂ වාර්තා අංශය

අලුත් දවසක්

සූරිය උදාවෙයි පෙරඹර එළියකර
ගණඳුර පලා යයි අරුණළු උදාකර
සියොතුන් ගී ගයයි සවනට මිහිරිතර
දිනයක් පැමිණ ඇත නැවතත් සොඳුරුතර

දෙවට දිග පිපි කුසුම් ඔමරි පාමින් හිඳියි
පිණි බිංදු මුතු වගේ තණ පලස මත දිලෙයි
මද සුළං දස අතින් තුරු ලතා පිස හමයි
කුරුළු කූජන මැදින් නව දිනක සිරි මැවෙයි

උදාවන අද දිනේ අරුණැල්ල දැකගන්න
කඩතුරාවෙන් එහා නවෝදය සිපගන්න
නව දිනේ සිත තුටින් ඔබේ වැඩ අරඹන්න
ඔබ එන්න ඉතිං ඔබෙ නව දවස අරගන්න

එම්. කේ. ගිවෝන් යානිකා නන්දසේන
වරලත් පුස්තකාලයාධිපතිනි
ජාතික විගණන කාර්යාලය

මැණිකේ මගේ හිතේ...............

මැණිකේ මගේ හිතේ
දරුවෝ ගමට එතේ
පිංපඩි පෝලිමේදි
කට්ටිය කතා උනා......
ගෑසුත් නැහැලු එහේ
ඉන්ධන ඉවර වෙලා
එළවළු මිල නැගලා
පොඩි උන් හාමතෙදෝ......
කොන්කිරිට් වනන්තරේ
සේරම සල්ලි කොලේ
දරුවෝ දුක් විඳිතේ
ගින්දර තාම තියේ
මැණිකේ මගේ හිතේ

ඩයනා නිරෝෂනී
SYA/A විගණන ශාඛාව

සිතිවිලි



සිත තුල තෙරපෙන දහසක් සිතිවිලි
තෝරා බේරාලා....
ගන්නට හැකි නම් ගන්නට තිබුණා
මට ඕනෑ ඒවා.....
යහළු යෙහෙලියන් සමඟින් ගෙවනා
තත්පරයක් පාසා.....
සිත මන බඳිනා කෙලිලොල් සිතුවිලි
නැග එයි රෑරාලා....
දෙමාපියන් ලඟ තිබෙනා සෙනෙහස
හදවත පුරවාලා....
අන් වෙන කිසි තැන, නැති බව දැනුනා
හොඳහැටි පැහැදීලා....
නෙක නෙක සිතිවිලි කොපමණ ආවත්
එක පිට එක දඟලා ....
බුදු සමිඳුන් ලඟ සිත හරි සංවර
වෙනවා පැහැදිලා....

කේ.කේ.එල්.රසාංගිකා
ක.සේ.නි
පාලන අංශය

ජීවිතය

දකින තුරු හිරු එළිය

හිනැහේවි පිනි බිඳුව

සිපගනී මල් ගොමුව

ආදරෙන් මුසපත්ව

සියවසක් ඉනු කුමට

සසර මග අසරණව

විඳගන්න ජීවිතය

තත්පරෙත් ඇති නේද...

පියුමි නිසංසලා
ක.සේ.නි.
ගිණුම් ශාඛාව

நீ என்னும்.... !

இயற்கையை அதிகமாய் நேசித்து பார்
உன்னிடம் பேசிடும் ஒரு நிமிடமாவது..

மரங்களை முன்னோர்களாக போற்றிடு
தன் சந்ததியை அழித்து
உன் சந்ததியை வாழ வைத்துக் கொண்டிருக்கின்றது..

காற்றை பாரம் தூக்க வைக்காதே
அது உன் மார்புக்குள் இளைபாறும் போது
நுரையீரல் உனக்குதான் வியர்க்கும்..

நீரில் நீ பிறந்த நன்றியை மறவாதே
நிறை குடம் தழும்பினால்
நீ நிற்கும் இடம் அதிர்ந்திடும்..

தீயினால் தீயன தவிர்த்து கொள்
உருக்கி விட்டால் கருகி விடுவாய்
உருக விட்டால் மூழ்கி விடுவாய்..

கடல் உனது இரண்டாம் உலகம்
அதிகமாய் கடன் அதனிடம் வாங்காதே
நீயே அதன் வட்டி ஆகி விடுவாய்..

நிலத்திற்கு வலிக்காமல் முத்தம் கொடு
அதிகம் கடைந்தால் பாலுக்கு பதில் கிடைப்பது இரத்தமே..

உயிரினங்கள் யாவும் உயர்திணையே
உணவு சங்கிலியில் கொஞ்சம் உணர்வையும் சேர்த்துக் கொள்..

மானிடா நீயும் இயற்கையே..
தன் வினை தன்னை சுட்டு விடும்..
இயற்கையை நேசித்துடு..

T.L. Floriya (ACSD Division)

හවය

හමනා සුළඟට

සුසුමක් පිට කර

සුළඟේ හඬ ඇසුවා.....

ගලනා ගඟුලක

දෙපා තෙමාගෙන

සිසිලස මම වින්දා.....

දළු ලා නැලවෙන

මුදු තුරු සෙවනක

මදකට නැවතීලා.....

ඉන්නට සිතුනා

දහසක් සිතුවිලි

අමතක කර දමලා......

පිපෙනා මලකට

සැඩ හිරු ඕනිද

පිණි බිඳු නැති කරනා.....

මේ කෙටි භවයට

කෙලෙසුන් ඇයි තව

සසරම දිගු කරනා.....

කේ. කේ. එල්.රසාංගිකා
ක.සේ.නි
පාලන අංශය

කොහොම හරි දිග නිවාඩුවකට තාත්තෙ මන් ඔන්න ආවා

පුහුණු වැඩමුළු ඔපීසියෙ වැඩ දවස ගානෙම මටත් වැටුනා
පංති පෙරහුරු වාර විභහග පුංචි උන්ටත් නිතර තිබුනා
පෝය සති අග නිවාඩුවටත් වැඩත් එක්කම එහේ උන්නා
උඹව අමතක වෙලා කියලත් මතක නැතුවම දවස් ගෙවුනා

අලුත් අවුරුදු නිවාඩුවකට නත්තලක් එන දවස් බලලා
අරයා කුණු කුණු ගාන හින්දම ගෙවුනෙ එයලාගෙ ගෙදර ඉදලා
උඹට බෙහෙතක් අරන් දෙන්නට එන්න හැදුවත් දමලා ගහලා
බොසා බර බර ගෑවා නිතරම මගෙන් පහු උන වැඩත් ඇදලා

ගෙදර රට උළු වහල වැස්සට අඬලා අඬලාම දිරලා තිබුනා
මිදුලෙ අටපෙති ගහක ඉදහිට මලක් තනියම පිපිලා මැරුනා
බලලා ඇවිදින් යන්න එනකම් ලියපු ලියුමක හුස්ම වැටුනා
මඩමෙ වේවැල් පුටුවෙ ඉදගෙන උඹත් නියපොතු කාලා තිබුනා

පරණ යාලුවො ඔපීසියෙ උන් මටත් කලියෙන් ඇවිත් තිබුනා
බැනර් කටවුට් වලින් මන් ගැන උඹට වැඩියෙන් කැපිලා පෙනුනා
පැටියො මහ ගේ හදලා විකුනමු ගෑනී කිවුවම පපුව පැලුනා
දැනුන හිරිකිත කමට මන් ගැන මටත් නොදැනිම හුගක් ඇඩුනා

කඩපොලෙ කුණු පාට කණු වල ඉලවු කොලවල කොටුවෙලා
නුග ගහෙ උඩ දාපු කොඩියක හුළන් පාරට හෙලවිලා
පහුවෙලා හරි ආපු එක ගැන සතුට වැඩි තැන හිනැහිලා
තාත්තෙ උඹ බලන් ඉන්නැති මල්වඩම් මැද නැවතිලා...

තරිඳු ශ්‍රීනාත්
කාර්‍යාල කාර්ය සහායක
රජයේ විගණන අංශය
ශ්‍රීලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

මුදු සිතැත්තී මං........

සිසිරි,සිරි,සිරි - සිසිරි,සිරි,සිරි
වහින වැස්සට - රෝස මල් පෙති
වලට රිදෙතැයි - අකුණු සෙන හඬ
කුරුළු පැටවුන් - බිහිරි කරතැයි
සිතූ තරමට - මුදු සිතැත්තී මං.............

එවන් මුදු සිත - තැලී පොඩිවී
ගිලන් සයනෙක - දෙනෙත් පෙඟවී
දරාගන්නට - නොහැකි අයුරින්
ගතම පීඩා - උසුල ගන්නී මං.............

කැදැල්ලේ, මිතු දහම් - සෙනෙහස්
මහා ගඟුලක - සිත තෙමෙද්දිත්
ගත දවාලන - වේදනා ගිනි
රෝගී සයනෙක - තනිව විඳවමි මං.............

ඩයනා නිරෝෂනී

SYA/A විගණන ශාඛාව

ප්‍රතිභා

List of Auditors General in Sri Lanka

Accountant and Auditor General

1. Cecil Smith (24 January 1799- September 1799)

Civil Auditor and Accountant General

2. Thomas Frazer (September 1799 – 1802)

Accountant General and Civil Auditor

3. Robert Boyd (29 September 1802 - 1806)

Civil Auditor General

4. Samuel Tolfrey (1 October 1806 – 1809)
5. Richard Plasket (14 June 1809 – 1811)
6. Anthony Bertolacci (30 January 1811 – 1814)
7. John D'Oyly (1 September 1814 – 1816)
8. Edward Tolfrey (March 1816 - 1 December 1817)
9. John William Carrington (1 December 1817 – 1823)
10. Henry Augustus Marshall (1823 – 1841)

Auditor General, Accountant General and Controller of Revenue

11. Henry Wright (1 February 1841 – 1847)
12. Charles Justin MacCarthy (28 May 1847 – 1851)
13. William Charles Gibson (1 October 1851 – 1861)
14. Richard Theodore Pennefather (24 June 1861 – 1866)
15. R. J. Callander (3 January 1866 – 1870)
16. John Douglas (10 March 1870 – 1876)
17. Colville Arthur Durell Barclay (16 June 1876 – 1877)
18. William Henry Ravenscroft (23 May 1877 – 1890)
19. George Thomas Michael O'Brien (18 October 1890 – 1891)
20. James Alexander Swettenham (31 July 1891 – 1895)
21. Sir William Thomas Taylor (10 June 1895 – 1901)
22. Francis Robert Ellis (1 March 1902 – 1907)

Colonial Auditor

23. Bernard Senior (1 March 1907 – 1909)
24. D. S. MacGregor (8 April 1909 – 1914)
25. Wilfred Wentworth Woods   (27 May 1914 – 1922)
26. F. G. Morley   (1 March 1922 – 1931)
27. Oliver Ernest Goonetilleke   (25 June 1931 - 1946)

Auditor General

28. E. Allen Smith (16 February 1946 – 1953)
29. Lionel Arthur Weerasinghe   (2 March 1953 – 1963)
30. D. S. De Silva (14 September 1963 – 1964)
31. B. L. W. Fernando   (21 February 1964 – 1969)
32. D. R. Settinayake   15 August 1969   1971
33. P. M. W. Wijayasuriya (11 October 1971 - 1983)
34. W. Gamini Epa (2 May 1983 – 1993)
35. S. M. Sabry   (26 January 1993 - 2000)
36. Sarath Chandrasiri Mayadunne (13 August 2000 - 2006)
37. P. A. Pematilaka (23 October 2006 - 2007)
38. S. Swarnajothi (3 January 2007 - August 2010)
39. H. A. S. Samaraweera (2010 – 2015)
40. Gamini Wijesinghe   (27 November 2015 - April 2019)
41. W. P. C. Wickramaratne (29 April 2019 - Present)

Best Quotes about Reading

"A reader lives a thousand lives before he dies . . . The man who never reads lives only one." - George R.R. Martin

"Until I feared I would lose it, I never loved to read. One does not love breathing." - Harper Lee

"Never trust anyone who has not brought a book with them." - Lemony Snicket

"You can never get a cup of tea large enough or a book long enough to suit me." - C.S. Lewis

"Reading is essential for those who seek to rise above the ordinary." - Jim Rohn

"I find television very educating. Every time somebody turns on the set, I go into the other room and read a book." - Groucho Marx

"'Classic' – a book which people praise and don't read." - Mark Twain

"You don't have to burn books to destroy a culture. Just get people to stop reading them." - Ray Bradbury

"So please, oh please, we beg, we pray, go throw your TV set away, and in its place you can install a lovely bookshelf on the wall." - Roald Dahl

"Think before you speak. Read before you think." - Fran Lebowitz